අභියෝග හමුවේ නැඟී සිටින ජාතියක්

සංවර්ධන ලොතරැයි මණ්ඩලය
වාර්ෂික වාර්තාව 2020





"අති විශාල සාර්ථකත්වයක් සහිත වර්ෂයක් ඔවට පත්කරමින් ශ්‍රී ලංකාවේ ජනතාවගේ ජීවිත කෙරෙහි තිරසාර බලපෑමක් නිර්මාණය කර ඇති අපි උසස් අධ්‍යාපන අවස්ථාවන් උදා කරමින් සියලුම ශ්‍රී ලාංකිකයින්ගේ ජීවිත උසස් කරලීමට දායක වුනෙමු.

සාර්ථකත්වය කරා පිය නගමින් අපගේ නව පාරිභෝගිකයින්ගේ අපේක්ෂාවන් සහ ප්‍රාර්ථනාවන් සපුරාලීමටත් නව්‍යකරණ තොරතුරු නාක්ෂණය පදනම් අවස්ථාවන් හඳුන්වා දීමටත් අපි බැඳී සිටිමු"

පටුන

ආයතනික තොරතුරු	04
අපගේ දැක්ම සහ මෙහෙවර	05
අපගේ ඉතිහාසය සැකෙවින්	06
වැදගත් සංධිස්ථාන	08
ප්‍රධාන මූල්‍ය තොරතුරු	10
සභාපතිතුමාගේ පණිවුඩය සහ ප්‍රගති වාර්තාව 2020	12
අධ්‍යක්ෂ මණ්ඩලයේ සමාලෝචනය	14
අධ්‍යක්ෂ මණ්ඩලය - 2020	15
වර්තමාන අධ්‍යක්ෂ මණ්ඩලය	15
කළමනාකරණ කණ්ඩායම	16
කණිෂ්ඨ කළමනාකරුවන්	17
මෙහෙයුම් සමාලෝචනය	18
අපගේ නිෂ්පාදන කළඹ පිළිබඳ දළ විශ්ලේෂණය	20
තිරසාරභාවය පිළිබඳ වාර්තාව	26
2020.12.31 දිනට සේවක සංඛ්‍යා තත්වය	31
ආයතනික පාලනය	32
අවදානම් කළමනාකරණ වාර්තාව	34
විගණන සහ කළමනාකරණ කමිටු වාර්තාව	35

මූල්‍ය වාර්තා

ස්වාධීන විගණකවරුන්ගේ වාර්තාව	38
විගණන වාර්තාව 2020 සහ කළමනාකාරීත්වය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග	50
විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය	62
මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය	63
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය	64
ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය	65
ගිණුම්කරණ ප්‍රතිපත්ති	66
අංශමය වාර්තාව	70
අවසන් ගිණුම් සඳහා සටහන්	72
දස වසරක සාරාංශය	84

ආයතනික තොරතුරු

ආයතනයේ නම
සංවර්ධන ලොතරැයි මණ්ඩලය

නෛතික ස්වරූපය
මෙම මණ්ඩලය 1997 අංක 20 දරණ සංවර්ධන ලොතරැයි මණ්ඩල පනත යටතේ සංස්ථාගත කර ඇත.

ආරම්භක දිනය
1983 ජනවාරි 19

කාර්යාලයේ ලියාපදිංචි ලිපිනය
අංක 356, ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා මාවත, යුනියන් පෙදෙස, කොළඹ 2.

දුරකථන අංක
0112 333 546-8, 0114 824 824

ෆැක්ස්
0112 333 545

විද්‍යුත් තැපෑල
info@dlb.lk

වෙබ් අඩවිය
www.dlb.lk

බදු හඳුනා ගැනීමේ අංකය
409089844

වර්තමාන අධ්‍යක්ෂ මණ්ඩලය
වී.පී.කේ. අනුෂ පැල්පිට මහතා - සභාපති / ප්‍රධාන විධායක නිලධාරී
ජේ. එම්. භද්‍රානි ජයවර්ධන මහත්මිය - අධ්‍යක්ෂ
රවීන්ද්‍ර ජේ. විමලවීර මහතා - අධ්‍යක්ෂ
ජෙනට් ජයවර්ධන මහත්මිය - නීතිඥ - අධ්‍යක්ෂ
කේ.ඒ.එච්.සී. පුබුදුසිරි මෙනවිය - අධ්‍යක්ෂ

විගණක
විගණකාධිපති

බැංකුකරුවන්
මහජන බැංකුව, ලංකා බැංකුව, සම්පත් බැංකුව
හැටන් නැෂනල් බැංකුව

දැක්ම

"ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම වාසනාව උදා කිරීමේ රාජ්‍ය ආයතනයක් බවට පත්වීම"

මෙහෙවර

"නවීන තාක්ෂණය යොදා ගනිමින්, නව්‍යතාවයෙන් යුතු ආකර්ශනීය ලොතරැයිපත් ඉදිරිපත් කරමින් විශ්වාසය තහවුරු කරන අතරතුර සෑම කල්හිම පාර්ශවකරුවන්ගේ අපේක්ෂාවන් සපුරාලීම."

ඉලක්ක

- වෙළඳපොළ කොටස වැඩි කර ගැනීම
- ජනාධිපති අරමුදලට ලබා දෙනු ලබන දායකත්වය උපරිම කිරීම
- නවීන තාක්ෂණය අත්කර ගැනීම සහ ඵලදායී ලෙස උපයෝගී කර ගැනීම
- පාර්ශවකරුවන්ගේ අපේක්ෂාවන් ඉටු කිරීම

අපගේ මූලික සාරධර්ම

සුපිලිපන්බව

අප විසින් ඉදිරිපත් කරන ලොතරැයි හා අප ව්‍යාපාරික කටයුතුවල නිරත වන ආකාරය සාධාරණ, අවංක සහ විශ්වාසනීය වේ.

සුභවාදී ආකල්පය

ලොතරැයි ව්‍යාපාරය පවත්වාගෙන යාමේදී ඔවුන් හට මුහුණපෑමට සිදුවන සෑම අභියෝගයකටම සුභවාදී ඵලඹුමක් සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ සේවකයින් තුළ පවතී.

ප්‍රතිඵලදායක බව

ස්වකීය කාර්යභාරයන් පිළිබඳව සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ සේවකයින් තුළ මනා විශ්වාසයක් පවතින අතර ඔවුහු දෙන ලද ඉලක්ක කාර්යක්ෂමව අත්පත් කර ගැනීම සඳහා නිසි අවධානයකින් යුතුව කටයුතු කරති.

නව්‍යතාවය

සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ සේවකයින් ව්‍යාපාරික සංවර්ධනය සඳහා වන අදහස් සොයා යමින් තරගකාරී වෙළඳපොළ වෙනස්වීම් හමුවේ කඩිනමින් ප්‍රතිචාර දක්වති.

කණ්ඩායම් හැඟීම

සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ සේවකයින් විවෘතභාවය, විකිනෙකා කෙරෙහි ගෞරවය සහ පුද්ගල සංවර්ධනය ඔස්සේ ආයතනික ඉලක්ක සපුරාගැනීමෙහි ලා විකාවන්ව කටයුතු කරති.

විශිෂ්ඨත්වය කරා නැඹුරුවීම

සංවර්ධන ලොතරැයි මණ්ඩල සේවකයන් අඛණ්ඩවම සිය සේවා තත්වයන් උපරිම මට්ටම් කරා රැගෙන යීම සඳහා කැපවීමෙන් ක්‍රියා කරති.

අපගේ ඉතිහාසය සැකෙවින්

1983 වර්ෂයේ දී ස්වකීය මෙහෙයුම් ආරම්භ කරන විට සංවර්ධන ලොතරැයි මණ්ඩලය මුලින් ම සංවර්ධන ලොතරැයි මධ්‍යස්ථානය ලෙස හඳුන්වන ලදී. අධ්‍යාපන සංවර්ධනය සඳහා අරමුදල් සපයා දීම, ජනාධිපති අරමුදල සමග මණ්ඩලයෙහි ඓතිහාසිකව පවතින සමීප සම්බන්ධතාවයෙහි ප්‍රතිඵලයක් ලෙස වෛද්‍ය ආධාර සපයා දීම සඳහා අරමුදල් සපයා දීම සහ මහපොල උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල සඳහා අරමුදල් සැපයීම මණ්ඩලයෙහි ප්‍රධාන අරමුණු වේ.

විවිධ දේශීය මූල්‍ය හා සමාජ සංවර්ධන වැඩසටහන් රැසක් සඳහා අරමුදල් යෙදවීම පිණිස අඛණ්ඩ ආදායම් උත්පාදන යෝජනා ක්‍රමයක් ස්ථාපනය කිරීමට අපේක්ෂා කළ ආචාර්ය වික්‍රම වීරසූරිය මහතා, 'ක්ෂණික ලොතරැයි යෝජනා ක්‍රමය' හඳුන්වා දීම සඳහා පෞද්ගලික හා රාජ්‍ය ආයතන ගණනාවක සහාය ඉල්ලා සිටියේය.

ඒ අනුව, සංවර්ධන ලොතරැයි මධ්‍යස්ථානය ආරම්භ කිරීම සඳහා එවකට ජනාධිපති ජේ.ආර්. ජයවර්ධන මහතා විසින් රුපියල් මිලියන 2.2 ක මුදලක් වෙන් කර දීම සහ අමාත්‍ය ලලිත් අතුලත්මුදලි මහතා විසින් ඒ හා සමාන මුදලක් මහපොල උසස් අධ්‍යාපන භාරකාර අරමුදලෙන් ආයෝජනය කිරීම එම ඉල්ලීමට ලැබුණු සතුටුදායක ප්‍රතිචාර දෙක විය.

අරමුදලෙහි ශක්තිමත් දැක්මට අනුව, අලෙවි කරන ලද මුල් ම ලොතරැයි 'සංවර්ධන ලොතරැයි' යනුවෙන් නම් කරන ලද අතර, පසුව ජනාධිපති අරමුදලෙහි සහ මහපොල ශිෂ්‍යත්ව අරමුදලෙහි මූලික අරමුදල් සැපයීම මත 1983 ජනවාරි 19 වැනි දින සංවර්ධන ලොතරැයි මධ්‍යස්ථානය ස්ථාපනය කරන ලදී.

සංවර්ධන ලොතරැයි මධ්‍යස්ථානය වැදගත් ජයග්‍රහණ අත්කර ගනිමින් ස්වකීය මෙහෙයුම් ආරම්භ කර පළමු වසර තුළදී සාර්ථකව ආදායම් උපයා ගත්තේය. මෙහි ලාභයෙන් වැඩි ප්‍රමාණයක් මධ්‍යස්ථානය ආරම්භ කිරීමේ කොටස්කරුවන් වන ජනාධිපති අරමුදල සහ මහපොල උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල වෙත ලබා දෙන ලදී. අද දක්වා ම, සංවර්ධන ලොතරැයි මණ්ඩලයෙහි ආදායම රට තුළ ධනය උත්පාදනය කිරීමේ මූලික අභිප්‍රායය උදෙසා ජනාධිපති අරමුදලට බැර කර ඇත.

ජනාධිපති අරමුදල විසින් ඉහත සඳහන් කරන ලද ලාභයෙන් 50% ක් රටෙහි උසස් අධ්‍යාපනය සඳහා වැදගත් සහායයක් සපයා දෙන මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල සඳහා වෙන් කරනු ලබයි. 1993 වර්ෂයේදී සංවර්ධන ලොතරැයි මධ්‍යස්ථානය 'සංවර්ධන ලොතරැයි භාරය' නමින් හැඳින්වූ භාරයක් බවට පරිවර්තනය කරන ලදි. ඉන් අනතුරුව 1997 අගෝස්තු 12 වැනි දින සංවර්ධන ලොතරැයි මණ්ඩල පනත ක්‍රියාත්මක වීමත් සමග සංවර්ධන ලොතරැයි භාරය 'සංවර්ධන ලොතරැයි මණ්ඩලය' ලෙස යළි ස්ථාපනය කරන ලදී.

'සංවර්ධන ලොතරැයිය' නමින් හැඳින්වූ පළමු 'ක්ෂණික/සූරන' ලොතරැයි පත් චිකක් රු.10/- බැගින් වූ මුදලකට දිවයින පුරා විසිරී ඇති අලෙවිකරු ජාලය හරහා අලෙවි කරන ලද අතර, පැය 24 ක් ඇතුළත ජැක්පොට් ජයග්‍රාහකයින් දෙදෙනෙකු බිහි කළ එම ලොතරැයිය ය මෙම ව්‍යාපාරයෙහි දීර්ඝ කාලීන ජනප්‍රියතාවය ශක්තිමත් කිරීමට මග පෑදුවේය.

1987 වර්ෂයේ දී සංවර්ධන ලොතරැයි මධ්‍යස්ථානය විසින් 'ශනිදා වාසනාව' නමින් ප්‍රථම වරට රූපවාහිනිය ඔස්සේ දිනුම් අදින ලොතරැයියක් හඳුන්වා දෙන ලද අතර, මුලදී සෙනසුරාදා දිනවල දිනුම් අදින ලද එම ලොතරැයිය මේ වන විට සතියේ දින හතෙහි දී ම දිනුම් අදිනු ලැබේ. ක්ෂණික සූරන ලොතරැයි වලින් ජයග්‍රහණ හිමි නොවූ ටිකට්පත් සඳහා ම විශේෂයෙන් සකස් කර 1998 ජනවාරි 25 වැනි දින ආරම්භ කරන ලද 'වාසනා චක්‍රය' වැඩසටහන ඉරිදා දිනවල රූපවාහිනිය ඔස්සේ විකාශය කරන ලදී.

එම වැඩසටහන් සඳහා ඉතා ඉහළ ප්‍රතිචාරයක් ලැබීම නිසා සංවර්ධන ලොතරැයි මණ්ඩලය 1998 වර්ෂයේ දී 'සංවර්ධන වාසනාව' නමින් රූපවාහිනිය ඔස්සේ දිනුම් අදින දෙවන ලොතරැයිය හඳුන්වා දෙන ලද අතර එය අඟහරුවාදා සහ සිකුරාදා දිනවල විකාශය කරන ලදී. එහි අනන්‍ය අලෙවි ප්‍රස්තුතය සැලකිල්ලට ගනිමින් 2015 වර්ෂයේ දී ලග්න සංකේත 12 සහිත සුවිශේෂී අංගය සමගින් එය ලග්න වාසනා නමින් නැවත නම් කරන ලද අතර, මේ වන විට එය සතියේ දින හතෙහි ම දිනුම් අදිනු ලැබේ.

නියමිත සුපිරි ජයමල්ල ත්‍යාග සහ සාමාන්‍ය මුදල් ත්‍යාග ලොතරැයි වලට අමතරව, සංවර්ධන ලොතරැයි මණ්ඩලය 2004 ජනවාරි 26 වැනි දින 'ජයෝදා' නමින් දිනුම් ඇදීමක් දියත් කළ අතර එය සඳුදා සහ බ්‍රහස්පතින්දා දිනවල රූපවාහිනිය ඔස්සේ විකාශය විය. එහි සුපිරි ජයමල්ල රුපියල් මිලියන 10 ක ආරම්භක මුදලකින් ආරම්භ විය. ශ්‍රී ලංකා ලොතරැයි ඉතිහාසයේ සුවිශේෂී පියවරක් තබමින් සංවර්ධන ලොතරැයි මණ්ඩලය ජයෝදා සුපිරි ජයමල්ල ජයග්‍රාහකයින්ට රුපියල් මිලියනයක මුදල් ත්‍යාගය හෝ රුපියල් මිලියනයකට අධික වටිනාකමකින් යුත් නිවසක් තෝරා ගැනීමට අවස්ථා හිමි කර දුන්නේය.

සංවර්ධන ලොතරැයි මණ්ඩලය 2009 අප්‍රේල් 10 වැනි දින 'ජන ජය' ලොතරැයිය එළිදැක්වූ අතර එය බ්‍රහස්පතින්දා සහ ඉරිදා දිනවල විකාශය කරන ලදී. වාසනාවන්තයින් සුපිරි ත්‍යාගය දිනා ගැනීම සඳහා අංක 64 ක් අතරින් තෝරා ගනු ලබන ජයග්‍රාහී අංක 4 සමග තවත් යන්ත්‍රයකින් අංක 12 ක් අතරින් තෝරා ගනු ලබන සුපිරි අංකය ගැළපිය යුතුය. මෙහි සුපිරි ත්‍යාගය රුපියල් මිලියන 2.5 ක මුදලකින් ආරම්භ විය.

2012 ජූලි 11 වැනි දින 'සුපර් බෝල්' ලොතරැයිය හඳුන්වා දීම මෙරට ලොතරැයි ඉතිහාසයේ පෙරලිකාර සන්ධිස්ථානයක් සනිටුහන් කළේය. රුපියල් කෝටි 03 ක ත්‍යාග මුදලකින්

ආරම්භ වූ මෙම සුවිශේෂී ලොතරැයිය මෙරට විශාලතම සුපිරි ත්‍යාග මුදල පිරිනමන ලොතරැයිය වූ අතර, එය මෙරට ජනතාව අතරින් විශාල ගනුදෙනුකරුවන් සංඛ්‍යාවක් ආකර්ෂණය කර ගැනීමට සමත් විය.

2016 වර්ෂයේ දී සංවර්ධන ලොතරැයි මණ්ඩලය විවිධ නව ලොතරැයි ගණනාවක් හඳුන්වා දුන්නේය.

සංවර්ධන ලොතරැයි මණ්ඩලය 2016 මැයි 14 වැනි දින 'සංවර්ධන ලක්ෂපති' ලොතරැයිය දියත් කළ අතර එය මිලියන 5.6 ක සුවිශේෂී අලෙවියක් වාර්තා කළේය. එමෙන්ම, රුපියල් මිලියන 75 ක සුපිරි ජයමල්ලක් සමඟින් 2016 අප්‍රේල් 8 වැනි දින දියත් කරන ලද 'කෝටිපති ශනිදා' ලොතරැයියෙහි ආරම්භක විකුණුම් වටයේ දී ම ලොතරැයි පත් මිලියන 4.4 ක් අලෙවි විය.

නව බලාපොරොත්තුවක් ඇතිකරවමින්, නව ආකර්ෂණයක් සහිතව මුදල් ත්‍යාග තුනක් සමඟින් හඳුන්වා දෙන ලද 'සංවර්ධන වාසනාව' රූපවාහිනී ලොතරැයි දිනුම් ඇදීම 2016 දෙසැම්බර් 12 වැනි දින නැවත දියත් කරන ලදී. එයට අමතරව, ශ්‍රී ලාංකීය ලොතරැයි ඉතිහාසයේ සතියේ දින හතෙහි දී ම දිනුම් අදිනු ලබන පළමු ලොතරැයිය ලෙස 2017 අගෝස්තු 31 වැනි දින 'අද කෝටිපති' ලොතරැයිය ද හඳුන්වා දෙන ලදී.

තවද, ලොතරැයි වෙළඳපොළ නගාසිටුවීම සඳහා තවත් පියවරක් තබමින් 2020 වර්ෂයේ දී සංවර්ධන ලොතරැයි මණ්ඩලය පාරිභෝගිකයින්ට තම ස්මාර්ට් ජංගම දුරකථනය හරහා ලොතරැයි පතක් මිලදී ගැනීමේ පහසුව සැලකිල්ලට ගෙන "DLB Sweep App" යෙදුම හඳුන්වා දුන් අතර, ඒ සමගම ශ්‍රී ලාංකීය ලොතරැයි වෙළඳපොළෙහි පළමු ඩිජිටල් ලොතරැයිය ලෙස "සසිරි" ඩිජිටල් ලොතරැයිය ප්‍රථම වරට දියත් කළේය.

සංවර්ධන ලොතරැයි මණ්ඩලය පිහිටුවන ලද්දේ ජනාධිපති අරමුදල සහ මහපොල උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල සඳහා අරමුදල් රැස් කිරීම පිණිස ය. එබැවින් සංවර්ධන ලොතරැයි මණ්ඩලයෙහි සියලු ලාභ ජනාධිපති අරමුදල වෙත බැර කරනු ලැබේ. ඒ අනුව, මණ්ඩලයේ ඉතිහාසය පුරාවට මණ්ඩලය ජනතාව වෙනුවෙන් වූ පොරොන්දුව ඉටුකරමින් පසුගිය වසර 37 ක කාලය තුළදී ජනාධිපති අරමුදලට ලබා දෙන දායකත්වය ලෙස එම අරමුදලට රුපියල් බිලියන තිහකට (30) අධික මුදලක් ප්‍රේෂණය කර ඇත.

වැදගත් සන්ධිස්ථාන

1983

ශ්‍රී ලංකාවේ ප්‍රථම වරට ක්ෂණික දිනුම් ලොතරැයියක් හඳුන්වා දෙන ලදී

1987

මෙරට ප්‍රථම වතාවට රූපවාහිනිය ඔස්සේ දිනුම් අදින ලද 'ශනිදා වාසනාව' ලොතරැයිය හඳුන්වා දීම

1993

'සංවර්ධන ලොතරැයි මධ්‍යස්ථානය' 'සංවර්ධන ලොතරැයි භාරය' බවට පරිවර්තනය වීම

1997

'සංවර්ධන ලොතරැයි භාරය' 1997 අංක 20 දරණ සංවර්ධන ලොතරැයි මණ්ඩල පනත යටතේ රජයට හිමි සංස්ථාපිත ආයතනයක් ලෙස 'සංවර්ධන ලොතරැයි මණ්ඩලය' නමින් නැවත ස්ථාපිත කිරීම.

- රුපියල් බිලියන 2 ක සමස්ත පිරිවැටුම් මට්ටමක් ළඟා කරගන්නා ලදී.

1998

ජයග්‍රහණ හිමි නොවූ ක්ෂණික/සූරන ලොතරැයි පත් සඳහා 'වාසනා චක්‍රය' රූපවාහිනී දිනුම් ඇදීම නැවත ආරම්භ කිරීම

- ප්‍රථම ත්‍යාගය ලෙස සුපිරි සුඛෝපභෝගී මෝටර් රථයක් පිරිනමමින් රු. 100 ක මුදලකට අලෙවි කරන 'වින්ඩෝස්' සහ 'යුරේකා' ක්ෂණික ලොතරැයි සමග 'සංවර්ධන වාසනා ලොතරැයිය' හඳුන්වා දෙන ලදී.

1999

වර්ෂ 2000 දී එල්ල වන තාක්ෂණික අභියෝගයන්ට මුහුණ දීම පිණිස ලෝක බැංකුවේ සහාය ඇතිව පරිගණක පද්ධතිය යාවත්කාලීන කරන ලදී.

2004

සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් හඳුන්වා දෙන ලද පුරෝගාමී අංගයක් වන මුදල් ත්‍යාගයක් හෝ නිවසක් යන විකල්ප සහිතව 'ජයෝදා' ලොතරැයිය දියත් කරන ලදී.

- රුපියල් බිලියන 3 ක සමස්ත පිරිවැටුමක් අත් කරගන්නා ලදී.

2008

අංක 356, ආචාර්ය කොල්වින් ආර් ද සිල්වා මාවත, කොළඹ 02 යන ලිපිනයෙහි පිහිටි සංවර්ධන ලොතරැයි මණ්ඩලයට ම අයත් ගොඩනැගිල්ල වෙත මණ්ඩලය රැගෙන යන ලදී.

- රුපියල් බිලියන 5 ක සමස්ත පිරිවැටුමක් වාර්තා කරගන්නා ලදී.

2010

සුපිරි ජයමල්ලක් සමග 'ජන ජය' ලොතරැයිය හඳුන්වා දීම

2011

'නියත ජය' ලොතරැයිය ආරම්භ කිරීම

2012

රුපියල් මිලියන 30 ක සුපිරි ජයමල්ල සමග 'සුපර් බෝල්' ලොතරැයිය' හඳුන්වා දීම

2013

ඉහළම වටිනාකම සහිත සුපිරි ජයමල්ල පිරිනමන 'හයිවේ ඩ්‍රීම්' ලොතරැයිය හඳුන්වා දීම

2014

කෙටි පණිවුඩ සේවාව ඔස්සේ ලොතරැයි අලෙවි කිරීමේ ක්‍රමය දියත් කරන ලදි

2016

'සංවර්ධන ලක්ෂපති', 'කෝටිපති ශනිදා' සහ 'සංවර්ධන වාසනව' යන ලොතරැයි ආරම්භ කිරීම

2017

'අද කෝටිපති' ලොතරැයිය හඳුන්වා දීම

2018

IVR සහ කෙටි පණිවුඩ සේවාව ඔස්සේ ප්‍රතිඵල පිළිබඳ දැනුම්දීමේ ක්‍රමවේදය දියත් කරන ලදි

2019

'DLB Sweep App' යෙදවුම දියත් කිරීම

2020

'සසිරි' ඊ - ලොතරැයිය හඳුන්වා දීම

ප්‍රධාන මූල්‍ය තොරතුරු

ආදායම (රු.)



බදු පෙර ලාභය



ජනාධිපති අරමුදලට දායකත්වය (රු.)



ආදායම් බදු



රජය වෙත ලබා දුන් මුළු ප්‍රේෂණ



මුළු වත්කම්



මෙහෙයුම් ප්‍රතිඵල	2020	2019
ආදායම	15,033,029,360	17,065,414,012
දළ ලාභය	6,369,222,716	7,117,747,971
බදු පෙර ලාභය	2,993,501,638	2,897,130,924
ආදායම් බදු	10,921,555	235,073,385
ශුද්ධ ලාභය	3,018,654,911	2,668,792,667
ජනාධිපති අරමුදලට ලබා දුන් දායකත්වය	2,982,580,083	2,668,792,667

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

වත්කම්		
දේපළ, පිරියත සහ උපකරණ	1,236,649,449	1,245,588,144
සේවක ප්‍රතිලාභ වත්කම්	-	7,038,067
ස්ථාවර තැන්පතු	1,338,731,761	1,451,307,572
තොග	32,590,632	51,026,204
වෙළඳ ණය ගැතියෝ සහ ලැබිය යුතු වෙනත්	92,541,218	126,012,880
පෙර ගෙවීම් සහ තැන්පතු	8,197,378	5,212,271
අත ඇති සහ බැංකුවේ ඇති මුදල්	541,662,763	795,666,048
මුළු වත්කම්	**3,250,373,201**	**3,681,851,186**

වගකීම්		
සේවක ප්‍රතිලාභ වගකීම්	3,636,437	-
අලෙවි නියෝජිතයින්ට සහ බෙදාහරින්නන්ට ගෙවිය යුතු තැන්පතු	36,390,381	36,110,381
ගෙවිය යුතු ණය වවුචර්	115,286,040	160,547,860
වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු	516,032,675	563,493,496
ජනාධිපති අරමුදලට ගෙවිය යුතු	685,860,083	477,792,667
ගෙවිය යුතු තෑගි	578,618,857	760,794,203

ස්කන්ධය		
ජනාධිපති අරමුදල	2,200,000	2,200,000
මහපොල භාර අරමුදල	2,200,000	2,200,000
තෑගි සංචිත ගිණුම	698,558,607	1,103,197,285
ප්‍රත්‍යාගණන අතිරික්තය	614,729,237	575,515,293
සේවක ප්‍රතිලාභ සැලැස්ම නැවත මිනුම් කිරීමේ ලාභය/(පාඩුව)	(3,139,116)	-
මුළු ස්කන්ධය සහ වගකීම්	**3,250,373,201**	**3,681,851,186**

ලාභදායිතා අනුපාත		
ශුද්ධ ලාභ අනුපාතය	20%	17%
දළ ලාභ අනුපාතය	42%	42%
ද්‍රවශීලතා අනුපාත		
පංගම වත්කම් අනුපාතය	1 : 1.66	1 : 1.64
ක්ෂණික (ද්‍රවශීල) වත්කම් අනුපාතය	1 : 1.64	1 : 1.60

සභාපතිතුමාගේ පණිවුඩය සහ 2020 ප්‍රගති වාර්තාව

අභියෝගාත්මක කාලයන් තුළ වුවද, සංවර්ධන ලොතරැයි මණ්ඩලය සෑම විටම පහසුව සහ කාර්යක්ෂමතාවය සහතික කරමින් පාරිභෝගිකයින්ගේ මනාපය කෙරෙහි ප්‍රමුඛත්වය ලබා දුන්නේය. ගතවූ මාස 12 ක කාලය මාරාන්තික වෛරසයකට එරෙහි පරීක්ෂණයක් විය; එහෙත් සංවර්ධන ලොතරැයි මණ්ඩලයෙහි සෑම අංශයකටම පිටුබලය ලබා දෙන ශක්තිමත් සහ ගතික සහාය පද්ධතිය නිසා අපිට අපගේ ඉලක්ක ආසන්නයට ළඟාවීමට හැකි වී තිබේ.

සංවර්ධන ලොතරැයි මණ්ඩලය රජය විසින් නියාමනය කරනු ලබන ලොතරැයි නිෂ්පාදන ශ්‍රී ලාංකික ජනතාවට අලෙවි කරන අතර, ලොතරැයි පතක් මිලදී ගැනීම මඟින් අදහස් කෙරෙන්නේ ඔවුන් ද අපගේ සමාජයේ දියුණුවට දායක වන බවයි. සංවර්ධන ලොතරැයි මණ්ඩලය කොටස් හිමියන්ගේ අපේක්ෂාවන් සහ පාරිභෝගිකයින්ගේ ඉල්ලීම් සමබර කරමින්, හේතු සහගත වෙනස්වීම් කිහිපයක් තිබුණ ද, සිය පොරොන්දු ඉටු කිරීමට සමත් වී තිබේ.

2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වන වාර්ෂික වාර්තාව සහ මූල්‍ය ප්‍රකාශන මම මෙයින් ඉදිරිපත් කරමි. අභියෝගාත්මක වාතාවරණයක් තිබුණ ද, ජනාධිපති අරමුදලට රුපියල් මිලියන 2,982 ක දායකත්වයක් ලබා දෙමින් 2020 වර්ෂය තුළදී රුපියල් මිලියන 15,400 ක පිරිවැටුමක් අත්කර ගැනීමට මණ්ඩලයට හැකිවූ අතර, එය පෙර වර්ෂය හා සැසඳීමේදී 87% ක සාධනයක් ළඟාකර ගැනීමක් බව මණ්ඩලය සතුටින් වාර්තා කර සිටියි.

	2019	2020	සාධනය
ආදායම. (රු. මි.)	17,799	15,400	87%
ජනාධිපති අරමුදලට ලබා දුන් දායකත්වය (රු. මි.)	2,669	2,982	112%
ජයග්‍රාහකයින්ට ලබා දුන් ත්‍යාග මුදල් (රු. මි.)	8,903	7,702	87%

වර්තමාන මූල්‍ය සමාලෝචනය -2020

කොවිඩ්-19 වසංගතය සංවර්ධන ලොතරැයි මණ්ඩලයෙහි මෙහෙයුම්වලට පුරෝකථනය කළ නොහැකි තරමේ අවිනිශ්චිතතාවයක් ඇති කර තිබේ. අයවැයගත විකුණුම් ආදායම රුපියල් මිලියන 17,001 ක් වුව ද, තථ්‍ය ආදායම රුපියල් මිලියන 15,400 ක් විය. එම වෙනස, පවතින කොවිඩ්-19 වසංගතය හේතුවෙන් ඇතිවූවක් විය. අනෙක් අතට, ජනාධිපති අරමුදලට ලබා දුන් සැබෑ දායකත්වය රුපියල් මිලියන 2,982 ක් වූ අතර, බදු නීතිය වෙනස් වීම, වැට් බදු අඩු කිරීම සහ ජාතිය ගොඩනැඟීමේ බදු අයකිරීම් අහෝසි කිරීම හේතුවෙන් රජයට ලබා දුන් සැබෑ බදු දායකත්වය රුපියල් මිලියන 378 ක් විය. 2019 වර්ෂයට සාපේක්ෂව (රුපියල් මිලියන 1,220) 2020 වර්ෂයේ දී ලබා දුන් බදු දායකත්වයේ තියුණු පහත වැටීමක් දක්නට ඇත.

අපගේ ජයග්‍රහණ

කොවිඩ්-19 තත්ත්වය මධ්‍යයෙහි වුව ද, විකුණුම් අයවැය සාධනය 91% ක් විය. ජනාධිපති අරමුදල සඳහා ලබා දෙන ලද දායකත්වය අයවැයගත ප්‍රමාණයට වඩා 110% ක් වූ අතර, පසුගිය වසරේ අලෙවි සාධනය 87% ක් විය. පවතින කොවිඩ් තත්ත්වය මධ්‍යයෙහි වුව ද, ජනාධිපති අරමුදල සඳහා ලබා දුන් දායකත්වය පෙර වර්ෂයට සාපේක්ෂව 112% ක් විය.

නව සංධිස්ථාන

අප වටා ඇති පුළුල් සමාජය කෙරෙහි අපට වගකීමක් තිබේ. ගෙවන ලද ත්‍යාග මුදල් ප්‍රමාණය රුපියල් බිලියන 7.7 ක් විය. ජනාධිපති අරමුදල සඳහා ලබා දෙන ලද වැඩිම දායක මුදල (රුපියල් බිලියන 2.9) ලබා දෙන ලද්දේ 2020 වර්ෂයේදී ය.

අපගේ කණ්ඩායම

සංවර්ධන ලොතරැයි මණ්ඩලයෙහි ක්‍රියාශීලී සහ ප්‍රබල කණ්ඩායම අපගේ සාර්ථකත්වයෙහි මූලික ම කොටසක් වේ. අපගේ අලෙවිකරණ, මූල්‍ය, තොරතුරු තාක්ෂණ, ප්‍රසම්පාදන, විකුණුම්, පරිපාලන සහ අභ්‍යන්තර විගණන යන අංශවල කණ්ඩායම් එහි ඉදිරියෙන් ම සිටිති. ඔවුන්ගේ නව්‍ය වූ අදහස් අපගේ නිෂ්පාදන ඉදිරියට ගෙන යමින් සහ ලොතරැයි අත්දැකීම්වලට නව මානයන් ගෙන එමින් මණ්ඩලය ඉහළ තලයකට ඔසවා තබා ඇත.

නව තාක්ෂණය

DLB Sweep App

පැය 24 පුරා ම ක්‍රියාත්මක Interactive Voice Response ප්‍රතිචාර දැක්වීමේ පද්ධතිය හරහා යෙදවුමක් හඳුන්වා දීම මඟින් අපි තවත් ජයග්‍රහණයක් අත් කර ගත්තෙමු. DLB Sweep App යෙදවුම මඟින් පරිශීලකයින්ට ස්මාර්ට් ජංගම දුරකථන හරහා තමන්ගේ ජයග්‍රහණ පරීක්ෂා කර බැලීමට අවස්ථාව උදා කර දෙන ලදී. ජංගම දුරකතනය මඟින් ලොතරැයි පතෙහි ඇති QR කේතය පරිලෝකනය (ස්කෑන්) කිරීමෙන් පාරිභෝගිකයින්ට තමන්ගේ ජයග්‍රහණ සහ අදාළ ත්‍යාග මුදල් පිළිබඳ තහවුරු කර ගැනීමට ද එයින් අවස්ථාව සලසා දෙයි.

සසිරි ඩිජිටල් ලොතරැයිය

2020 සැප්තැම්බර් මස 29 වැනි දින මුදල් අමාත්‍යාංශයේ ලේකම් එස්.ආර්. ආටිගල මහතාගේ ප්‍රධානත්වයෙන් දකුණු ආසියාවේ ප්‍රථම ඩිජිටල් ලොතරැයිය දියත් කිරීමත් සමග සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් සුවිශේෂී සන්ධිස්ථානයකට පැමිණීම සනිටුහන් කළේය. සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් හඳුන්වා දී ඇති ඩී.එල්.බී. ස්වීප් ඇප් (DLB Sweep App) නැමති ජංගම දුරකථන යෙදුම හරහා සාමාන්‍ය ජනතාවට "සසිරි" යන වෙළඳ නාමය යටතේ එම ලොතරැයිය මිලදී ගැනීමට දැන් පහසුකම් සලසා ඇති අතර එම ජංගම යෙදුම හරහා ම ලග්න වාසනා,

සුපර් බෝල් සහ ශනිදා යන ලොතරැයි ද දැන් මිලදී ගත හැක. සසිරි ලොතරැයියෙහි මුද්‍රිත පිටපතක් ද දිවයින පුරා පිහිටි ලොතරැයි අලෙවි කුට්ටලින් ලබා ගත හැක.

කෙටි පණිවුඩ සේවා (SMS) ලොතරැයිය

සිය ඩිජිටල්කරණ වැඩසටහන හරහා සංවර්ධන ලොතරැයි මණ්ඩලය 2020 දෙසැම්බර් මස 15 වැනි දින කෙටි පණිවුඩයක් හරහා හෝ USSD කේතයක් ඇමතීම මගින් ඕනෑම ජංගම දුරකථනයක් හරහා ලොතරැයි පත් මිලදී ගැනීමේ පහසුකම දියත් කිරීමත් සමග මණ්ඩලය තවත් සුවිශේෂී සන්ධිස්ථානයකට එළඹී අතර, මෙම ව්‍යාපෘතියේ 01 වැනි අදියර යටතේ ඩයලොග් සහ මොබිටෙල් සම්බන්ධතා භාවිතා කරන පාරිභෝගිකයින්ට මෙම ක්‍රියාවලිය තුළින් පහසුකම් සලසා ඇත. දෙවැනි අදියරෙහි දී මෙම පහසුකම අනෙකුත් විදුලි සංදේශ සේවා සපයන්නන් වෙත ද ව්‍යාප්ත කරනු ලැබේ. ඒ අනුව ලග්න වාසනා, සුපර් බෝල්, ශනිදා සහ සසිරි ඩිජිටල් ලොතරැයිය යන ලොතරැයි කෙටි පණිවුඩ සේවාව/ USSD තාක්ෂණය ඔස්සේ මිලදී ගත හැකිය.

බැංකු ඒකාබද්ධ කිරීම

නවතම තාක්ෂණික ප්‍රවනතාවයන්ට අනුවර්තනය වීම තුළින් ශ්‍රී ලංකාවේ ලොතරැයි කර්මාන්තයේ විප්ලවීය වෙනසක් ඇති කළ රාජ්‍ය ආයතනයක් වශයෙන් සංවර්ධන ලොතරැයි මණ්ඩලය 2020 මාර්තු 20 වැනි දින ලංකා බැංකුව සහ මහජන බැංකුව සමග සහයෝගීත්වය ගොඩනගමින්, මණ්ඩලයේ මූල්‍ය ගනුදෙනුවල කාර්යක්ෂමතාවය සහ ඵලදායීතාවය වැඩිදියුණු කර ගැනීම පිණිස, එම බැංකුවල පරිගණක පද්ධති මෙම මණ්ඩලයේ භාවිතා කරනු ලබන ලොතරැයි කළමනාකරණ පද්ධතිය සමග ඒකාබද්ධ කරන ලද බව සඳහන් කිරීමට ලැබීම ආඩම්බරයට කරුණක් වේ. මෙම පහසුකම කරදර වලින් තොර අත්දැකීමක් සහතික කරන අතර, එමගින් බෙදාහරින්නන්ට බැංකුවේ ජංගම යෙදුම් භාවිතා කරමින් මුදල් තැන්පත් කිරීමේ යන්ත්‍ර (CDM) හරහා සහ මාර්ගගත බැංකුකරණය (online banking) මගින් ද අන්තර්ජාල තාක්ෂණය ඔස්සේ මුදල් තැන්පත් කළ හැකිය.

ආයතනික සමාජ වගකීම් ක්‍රියාමාර්ග

සංවර්ධන ලොතරැයි මණ්ඩලය කොවිඩ්-19 වසංගතයෙන් බලපෑමට ලක් වූ අලෙවි නියෝජිතයින් සහ අලෙවි සහායකයින් 16,350 දෙනෙකුට නැවත යථා තත්වයට පත්වීමට සහාය වීම පිණිස මූල්‍ය ආධාරයක් වශයෙන් රු. 2,500/- බැගින් ලබා දුන් අතර එම වැඩ සටහන සඳහා වැය කළ මුදල රුපියල් මිලියන 40 කි. එමෙන් ම, සංවර්ධන ලොතරැයි මණ්ඩලය සිය අලෙවි නියෝජිතයින්ට සහ අලෙවි සහායකයින්ට කොවිඩ් -19 වෛරසයෙන් ආරක්ෂා වීම සඳහා 2020 වර්ෂයේදී අත්වැසුම් 37,500 ක් බෙදා දීමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කළේය. තවද, 2020 වර්ෂයේ දී සංවර්ධන ලොතරැයි මණ්ඩලය අලෙවි නියෝජිතයින්ට සහ අලෙවි සහායකයින්ට මණ්ඩලයේ නිල ලාංඡනය සහිත කෝප්ප (මග්) 2,421 ක් බෙදා දුන්නේය.

අනුග්‍රහකත්වයන් සඳහා දායක වීම

- කොළඹ නගර සීමාව තුළ කොවිඩ් -19 වසංගතයෙන් පීඩාවට පත් වූ ජනතාව සඳහා සංවර්ධන ලොතරැයි මණ්ඩලය රුපියල් මිලියන 3.2 ක් වටිනා විළවළු මලු බෙදා දුන්නේය.

- සංවර්ධන ලොතරැයි මණ්ඩලය 2020 වර්ෂයේ දී කැලණිය දුරුතු පෙරහැර සඳහා රු. 1,000,000.00 ක දායකත්වයක් සපයා දුන්නේය.

- සංවර්ධන ලොතරැයි මණ්ඩලය 2020 වර්ෂයේ දී කතරගම ඇසල පෙරහැර සඳහා රු. 1,000,000.00 ක දායකත්වයක් සපයා දුන්නේය.

- එයට අමතරව 2020 වර්ෂයේ දී කොළඹ පැවති ගංගාරාමයේ නවම් පෙරහැර සඳහා ද සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් රු.250,000.00 ක අනුග්‍රාහකත්වයක් සපයා දී ඇත.

අතිගරු ජනාධිපතිතුමා, ගරු මුදල් ඇමතිතුමා සහ භාණ්ඩාගාර ලේකම්තුමා විසින් ලබා දෙන ලද සහයෝගය හා මගපෙන්වීම වෙනුවෙන් එතුමන් වෙත මාගේ කෘතඥතාවය පළ කර සිටිමි. පසුගිය වසර කිහිපය තුළදී සහ වර්තමානයේ දී ද, අපගේ ප්‍රජාවන්ට සහයෝගය දක්වමින් අපගේ ගනුදෙනුකරුවන්ට සුවිශේෂී සේවාවක් සපයා දීම සඳහා කටයුතු කර ඇති සහ කටයුතු කරමින් සිටින අති දක්ෂ සහ කැපවූ කාර්ය මණ්ඩලයක සහයෝගය ඇතිව එම කාලය තුළදී දැනුම ලබා ගනිමින් සහ දැනුම හුවමාරු කර ගනිමින් අපගේ විවිධ පාර්ශවකරුවන් සමග එකට එක්ව කටයුතු කිරීමට ලැබීම ඉතා වටිනා අත්දැකීමක් වී තිබේ.
සියලු දිනුම් ඇදීම් විනිශ්චයකරුවන්ට, ජනාධිපති අරමුදලේ කාර්ය මණ්ඩලයට, මහපොළ උසස් අධ්‍යාපන හාර අරමුදලේ කාර්ය මණ්ඩලයට, බෙදාහරින්නන්ට, අලෙවි නියෝජිතයින්ට, අලෙවි සහායකයින්ට, ජනමාධ්‍ය වලට, බැංකුකරුවන්ට, සියලුම සේවා සපයන්නන්ට සහ විශේෂයෙන්ම, සාමාන්‍යාධිකාරී, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරුන් සහ සහකාර සාමාන්‍යාධිකාරිවරුන් ඇතුළු අපගේ විධායක මාණ්ඩලික නිලධාරීන් යන සියලු දෙනාට ම මම විශේෂ ස්තූතිය පුද කරමි. එමෙන් ම, අමතර උත්සාහයක් දරමින්, කැපවීමෙන් යුතුව, තම කාර්යභාරය මැනවින් ඉටු කරමින් අපගේ සාර්ථකත්වය උදෙසා දායකත්වය ලබා දුන්, සෑම අංශයකම සිටින අනෙකුත් සියලුම කාර්ය මණ්ඩල සාමාජිකයින්ව ද අපි අමතක නොකරන්නෙමු. අපි සංවර්ධන ලොතරැයි මණ්ඩලයෙහි සිටීම අර්ථාන්විත කිරීමට ඔවුන් අපට සැබවින්ම සහාය වී ඇත. තවද, අපගේ සේවාවන්ට අනුග්‍රහය දැක්වූ සියලුම පාරිභෝගිකයින්ට ද අපගේ ස්තූතිය පිරිනමන අතර, ඔවුන්ගේ අනුග්‍රහය නොමැතිව අපිට මෙම ජයග්‍රහණ ලබා ගැනීමට නොහැකි වනු ඇති බව ද සඳහන් කිරීමට කැමැත්තෙමු. එමෙන් ම, අප වෙත ලබා දුන් වටිනා දායකත්වය වෙනුවෙන් විගණන අධිකාරිවරයාට සහ විගණකාධිපති දෙපාර්තමේන්තුවට ද අපගේ ස්තූතිය පිරිනමන්නෙමු.
අවසාන වශයෙන්, මෙම ආයතනය කෙරෙහි තබා ඇති විශ්වාසය හා බලාපොරොත්තුව වෙනුවෙන් අපගේ සියලුම පාර්ශවකරුවන්ට මම ස්තූතිවන්ත වන අතර ඉදිරි වර්ෂවලදී ද ඔබගේ අඛණ්ඩ සහයෝගය මම අපේක්ෂා කරමි.

අනූෂ පැල්පිට
සභාපති/ප්‍රධාන විධායක නිලධාරී

අධ්‍යක්ෂ මණ්ඩලයේ සමාලෝචනය

1997 අංක 20 දරණ සංවර්ධන ලොතරැයි මණ්ඩල පනත මගින් සංවර්ධන ලොතරැයි මණ්ඩලය පාලනය කරනු ලැබේ. ජනාධිපති අරමුදලට සහ මහපොල උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව හාර අරමුදලට අරමුදල් සැපයීම මණ්ඩලයෙහි ප්‍රධාන අරමුණු වේ. සංවර්ධන ලොතරැයි මණ්ඩලය වසංගතය මධ්‍යයෙහි වුව ද 2020 වර්ෂයේ දී ජනාධිපති අරමුදලට සැලකිය යුතු දායකත්වයක් ලබා දුන්නේය.

	2019	2020	සාධනය
ආදායම. (රු. මි.)	17,799	15,400	87%
ජනාධිපති අරමුදලට ලබා දුන් දායකත්වය (රු. මි.)	2,669	2,982	112%
ජයග්‍රාහකයින්ට ලබා දුන් ත්‍යාග මුදල් (රු. මි.)	8,903	7,702	87%

අපගේ කැපී පෙනෙන ජයග්‍රහණ

කොවිඩ්-19 වසංගතයත් සමග අපිට අපගේ පාරිභෝගිකයින්ගේ ඉල්ලීම් සපුරාලිය හැකි නව්‍ය ක්‍රම පිළිබඳ සිතා බැලීමට සිදු විය. ඒ අනුව අපි පසුගිය වසර තුළදී ඩිජිටල් අවකාශයෙහි වැදගත් සන්ධිස්ථාන කිහිපයක් අත්කර ගත්තෙමු. එම ජයග්‍රහණ වලින් කිහිපයක් පහත සඳහන් පරිදි වේ:

■ ඩී.එල්.බී. ස්වීප් (DLB Sweep) ජංගම යෙදුම:
අපගේ පාරිභෝගිකයින්ට වඩාත් වැඩිදියුණු කළ හා ඩිජිටල්කරණය කළ සේවාවක් සපයා දීම සඳහා DLB Sweep App යෙදුම හඳුන්වා දෙන ලදී. මෙම යෙදුම මගින් මහජනතාවට ලොතරැයි ප්‍රතිඵල පරීක්ෂා කර බැලීම හැරෙන්නට, ක්‍රෙඩිට්/ඩෙබිට් කාඩ්, බැංකු ගිණුම් වැනි ගෙවීම් ක්‍රම මගින් ලග්න වාසනා, ශනිදා, සුපර් බෝල් සහ සසිරි ටිකට්පත් මිලදී ගත හැකිය.

■ බැංකු ඒකාබද්ධ කිරීම:
සංවර්ධන ලොතරැයි මණ්ඩලයෙහි ගනුදෙනු වල කාර්යක්ෂමතාවය හා ඵලදායිතාවය ඉහළ නැංවීම සඳහා ලංකා බැංකුව සහ මහජන බැංකුව මෙම මණ්ඩලය සමග සහයෝගීත්වය ගොඩනගමින් එම බැංකුවල පරිගණක පද්ධති මෙම මණ්ඩලයෙහි භාවිතා කරනු ලබන ලොතරැයි කළමනාකරණ පද්ධතිය සමග සම්බන්ධ කළේය.

■ සසිරි ඩිජිටල් ලොතරැයිය සහ DLB Sweep App දියත් කිරීම:
2020 සැප්තැම්බර් මාසයේ දී සංවර්ධන ලොතරැයි මණ්ඩලය දකුණු ආසියාවේ ප්‍රථම ඩිජිටල් ලොතරැයිය 'සසිරි' වෙළඳ නාමය යටතේ දියත් කරන ලදී.

වසංගතය තත්වය මධ්‍යයෙහි ආයතනික සමාජ වගකීම් වැඩසටහන්
අලෙවි නියෝජිතයින් සහ අලෙවි සහායකයින් සංවර්ධන ලොතරැයි මණ්ඩලයෙහි ප්‍රාණ නාළිය වන අතර ඔවුන් අපගේ සාර්ථකත්වය සඳහා අනිවාර්යයෙන් සිටිය යුතු කොටසක් වේ. වසංගතය හේතුවෙන් බොහෝ අලෙවි නියෝජිතයින් සහ සහායකයින් පීඩාවට පත් වූ අතර මෙම අභියෝගාත්මක අවස්ථාවේදී ඔවුන්ට අත දීම සඳහා වැඩසටහන් කිහිපයක් සංවිධානය කරන ලදී.

■ සංවර්ධන ලොතරැයි මණ්ඩලය කොවිඩ්-19 වසංගතයෙන් බලපෑමට ලක් වූ අලෙවි නියෝජිතයින් සහ අලෙවි සහායකයින් 16,350 දෙනෙකුට නැවත යථා තත්වයට පත්වීමට සහාය වීම පිණිස මූල්‍ය ආධාරයක් වශයෙන් රු. 2,500/- බැගින් ලබා දුන් අතර එම වැඩ සටහන සඳහා වැය කළ මුදල රුපියල් මිලියන 40 කි.

■ සංවර්ධන ලොතරැයි මණ්ඩලය සිය අලෙවි නියෝජිතයින්ට සහ අලෙවි සහායකයින්ට කොවිඩ් -19 වෛරසයෙන් ආරක්ෂා වීම සඳහා 2020 වර්ෂයේදී අත්වැසුම් 37,500 ක් බෙදා දීමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කළේය.

■ එමෙන් ම, 2020 වර්ෂයේ දී සංවර්ධන ලොතරැයි මණ්ඩලය අලෙවි නියෝජිතයින්ට සහ අලෙවි සහායකයින්ට මණ්ඩලයේ නිල ලාංඡනය සහිත කෝප්ප (මග්) 2,421 ක් බෙදා දුන්නේය.

අනුග්‍රහකත්වයන් සඳහා දායක වීම
■ කොළඹ නගර සීමාව තුළ කොවිඩ් -19 වසංගතයෙන් පීඩාවට පත් වූ ජනතාව සඳහා සංවර්ධන ලොතරැයි මණ්ඩලය රුපියල් මිලියන 3.2 ක් වටිනා වළඳවළු මලු බෙදා දුන්නේය.

■ සංවර්ධන ලොතරැයි මණ්ඩලය 2020 වර්ෂයේ දී කැලණිය දුරුතු පෙරහැර සඳහා රු. 1,000,000.00 ක දායකත්වයක් සපයා දුන්නේය.

■ සංවර්ධන ලොතරැයි මණ්ඩලය 2020 වර්ෂයේ දී කතරගම ඇසල පෙරහැර සඳහා රු. 1,000,000.00 ක දායකත්වයක් සපයා දුන්නේය.

■ එයට අමතරව 2020 වර්ෂයේ දී කොළඹ පැවති ගංගාරාමයේ නවම් පෙරහැර සඳහා ද සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් රු. 250,000.00 ක අනුග්‍රාහකත්වයක් සපයා දී ඇත.

සංවර්ධනය ලොතරැයි මණ්ඩලය වෙත ලබා දුන් සහයෝගය වෙනුවෙන් අතිගරු ජනාධිපතිතුමාටත්, ගරු අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමාටත් මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අවංක ස්තුතිය පුද කර සිටින අතර, කොවිඩ් 19 වසංගතය හේතුවෙන් රට තුළ පැවති දුෂ්කර වාතාවරණය මධ්‍යයෙහි මණ්ඩලයේ වාර්ෂික ඉලක්කය සපුරා ගැනීම සඳහා කඩිසරව කැපවී කටයුතු කළ අපගේ සේවක සේවක මහත්ම මහත්මීන්ට ද අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අවංක ස්තුතිය පුද කරමි. ස්තුතිය පිරිනැමිය යුතු තවත් බොහෝ පිරිසක් සිටින අතර, අපගේ පාරිභෝගිකයින් වෙත අපගේ නිෂ්පාදන ලබා දීම සඳහා විශාල දායකත්වයක් සපයා දුන් අපගේ අලෙවි බලකායට, විශේෂයෙන්ම බෙදාහරින්නන්, අලෙවි නියෝජිතයින්, අලෙවි සහායකයින්, සහ ප්‍රතිවිකුණුම්කරුවන්ට ද අපගේ ස්තුතිය මෙයින් පිරිනමන්නෙමු.

අවසාන වශයෙන්, සංවර්ධන ලොතරැයි මණ්ඩලය කෙරෙහි තබා ඇති විශ්වාසය හා බලාපොරොත්තුව වෙනුවෙන් අපගේ සියලුම පාරිභෝගිකයින්ට සහ පාර්ශවකරුවන්ට මාගේ අවංක ස්තුතිය පුද කර සිටිමි.

රවින්ද්‍ර ජේ විමලවීර
අධ්‍යක්ෂ

අධ්‍යක්ෂ මණ්ඩලය - 2020

අමිත ගමගේ මහතා
සභාපති / ප්‍රධාන විධායක නිලධාරී
2020.12.17 දින සිට ක්‍රියාත්මක වන පරිදි

ජේ.එම්. භද්‍රානි ජයවර්ධන මහත්මිය
ලේකම්,
වෙළඳ අමාත්‍යාංශය
අධ්‍යක්ෂ
2020.10.05 දින සිට ක්‍රියාත්මක වන පරිදි

එච්.ජී. සුමනසිංහ මහතා
අතිරේක ලේකම්,
මුදල් අමාත්‍යාංශය
අධ්‍යක්ෂ
2020.01.11 දින සිට ක්‍රියාත්මක වන පරිදි

ජෙනට් ජයවර්ධන මහත්මිය
(නීතිඥ)
අධ්‍යක්ෂ
2020.01.15 දින සිට ක්‍රියාත්මක වන පරිදි

රවීන්ද්‍ර ජේ. විමලවීර මහතා
ප්‍රධාන මූල්‍ය නිලධාරී,
ජනාධිපති ලේකම් කාර්යාලය,
අධ්‍යක්ෂ
2020.07.20 දින සිට ක්‍රියාත්මක වන පරිදි

වර්තමාන අධ්‍යක්ෂ මණ්ඩලය

වී.පී.කේ. අනූෂ පැල්පිට මහතා
සභාපති / ප්‍රධාන විධායක නිලධාරී
2021.06.19 දින සිට ක්‍රියාත්මක වන පරිදි

ජේ.එම්. භද්‍රානි ජයවර්ධන මහත්මිය
ලේකම්,
වෙළඳ අමාත්‍යාංශය
2020.10.05 දින සිට ක්‍රියාත්මක වන පරිදි

රවීන්ද්‍ර ජේ. විමලවීර මහතා
ප්‍රධාන මූල්‍ය නිලධාරී,
ජනාධිපති ලේකම් කාර්යාලය
2020.07.20 දින සිට ක්‍රියාත්මක වන පරිදි

ජෙනට් ජයවර්ධන මහත්මිය
(නීතිඥ)
2020.01.15 දින සිට ක්‍රියාත්මක වන පරිදි

කේ.ඒ.එච්.සී. පුබුදුසිරි මෙනවිය
අධ්‍යක්ෂ
විදේශ සම්පත් දෙපාර්තමේන්තුව
මුදල් අමාත්‍යාංශය
2021.06.28 දින සිට ක්‍රියාත්මක වන පරිදි

කළමනාකරණ කණ්ඩායම

01 **වී.ජී.කේ. අනුෂ පැල්පිට මහතා**
සභාපති / ප්‍රධාන විධායක නිලධාරී

02 **ඩබ්ලිව්.කේ.ඒ.ඒ. ජයරත්න මහතා**
සාමාන්‍යාධිකාරී

03 **ඩබ්ලිව්.ඒ.වී.සී. සෝමරත්න මෙනවිය**
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල්)

04 **ඩී.ඩී.සී. දමින්ද මහතා**
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අලෙවිකරණ)

05 **කේ.එන්. බුලත්සිංහල මහතා**
සහකාර සාමාන්‍යාධිකාරී (අලෙවිකරණ)

06 **සුනිල් ජයරත්න මහතා**
සහකාර සාමාන්‍යාධිකාරී (විකුණුම්)

07 **වී. කසුන් ජයසූරිය මහතා**
සහකාර සාමාන්‍යාධිකාරී (මුදල්)

08 **නිෂාන් පෙරේරා මහතා**
සහකාර සාමාන්‍යාධිකාරී (මුදල්)

09 **අසංකා එස්. ගුණසිංහ මහත්මිය**
සහකාර සාමාන්‍යාධිකාරී (අලෙවිකරණ)

10 **පී.බී. මධුර හර්ෂණ මහතා**
සහකාර සාමාන්‍යාධිකාරී (තොරතුරු තාක්ෂණ)

11 **රෝහන ප්‍රසාද් රණසිංහ මහතා**
සහකාර සාමාන්‍යාධිකාරී (මානව සම්පත් සහ පරිපාලන)

12 **පී.ඩී.යූ. මලින්ත මහතා**
සහකාර සාමාන්‍යාධිකාරී (ප්‍රසම්පාදන)

13 **එස්.එම්.ඒ. වසන්ත උදයකුමාර මහතා**
අභ්‍යන්තර විගණක

කනිෂ්ඨ කළමනාකරුවන්

01 **ඊ.ඩී.අයි.එන්.එස්. අබේරත්න මහතා**
පරිපාලන නිලධාරී

02 **ජේ.එම්.ඩී.ඒ ක්‍රිෂාන්ත මහතා**
ප්‍රධාන ආරක්ෂක නිලධාරී

03 **එම්.බී.එම්.එන්.කේ. බලගල්ල මහතා**
කලාප කළමනාකරු

04 **සී. සී. අයිලප්පෙරුම මහතා**
කලාප කළමනාකරු

05 **ජී.ඒ.ආර්.එස්. රණතුංග මහතා**
කලාප කළමනාකරු

06 **එම්.කේ.ඒ.අයි. කමල්සිරි මහතා**
කලාප කළමනාකරු

07 **අයි.ඩී. පත්ම කුමාරසිරි මහතා**
කලාප කළමනාකරු

08 **ඩී.එම්.බී.එල්. මහින්ද මහතා**
කලාප කළමනාකරු

09 **එම්.එල්. ගෞරි කවිශල්‍යා මහත්මිය**
කලාප කළමනාකරු

10 **ආර්.ඒ. සුනිල් රත්නායක මහතා**
කලාප කළමනාකරු

11 **ආර්.එම්.යූ.එස්. කුමාර මහතා**
කලාප කළමනාකරු

12 **එන්.වී. ඉන්දික උපුල් මහතා**
ගිණුම් නිලධාරී

13 **ආර්.ඩී.සී. රාජපක්ෂ මහත්මිය**
ගිණුම් නිලධාරී

14 **එම්.ඒ.එල්.එන්. ගුණසේකර මහත්මිය**
ගිණුම් නිලධාරී

15 **ආර්.ඒ.ඩබ්ලිව්.ජී. රූපසිංහ මහත්මිය**
ගිණුම් නිලධාරී

16 **යූ.ජී. ඉලේපෙරුම මහතා**
පද්ධති විශ්ලේෂක

17 **සී. එන්. තෙවරප්පෙරුම මහත්මිය**
මානව සම්පත් නිලධාරී

18 **බී.ඒ.සී.ජේ. කරුණාරත්න මහතා**
ප්‍රසම්පාදන නිලධාරී

19 **ජී. ප්‍රසන්න ගෝකුල ප්‍රනාන්දු මහතා**
ප්‍රවාහන නිලධාරී

20 **ජී.ඩී.එස්. ප්‍රේමතිලක මහත්මිය**
අලෙවිකරණ සහ ප්‍රචාරණ නිලධාරී

මෙහෙයුම් සමාලෝචනය

2020 වර්ෂයේ අලෙවි කටයුතු පිළිබඳ විශේෂ කරුණු

සංවර්ධන ලොතරැයි මණ්ඩලය 2020 වර්ෂය සඳහා සිය අලෙවි කටයුතු නිසියාකාරව සැලසුම් කර තිබුණා ද, මුළු රටට ම බලපෑ කොවිඩ්-19 වසංගත තත්වය හේතුවෙන් වසරේ මුල් කාර්තුවෙන් පසුව ඉලක්ක සපුරා ගැනීමේ ප්‍රගතිය මන්දගාමී ස්වභාවයක් පෙන්නුම් කළේය. කෙසේ වෙතත්, මණ්ඩලය අලෙවි ප්‍රවර්ධනය සඳහා අනුගමනය කරන ලද උපාය මාර්ග හේතුවෙන් වසරේ අවසාන කාර්තුවේදී සිය අලෙවිය නැවත ඉහළ මට්ටමකට ගෙන ඒමට මණ්ඩලයට හැකි විය. එමෙන් ම, වත්මන් වර්ෂය තුළ මණ්ඩලය ක්‍රියාත්මක කළ ඵලදායී අලෙවිකරණ ක්‍රියාවලිය හේතුවෙන් ජයග්‍රාහකයින් සඳහා සැලකිය යුතු මුදලක් පිරිනමන අතරම ජනාධිපති අරමුදලට ද අති විශාල මුදලක් ලබා දීමට සංවර්ධන ලොතරැයි මණ්ඩලය සමත් වී තිබේ.

01. ප්‍රවර්ධන වැඩසටහන්

පහත සඳහන් විකුණුම් ප්‍රවර්ධන ක්‍රම අනුගමනය කිරීම මගින් සංවර්ධන ලොතරැයි මණ්ඩලයට 2020 වර්ෂයේදී සිය අලෙවිය වැඩි කර ගැනීමට හැකි විය.

• ශනිදා වාසනාව

ශනිදා වාසනාව ලොතරැයියෙහි 3322 වැනි දිනුම් ඇදීම වෙනුවෙන් 2020 ජූනි 8 වැනි (සඳුදා) දින **"අවුරුදු වාසනා"** නමින් හැඳින්වූ විශේෂ දිනුම් ඇදීමක් සිදු කරන ලද අතර, මෙම විශේෂ දිනුම් ඇදීම සඳහා ලොතරැයිපත් මිලියන 1.4 ක් අලෙවි කරන ලදී. මෙම විශේෂ දිනුම් ඇදීම අප්‍රේල් මාසයේදී පැවැත්වීමට සැලසුම් කර ගෙන සිටි නමුත් කොවිඩ් වසංගතය හේතුවෙන් එය සැලසුම් කර තිබූ පරිදි අප්‍රේල් මාසයේදී පැවැත්වීමට නොහැකි විය. එමෙන් ම, 3416 වැනි දිනුම් ඇදීම සඳහා ද 2020 ඔක්තෝම්බර් 29 (බ්‍රහස්පතින්දා) දින විශේෂ දිනුම් ඇදීමක් සිදු කරන ලද අතර ඒ සඳහා ද මිලියන 1.4 ක ලොතරැයි අලෙවියක් සිදු විය.

"ශනිදා වාසනාව" නැමති වෙළඳ නාමය ප්‍රවර්ධනය කිරීමේ අදහසින් එම ලොතරැයිය සතියේ දින 07 සඳහා ම හඳුන්වා දෙමින්, 2020 සැප්තැම්බර් මස 02 වැනි දින (බදාදා) සිට **"ශනිදා"** ලෙස එහි නාමය වෙනස් කර 2020 සැප්තැම්බර් 02 සිට 2020 නොවැම්බර් 22 දක්වා කාලය තුළ **"දෙවැනි රැල්ල"** නමින් කුඩා දිනුම් ඇදීම් මාලාවක් පවත්වන ලදී. මෙමගින් සැලකිය යුතු අලෙවි වර්ධනයක් පෙන්නුම් කරන ලදි.

• ලග්න වාසනා

2020 පෙබරවාරි 28 වැනි (සිකුරාදා) දින ලග්න වාසනා ලොතරැයිය සඳහා " සුපිරි ධන යෝගය" නමින් විශේෂ දිනුම් ඇදීමක් පවත්වන ලදී. මෙම විශේෂ දිනුම් ඇදීම සඳහා අලෙවි කරන ලද මුළු ටිකට් ප්‍රමාණය මිලියන 2.8 ක් විය. මේ අතර, 2020 අගෝස්තු 28 වැනි (සඳුදා) දිනයේ දී ද "සුපිරි ධන යෝගය" නමින් ම තවත් දිනුම් ඇදීමක් පවත්වන ලද අතර එහිදී ටිකට්පත් මිලියන 2.6 ක් අලෙවි විය. තවද, 2020 සැප්තැම්බර් 1 සිට ඔක්තෝබර් 31 දක්වා කාලය තුළදී "ඩබල් චාන්ස්" නමින් ප්‍රවර්ධන වැඩසටහනක් ද පවත්වන ලදී.

• ජයෝදා

ජයෝදා ලොතරැයි දිනුම් ඇදීම් සාමාන්‍යයෙන් අඟහරුවාදා සහ බ්‍රහස්පතින්දා දිනවල සිදු කරන ලද නමුත් කාලසටහන සංශෝධනය කර එම දිනුම් ඇදීම 2020 සැප්තැම්බර් 02 වැනි (බදාදා) දින සිට සඳුදා සහ බදාදා ලෙස වෙනස් කරන ලදී.

• සුපර් බෝල්

සුපර් බෝල් ලොතරැයිය සඳහා ඇති ඉහළ ඉල්ලුම සැලකිල්ලට ගෙන **2020 සැප්තැම්බර් 02 වැනි දින සිට** එම ලොතරැයිය සතියේ දින 07 හි දී ම දිනුම් ඇදීම හඳුන්වා දී ඇති අතර, **2020 සැප්තැම්බර් 30 වැනි (බදාදා)** දින සිදු කරන ලද විශේෂ දිනුම් ඇදීම සඳහා මිලියන 2.2 ක ලොතරැයිපත් අලෙවියක් වාර්තා විය. **'සුපර් 500'** නමින් හඳුන්වන ලද ප්‍රධාන දිනුම් ඇදීමට අමතරව, 2020 සැප්තැම්බර් 2 සිට 2020 නොවැම්බර් 22 දක්වා කාලය තුළ කුඩා දිනුම් ඇදීම් මාලාවක් ද පවත්වන ලදී.

• සංවර්ධන වාසනා

සංවර්ධන වාසනාව ලොතරැයිය බදාදා සහ සිකුරාදා දිනවල දිනුම් අදින ලද නමුත් **2020 සැප්තැම්බර් 02 දින** සිට එම ලොතරැයිය දිනුම් ඇදීමේ දින බ්‍රහස්පතින්දා සහ සෙනසුරාදා දිනවලට වෙනස් කරමින් දිනුම් ඇදීම් කාලසටහන සංශෝධනය කරන ලදි.

• අද කෝටිපති

2020 ජූලි 31 වැනි (සිකුරාදා) දින **'අද විශේෂ කෝටිපති'** නමින් විශේෂ දිනුම් ඇදීමක් පවත්වන ලද අතර එම ප්‍රවර්ධනය මගින් **මිලියන 1.6** ක ලොතරැයිපත් අලෙවියක් වාර්තා විය. අද කෝටිපති ප්‍රධාන දිනුම් ඇදීම හැරුණු විට, **2020 අගෝස්තු 17 සිට 2020 ඔක්තෝබර් 17 දක්වා** කාලය තුළ "සල්ලි සීසන්" නමින් කුඩා දිනුම් ඇදීමක් ද පවත්වන ලදී.

• සසිරි

2020 ඔක්තෝබර් 14 වෙනිදා (බදාදා) දකුණු ආසියාවේ ප්‍රථම ඊ-ලොතරැයි වෙළඳ සන්නාමය ලෙස "සසිරි" නමින් නව ලොතරැයියක් වෙළඳපොලට හඳුන්වා දෙන ලද අතර මෙම ලොතරැයිය බදාදා සහ සෙනසුරාදා දිනවල දිනුම් අදිනු ලැබේ.

• ක්ෂණික ලොතරැයි

ක්ෂණික ලොතරැයි අලෙවිය ඉහළ නැංවීම පිණිස ලොතරැයි අලෙවි නියෝජිතයින් හට "අතහිත" නමින් ක්ෂණික ලොතරැයියක් නිකුත් කරන ලද අතර එම ලොතරැයියෙහි ත්‍යාග වශයෙන් ලාම්පු, මයික්‍රොෆෝන්, ස්පීකර්, සූර්ය බලයෙන් ක්‍රියා කරන ලාම්පු, ඇම්ප්ලිෆයර් සහ ශබ්ද විකාශන යන්ත්‍ර පද්ධති පිරිනමනු ලැබේ.

02. 2020 වර්ෂය සඳහා බෙදාහැරීමේ අලෙවි නියෝජිතයන් සහ අලෙවි නියෝජිතයින් පත් කිරීම

දිස්ත්‍රික්කයේ අංකය	දිස්ත්‍රික්කය	බෙදාහැරීමේ අලෙවි නියෝජිතයින්	අලෙවි නියෝජිතයින්
01	කොළඹ	01	11
02	කළුතර		01
03	නුවර		05
04	මාතලේ		03
05	නුවර එළිය		01
06	ගාල්ල		01
07	මාතර		
08	හම්බන්තොට		02
09	යාපනය		01
10	මන්නාරම		01
11	වව්නියාව		
12	මඩකලපුව		
13	අම්පාර		01
14	ත්‍රිකුණාමලය		
15	කුරුණෑගල		
16	පුත්තලම		
17	අනුරාධපුර		
18	පොලොන්නරුව		01
19	බදුල්ල		
20	මොණරාගල		02
21	රත්නපුර		
22	කෑගල්ල		01
23	ගම්පහ		04
24	කිලිනොච්චිය		
25	මුලතිව්		
		01	35

03. අලෙවි නියෝජිතයින්ගේ සහ අලෙවි සහායකයන්ගේ ප්‍රයෝජනය සඳහා සංවිධානය කරන ලද විශේෂ වැඩසටහන්

- සංවර්ධන ලොතරැයි මණ්ඩලය කොවිඩ්-19 වසංගතයෙන් බලපෑමට ලක් වූ අලෙවි නියෝජිතයින් සහ අලෙවි සහායකයින් 16,350 දෙනෙකුට නැවත යථා තත්වයට පත්වීමට සහාය වීම පිණිස මූල්‍ය ආධාරයක් වශයෙන් රු. 2,500/- බැගින් ලබා දුන් අතර එම වැඩ සටහන සඳහා වැය කළ මුදල රුපියල් මිලියන 40 කි.
- සංවර්ධන ලොතරැයි මණ්ඩලය සිය අලෙවි නියෝජිතයින්ට සහ අලෙවි සහායකයින්ට කොවිඩ් -19 වෛරසයෙන් ආරක්ෂා වීම සඳහා 2020 වර්ෂයේ දී අත්වැසුම් 37,500 ක් බෙදා දීමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කළේය.
- එමෙන් ම, 2020 වර්ෂයේ දී සංවර්ධන ලොතරැයි මණ්ඩලය අලෙවි නියෝජිතයින්ට සහ අලෙවි සහායකයින්ට මණ්ඩලයේ නිල ලාංඡනය සහිත කෝප්ප (මග්) 2,421 ක් බෙදා දුන්නේය.
- 2020 මාර්තු 12 වැනි දින ලංකා බැංකුවෙහි සහ මහජන බැංකුවෙහි පරිගණක පද්ධති මෙම මණ්ඩලයේ භාවිතා කරනු ලබන ලොතරැයි කළමනාකරණ පද්ධතිය සමග ඒකාබද්ධ කිරීම මගින් ලොතරැයි බෙදාහරින්නන්ට මාර්ගගත බැංකුකරණ (online banking) ක්‍රමවේදය භාවිතා කරමින් මුදල් තැන්පත් කිරීමේ නව පහසුකමක් හඳුන්වා දෙන ලදී. මෙම පහසුකම කරදර වලින් තොර අත්දැකීමක් සහතික කරන අතර, එමගින් බෙදාහරින්නන්ට බැංකුවේ ජංගම යෙදුම් භාවිතා කරමින් මුදල් තැන්පත් කිරීමේ යන්ත්‍ර (CDM) හරහා සහ මාර්ගගත බැංකුකරණය මගින් ද අන්තර්ජාල තාක්ෂණය ඔස්සේ මුදල් තැන්පත් කළ හැකිය.

04. අනුග්‍රාහකත්වය සඳහා දායකත්වය සැපයීම්

- කොළඹ නගර සීමාව තුළ කොවිඩ් -19 වසංගතයෙන් පීඩාවට පත් වූ ජනතාව සඳහා සංවර්ධන ලොතරැයි මණ්ඩලය රුපියල් මිලියන 3.2 ක් වටිනා එළවළු මලු බෙදා දුන්නේය.
- සංවර්ධන ලොතරැයි මණ්ඩලය 2020 වර්ෂයේ දී කැලණිය දුරුතු පෙරහැර සඳහා රු. 1,000,000.00 ක දායකත්වයක් සපයා දුන්නේය.
- සංවර්ධන ලොතරැයි මණ්ඩලය 2020 වර්ෂයේ දී කතරගම ඇසල පෙරහැර සඳහා රු. 1,000,000.00 ක දායකත්වයක් සපයා දුන්නේය..
- එයට අමතරව 2020 වර්ෂයේ දී කොළඹ පැවති ගංගාරාමයේ නවම් පෙරහැර සඳහා ද සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් රු.250,000.00 ක අනුග්‍රාහකත්වයක් සපයා දී ඇත.

05. විශේෂ වැඩසටහන්

- 2020 ඔක්තෝබර් මස 14 වැනි දින සංවර්ධන ලොතරැයි මණ්ඩලය IOS සහ ඇන්ඩ්‍රොයිඩ් යන දෙවර්ගයේ ම ස්මාර්ට් ජංගම දුරකථන භාවිතා කරන්නන් සඳහා ඩී.එල්.බී. ස්වීප් ඇප් (DLB Sweep App) නැමති ජංගම දුරකථන යෙදුම හඳුන්වා දෙමින් ඩිජිටල් ලෝකයට පය තැබුවේය. එම පරිශීලකයින්ට අන්තර්ජාලය ඔස්සේ මෙම යෙදුම හරහා ලග්න වාසනා, සුපර් බෝල්, ශනිදා සහ සසිරි යන ලොතරැයි මිලදී ගැනීමටත්, සියලුම නාමයන් යටතේ ඇති ලොතරැයිපත් වල ප්‍රතිඵල පරීක්ෂා කර බැලීමට සහ ත්‍යාග මුදල් ලබා ගැනීමටත් හැකි වේ.
- එමෙන්ම, 2020 දෙසැම්බර් 15 වැනි දින සංවර්ධන ලොතරැයි මණ්ඩලය ලොතරැයි ටිකට්පත් මිලදී ගැනීම (සඳහා කෙටි පණිවුඩ සේවා) SMS ලොතරැයි සහ USSD ක්‍රමවේදය ද හඳුන්වා දුන්නේය.

අපගේ නිෂ්පාදන කළඹ පිළිබඳ දළ විශ්ලේෂණයක්

සංවර්ධන ලොතරැයි මණ්ඩලය (DLB) ජනාධිපති අරමුදල හරහා අධ්‍යාපනය සහ ප්‍රජා කටයුතු සඳහා අරමුදල් සපයයි. සංවර්ධන ලොතරැයි මණ්ඩලය ලොතරැයි නිෂ්පාදන වර්ග දෙකක් පිරිනමයි භෞතික ලොතරැයි සහ ඩිජිටල් ලොතරැයි වම වර්ග දෙකයි. ඩිජිටල් ලොතරැයිය අලෙවි කරනු ලබන්නේ "DLB Sweep" ජංගම යෙදුම හරහා ය.

- දිනුම් ඇදීමේ ක්‍රීඩා - ලොතරැයිය විසින් දිනුම් අදිනු ලබන අංක සමග ක්‍රීඩා ලොතරැයි පතේ ඇති අංක ගැළපීම මගින් මෙම ක්‍රීඩාව සිදු කරනු ලැබේ.
- සූරන ක්‍රීඩා - පූර්වයෙන් තීරණය කරන ලද තෑග්ග තිබේද යන්න හෙළි කර ගැනීම සඳහා කඩදාසි ලොතරැයි පතෙහි ඇති ක්ෂීර ස්තරය සූරා ඉවත් කිරීම මගින් ක්‍රීඩා කරනු ලැබේ.

- **සන්නාම ලැයිස්තුව**

ලග්න වාසනාව	අද කෝටිපති	ශනිදා
සඳුදා / අඟහරුවාදා / බදාදා බ්‍රහස්පතින්දා / සිකුරාදා / සෙනසුරාදා සහ ඉරිදා	සඳුදා / අඟහරුවාදා / බදාදා බ්‍රහස්පතින්දා / සිකුරාදා / සෙනසුරාදා සහ ඉරිදා	සඳුදා / අඟහරුවාදා / බදාදා බ්‍රහස්පතින්දා / සිකුරාදා / සෙනසුරාදා සහ ඉරිදා
SUPER BALL සුපර් බෝල් සුපර් බෝල්	කෝටිපති කප්රුක	සංවර්ධන වාසනාව
සඳුදා / අඟහරුවාදා / බදාදා බ්‍රහස්පතින්දා / සිකුරාදා / සෙනසුරාදා සහ ඉරිදා	අඟහරුවාදා / සිකුරාදා / ඉරිදා	බ්‍රහස්පතින්දා / සෙනසුරාදා
ජයෝදා	සසිරි	සංවර්ධන ක්ෂණික
සඳුදා / බදාදා	බදාදා / සෙනසුරාදා	

01. අද කෝටිපති



- **සන්නාම දැක්ම**

  වෙළඳපොළ ප්‍රමුඛයා වීම සහ ශ්‍රී ලංකාවේ ජනප්‍රිය ලොතරැයිය බවට පත් වීම

- **සන්නාම මෙහෙවර**

  අති නවීනතම තාක්ෂණය යොදා ගනිමින් නව්‍ය ත්‍යාග ව්‍යුහයන් හඳුන්වා දීම සහ එමගින් මණ්ඩලයේ ලාභදායීබව වැඩිදියුණු කිරීම.

- **තරග විස්තර**

  දිනුම් ඇදීමේ දින : සඳුදා සිට ඉරිදා දක්වා (සතියේ දින හත ම)
  ලොතරැයි වර්ණ : රතු, තද නිල්, කොළ, දම්, කහ, රෝස, සහ ලා නිල්
  ආරම්භක ජැක්පොට් ත්‍යාගය : රු. 50,000,000/-
  ක්‍රීඩාව : ඉලක්කම් 04/77, ඉංග්‍රීසි අකුරු 1/26

- **ත්‍යාග ව්‍යුහය**

සංයෝජනය	ත්‍යාගය (රු)
ඕනෑම එක් අංකයක්	රු. 20.00
ඉංග්‍රීසි අකුර	රු. 20.00
ඕනෑම අංක දෙකක්	රු. 100.00
ඕනෑම අංක තුනක්	රු. 1,000.00
අංක හතර	රු. 1,000,000.00
ඉංග්‍රීසි අකුර සමග ඕනෑම අංක එකක්	රු. 40.00
ඉංග්‍රීසි අකුර සමග ඕනෑම අංක දෙකක්	රු. 1,000.00
ඉංග්‍රීසි අකුර සමග ඕනෑම අංක තුනක්	රු. 100,000.00
ඉංග්‍රීසි අකුර සමග අංක හතර	රු. 50,000,000.00

02. ශනිදා වාසනාව



- **සන්නාම දැක්ම**

  සඳුදා සිට ඉරිදා දක්වා (සතියේ දින හතෙහි ම) මාර්ගගත නොවන ලොතරැයි දිනුම් ඇදීම මගින් ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම ලොතරැයි නිෂ්පාදනයක් බවට පත් වීම.

- **සන්නාම මෙහෙවර**

  සතියේ දින හතෙහි ම පවත්වනු ලබන, ශ්‍රී ලංකාවේ මාර්ගගත නොවන ප්‍රමුඛතම ලොතරැයියක් ලෙස අති නවීනතම තාක්ෂණය යොදා ගනිමින් නව්‍ය ත්‍යාග ව්‍යුහයන් හඳුන්වා දීම සහ එමගින් මණ්ඩලයේ ලාභදායී බව වැඩිදියුණු කිරීම.

- **තරග විස්තර**

  දිනුම් ඇදීමේ දින : සඳුදා සිට ඉරිදා දක්වා (සතියේ දින හතම)
  ලොතරැයි වර්ණ : තද නිල්, ලා නිල්, දම්, රතු, තැඹිලි, කොළ සහ රෝස
  ආරම්භක ජැක්පොට් ත්‍යාගය : රු. 30,000,000/-
  ක්‍රීඩාව : ඉලක්කම් 04/75, ඉංග්‍රීසි අකුරු 1/26

- **ත්‍යාග ව්‍යුහය**

සංයෝජනය	ත්‍යාගය (රු)
ඉංග්‍රීසි අකුර	රු. 20.00
ඕනෑම එක් අංකයක්	රු. 20.00
ඕනෑම අංක දෙකක්	රු. 100.00
ඕනෑම අංක තුනක්	රු. 2,000.00
අංක හතර	රු. 1,000,000.00
ඉංග්‍රීසි අකුර සමග ඕනෑම අංක එකක්	රු. 100.00
ඉංග්‍රීසි අකුර සමග ඕනෑම අංක දෙකක්	රු. 1,000.00
ඉංග්‍රීසි අකුර සමග ඕනෑම අංක තුනක්	රු. 100,000.00
ඉංග්‍රීසි අකුර සමග අංක හතර	රු.30,000,000.00

03.කෝටිපති කප්රුක



සන්නාම දැක්ම

ජැක්පොට් ත්‍යාගය දිනා ගැනීමේ අභිලාෂයෙන් පසුවන ජනතාවගේ සිහින සහ අපේක්ෂාවන් ඉටු කර දෙන ලොතරැයිය බවට පත්වීම.

සන්නාම මෙහෙවර

ජැක්පොට් ත්‍යාගය දිනා ගැනීමේ අභිලාෂයෙන් පසුවන ජනතාව ප්‍රියකරන ලොතරැයි නිෂ්පාදන තෝරා ගැනීම බවට පත් වීම.

තරග විස්තර

දිනුම් ඇදීමේ දින : අඟහරුවාදා, සිකුරාදා සහ ඉරිදා
ලොතරැයි වර්ණ : රෝස, කොළ සහ කහ
ක්‍රීඩාව : ඉලක්කම් 04/80, ඉංග්‍රීසි අකුරු 1/26

ත්‍යාග ව්‍යුහය

සංයෝජනය	ත්‍යාගය (රු)
ඕනෑම එක් අංකයක්	රු. 20.00
ඉංග්‍රීසි අකුර	රු. 20.00
ඉංග්‍රීසි අකුර සමග ඕනෑම අංක එකක්	රු. 60.00
ඕනෑම අංක දෙකක්	රු. 100.00
ඉංග්‍රීසි අකුර සමග ඕනෑම අංක දෙකක්	රු. 1,000.00
ඕනෑම අංක තුනක්	රු. 2,000.00
ඉංග්‍රීසි අකුර සමග ඕනෑම අංක තුනක්	රු. 100,000.00
අංක හතර	රු. 1,000,000.00
ඉංග්‍රීසි අකුර සමග අංක හතර	රු. 75,000,000.00

04. ලග්න වාසනාව



සන්නාම දැක්ම

ලග්න සංකේතයෙන් වාසනාව උදා වන්නේ යැයි විශ්වාස කරන ජනතාවගේ අපේක්ෂාවන් ඉටු කරන ප්‍රමුඛතම ලොතරැයි නිෂ්පාදනය බවට පත්වීම

සන්නාම මෙහෙවර

ලග්න සංකේතයෙන් වාසනාව උදා වන්නේ යැයි විශ්වාස කරන ජනතාවගේ බලාපොරොත්තුව වූ ලොතරැයි නිෂ්පාදනය.

තරග විස්තර

දිනුම් ඇදීමේ දින : සඳුදා සිට ඉරිදා දක්වා (සතියේ දින හත ම)
ලොතරැයි වර්ණ : කහ, රතු, කොළ, දුඹුරු, නිල්, ලා නිල්, දම්
ආරම්භක ජැක්පොට් ත්‍යාගය : රු. 2,000,000
ක්‍රීඩාව : ඉලක්කම් 04/62, ලග්න සංකේත 1/12

ත්‍යාග ව්‍යුහය

සංයෝජනය	ත්‍යාගය (රු)
ඕනෑම එක් අංකයක්	රු. 20.00
ලග්න සංකේතයක්	රු. 20.00
ඕනෑම අංක දෙකක්	රු. 100.00
ඕනෑම අංක තුනක්	රු. 1,000.00
අංක හතර	රු. 500,000.00
ලග්න සංකේතය සමග ඕනෑම අංක එකක්	රු. 60.00
ලග්න සංකේතය සමග ඕනෑම අංක දෙකක්	රු. 200.00
ලග්න සංකේතය සමග ඕනෑම අංක තුනක්	රු. 10,000.00
ලග්න සංකේතය සමග අංක හතර	රු. 2,000,000.00

05. සුපර් බෝල්



සන්නාම දැක්ම

ශ්‍රී ලංකාවේ ලොතරැයි වෙළඳපොළ ප්‍රමුඛයා සහ ජනප්‍රිය ලොතරැයියක් බවට පත්වීම

සන්නාම මෙහෙවර

අති නවීනතම තාක්ෂණය යොදා ගනිමින් නව්‍ය ත්‍යාග ව්‍යුහයන් හඳුන්වා දීම සහ එමගින් මණ්ඩලයේ ලාභදායී බව වැඩිදියුණු කිරීම.

තරග විස්තර

දිනුම් ඇදීමේ දින : සඳුදා සිට ඉරිදා දක්වා (සතියේ දින හතම)
ලොතරැයි වර්ණ : දම්, ලා නිල්, තැඹිලි, කොළ, රෝස, තද නිල් සහ රතු
ආරම්භක ජැක්පොට් ත්‍යාගය : රු. 50,000,000
ක්‍රීඩාව : ඉලක්කම් 04/77, ඉංග්‍රීසි අකුරු 1/26

ත්‍යාග ව්‍යුහය

සංයෝජනය	ත්‍යාගය (රු)
ඉංග්‍රීසි අකුර	රු. 20.00
ඕනෑම එක් අංකයක්	රු. 20.00
ඕනෑම අංක දෙකක්	රු. 100.00
ඕනෑම අංක තුනක්	රු. 2,000.00
අංක හතර	රු. 1,000,000.00
ඉංග්‍රීසි අකුර සමග ඕනෑම අංක එකක්	රු. 40.00
ඉංග්‍රීසි අකුර සමග ඕනෑම අංක දෙකක්	රු. 1,000.00
ඉංග්‍රීසි අකුර සමග ඕනෑම අංක තුනක්	රු. 100,000.00
ඉංග්‍රීසි අකුර සමග අංක හතර	රු.50,000,000.00

06. සංවර්ධන වාසනාව



සන්නාම දැක්ම

සංවර්ධන ලොතරැයි මණ්ඩලයට ආදායම් සහ ලාභ උත්පාදනය කර දෙමින්, සුවිශේෂී, විශ්වාසනීය සහ ගෞරවනීය යෝජනා ක්‍රමයක් පිරිනමමින්, දිනුම් අදින දින දෙකෙහි ම ජනප්‍රියතම නිෂ්පාදනයක් බවට පත් වීම.

සන්නාම මෙහෙවර

මණ්ඩලයේ ලාභදායීත්වය වැඩිදියුණු කරමින්, නවීනතම තාක්ෂණය හරහා නව්‍ය ත්‍යාග ව්‍යුහයක් පිරිනමමින්, බ්‍රහස්පතින්දා සහ සෙනසුරාදා දිනවල ශ්‍රී ලංකාවේ ජනප්‍රියතම අන්තර්ජාල නොවන ලොතරැයිය බවට පත්වීම.

ක්‍රීඩාවේ විස්තර

දිනුම් ඇදීමේ දින : බ්‍රහස්පතින්දා / සෙනසුරාදා
ලොතරැයි වර්ණ : නිල් සහ රතු
ආරම්භක ජැක්පොට් ත්‍යාගය : රු. 10,000,000/-
ක්‍රීඩාව : ඉලක්කම් 03/70, දෙවැ අංක 01/09, ඉංග්‍රීසි අකුරු 1/26

ත්‍යාග ව්‍යුහය

සංයෝජනය	ත්‍යාගය (රු)
දෙවැ අංකය	රු. 20.00
ඉංග්‍රීසි අකුර	රු. 20.00
ඕනෑම එක් අංකයක්	රු. 20.00
ඕනෑම අංක දෙකක්	රු. 100.00
ඕනෑම අංක තුනක්	රු. 50,000.00
දෙවැ අංකය සමග ඕනෑම අංක එකක්	රු. 100.00
දෙවැ අංකය සමග ඕනෑම අංක දෙකක්	රු. 500.00
දෙවැ අංකය සමග ඕනෑම අංක තුනක්	රු. 500,000.00
ඉංග්‍රීසි අකුර සමග ඕනෑම අංක එකක්	රු. 100.00
ඉංග්‍රීසි අකුර සමග ඕනෑම අංක දෙකක්	රු. 500.00
ඉංග්‍රීසි අකුර සමග ඕනෑම අංක තුනක්	රු. 100,000.00
දෙවැ අංකය සහ ඉංග්‍රීසි අකුර සමග අංක එකක්	රු. 200.00
දෙවැ අංකය සහ ඉංග්‍රීසි අකුර සමග අංක දෙකක්	රු. 10,000.00
දෙවැ අංකය සහ ඉංග්‍රීසි අකුර සමග අංක තුනක්	රු. 10,000,000.00

07. ජයෝදා



සන්නාම දැක්ම

සංවර්ධන ලොතරැයි මණ්ඩලයට ආදායම් සහ ලාභ උත්පාදනය කර දෙමින්, සුවිශේෂී සහ විශ්වාසනීය යෝජනා ක්‍රමයක් පිරිනමමින් සඳුදා සහ බ්‍රහස්පතින්දා දිනවල ජනප්‍රියතම ලොතරැයි නිෂ්පාදනය බවට පත් වීම.

සන්නාම මෙහෙවර

මණ්ඩලයේ ලාභදායීත්වය වැඩිදියුණු කරමින්, නවීනතම තාක්ෂණය හරහා නව්‍ය ත්‍යාග ව්‍යූහයන් පිරිනමමින්, සඳුදා සහ බදාදා දිනවල ශ්‍රී ලංකාවේ ජනප්‍රියතම ලොතරැයි නිෂ්පාදනය බවට පත්වීම.

තරග විස්තර

දිනුම් ඇදීමේ දින : සඳුදා සහ බදාදා
ලොතරැයි වර්ණ : කහ සහ තැඹිලි
ආරම්භක ජැක්පොට් ත්‍යාගය : රු. 20,000,000
ක්‍රීඩාව : ඉලක්කම් 04/70, ඉංග්‍රීසි අකුරු 1/26

ත්‍යාග ව්‍යූහය

සංයෝජනය	ත්‍යාගය (රු)
ඉංග්‍රීසි අකුර	රු. 20.00
ඕනෑම එක් අංකයක්	රු. 20.00
ඕනෑම අංක දෙකක්	රු. 100.00
ඕනෑම අංක තුනක්	රු. 2,000.00
අංක හතර	රු. 1,000,000.00
ඉංග්‍රීසි අකුර සමග ඕනෑම අංක එකක්	රු. 40.00
ඉංග්‍රීසි අකුර සමග ඕනෑම අංක දෙකක්	රු. 1,000.00
ඉංග්‍රීසි අකුර සමග ඕනෑම අංක තුනක්	රු. 50,000.00
ඉංග්‍රීසි අකුර සමග අංක හතර	රු. 20,000,000.00

08. සසිරි



සන්නාම දැක්ම

ප්‍රමුඛ පෙළේ විද්‍යුත් ලොතරැයි සන්නාමය බවට පත්වීම.

සන්නාම මෙහෙවර

නව්‍ය, අධි තාක්ෂණය හඳුන්වා දීම මගින් මෙතෙක් ප්‍රයෝජනයට නොගත් නව වෙළඳපොළක් නිර්මාණය කිරීම සහ එමගින් මණ්ඩලයේ ලාභදායීත්වය වැඩිදියුණු කිරීම.

තරග විස්තර

දිනුම් ඇදීමේ දින : සෙනසුරාදා සහ බදාදා
ලොතරැයි වර්ණ : නිල් සහ තැඹිලි
ක්‍රීඩාව : ඉලක්කම් 03/50

ත්‍යාග ව්‍යූහය

සංයෝජනය	ත්‍යාගය (රු)
ඕනෑම එක් අංකයක්	රු. 20.00
ඕනෑම අංක දෙකක්	රු. 100.00
ඕනෑම අංක තුනක්	රු. 100,000.00

9. ක්ෂණික දිනුම් ලොතරැයිය



- **හැඳින්වීම**

  ශ්‍රී ලංකාවේ ක්ෂණික ලොතරැයි පුරෝගාමියා ලෙස 1983 වර්ෂයේ දී සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් මුල් වරට ශ්‍රී ලංකාවට ක්ෂණික ලොතරැයියක් හඳුන්වා දෙන ලදී.

  වෙළඳපොළට හඳුන්වා දෙන විට එය මෙරටට නව්‍ය සංකල්පයක් විය.

- **සන්නාම දැක්ම**

  මාර්ගගත නොවන ක්ෂණික දිනුම් ලොතරැයිය හරහා ශ්‍රී ලංකාවේ වෙළඳපොළ ප්‍රමුඛයා බවට පත් වීම.

- **සන්නාම මෙහෙවර**

  ශ්‍රී ලංකාවේ මාර්ගගත නොවන ක්ෂණික දිනුම් ලොතරැයි වෙළඳපොළ ප්‍රමුඛයා ලෙස නවීනතම තාක්ෂණය හරහා නව්‍ය ත්‍යාග ව්‍යූහයන් සහ නව මුහුණුවරක් හඳුන්වා දෙමින් මණ්ඩලයේ ලාභදායීත්වය වැඩිදියුණු කිරීම.

- **තරඟකාරී පසුබිම**

  සංවර්ධන ලොතරැයි මණ්ඩලය ක්ෂණික ලොතරැයි වෙළඳපොළට හඳුන්වා දීමෙන් පසු ජාතික ලොතරැයි මණ්ඩලය විසින් වෙළඳපොළට ක්ෂණික ලොතරැයි දෙකක් හඳුන්වා දෙන ලදී: සෙවන සහ සමෘද්ධි වීම ලොතරැයි දෙක විය.
  සෙවන ලොතරැයිය සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ ක්ෂණික සූරන ලොතරැයියේ සෘජු තරඟකරුවෙක් විය.
  සෙවන ක්ෂණික ලොතරැයිය පැවැත්වීම සඳහා ජාතික ලොතරැයි මණ්ඩලය විසින් කළමනාකරණය කරනු ලබන වෙනම ම ආයතනයක් ස්ථාපනය කරන ලදී. වීම නිසා ජනතාව විය මෙරට තිබෙන ක්ෂණික ලොතරැයි ව්‍යාපාර ආයතනයක් ලෙස පිළිගත්හ.



තිරසාරභාවය පිළිබඳ වාර්තාව

"සංවර්ධන ලොතරැයි මණ්ඩලය වගකීමෙන් යුතු වර්ධනයක් සඳහා කැපවී සිටින අතර, එය ස්වකීය ලොතරැයි නිෂ්පාදන සහ තෑග හරහා ශ්‍රී ලාංකිකයින්ට ක්‍රමයෙන් නියත සහ තිරසාර වටිනාකමක් නිර්මාණය කර දෙයි."

තිරසාරභාවය පිළිබඳ වාර්තාව

පසුගිය දශක තුනක කාලය තුළදී සංවර්ධන ලොතරැයි මණ්ඩලය මූලික වශයෙයෙන් ම තිරසාර ව්‍යාපාරික ආයතනයක් ලෙස පැවත තිබේ. ආරම්භයේ සිටම සංවර්ධන ලොතරැයි මණ්ඩලය හුදෙක් එහි ආසන්නතම පාර්ශ්වකරුවන්ගේ ශුභසිද්ධියට වඩා වැඩි යමක් සැලකිල්ලට ගනිමින් තරගකාරී ව්‍යාපාර ක්‍රමෝපාය සකස් කිරීම සමාජයේ සමස්ත දිගු කාලීන අවශ්‍යතා හා සාරධර්ම සමග නොගැටෙන බව සහතික ලෙස විශ්වාස කරයි. මණ්ඩලයේ තිරසාරභාවය පිළිබඳ වාර්තාව එහි පැතිකඩ, තිරසාරභාවය සඳහා වන උපාය මාර්ග, ආර්ථික වගකීම, සමාජ වගකීම සහ පාරිසරික වගකීම යන ඒවායින් සමන්විත වේ.

සංවර්ධන ලොතරැයි මණ්ඩලය වගකීමෙන් යුතු වර්ධනයක් සඳහා කැපවී සිටින අතර එය ස්වකීය ලොතරැයි නිෂ්පාදන සහ තෑගි හරහා ශ්‍රී ලාංකිකයින්ට ක්‍රමයෙන් නියත සහ තිරසාර වටිනාකමක් නිර්මාණය කර දෙයි. මෙම වාර්තාව මගින් සමාජ, පාරිසරික හා ආර්ථික වගවීම පවත්වා ගැනීම සඳහා සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග අවධාරණය කර ඇත. සංවර්ධන ලොතරැයි මණ්ඩලයෙහි සමාජ වගකීමට ව්‍යාපාරයේ, පාරිභෝගිකයින්ගේ සහ ලොතරැයි ජයග්‍රාහකයින්ගේ ආරක්ෂාව සඳහා ගෙන ඇති වගකීම් සහගත ක්‍රියාමාර්ග මෙන් ම ප්‍රජා සත්කාර වැඩසටහන් ද ඇතුළත් වේ. පාරිසරික වගකීම සාක්ෂාත් කර ගැනීම පිණිස සංවර්ධන ලොතරැයි මණ්ඩලය ස්වකීය ආයතනික ක්‍රියාකාරකම්වල පාරිසරික බලපෑම් අධීක්ෂණය කරමින් පරිසර හිතකාමී ආයෝජන සිදු කරයි. ආර්ථික වගකීම, විනිවිදභාවයෙන් යුතු සහ සමබර වන පාලන ආකෘතියක් බවට ප්‍රතිවරණය වෙයි.

අපගේ මූලික සාරධර්ම

සංවර්ධන ලොතරැයි මණ්ඩලය තෝරා ගෙන ඇති ව්‍යාපාරික ක්ෂේත්‍රය තුළ සුවිශේෂී පාරිභෝගික අත්දැකීමක් සමග කැපවීම, විශ්වාසනීයත්වය සහ නිර්දේශනය ලබා දීම සඳහා මණ්ඩලයට පැහැදිලි අභිලාෂයක් ඇත. මෙම අභිලාෂය සපුරා ලීම සරල දෙයක් නොවන අතර එය බොහෝ දුරට අපි තිරසාර ආකාරයකට වගකීම් සහගත ව්‍යාපාරයක් බවට පත්වෙමින් සිටින බවට සැකයකින් තොරව සනාථ කිරීමට අපිට ඇති හැකියාව මත රඳා පවතියි.

අපගේ කැපවීමෙන් යුතු සහ දැඩි ලෙස උද්යෝගිමත් සේවකයින් සම්බන්ධයෙන් සඳහන් කිරීමේදී, ඔවුන් අපට අති මහත් සහයෝගයක් ලබා දී ඇත. තමන් ද එහි කොටසක් වීම ගැන ඔවුන්ට ආඩම්බර විය හැකි පරිසරයක් නිර්මාණය කිරීමට අපි මහත් සේ වෙහෙසෙන්නේ එහෙයිනි. අපගේ ශ්‍රම බලකායෙහි විශිෂ්ඨත්වය සහ සාර්ථකත්වය දිරිගැන්වීම පිණිස පුහුණුව සහ අඛණ්ඩ අධ්‍යාපනය සඳහා අවස්ථා ලබා දීම මගින් අපි අපගේ සේවක පිරිස සඳහා ආයෝජනය කරන්නේ අපගේ ව්‍යාපාරයේ සාර්ථකත්වය රඳා පවතින්නේ තම රැකියාව පිළිබඳව ඔවුන්ගේ ඇති තෘප්තිමත්භාවය මත වන බව අපි අවබෝධ කර ගෙන සිටින බැවිනි. එමෙන්ම, අපගේ තිරසාරභාවය පිළිබඳ වැඩසටහන මගින් පාරිභෝගික අත්දැකීම් වැඩිදියුණු කිරීමට, කර්මාන්තයේ රැකියා නිර්මාණය කිරීම සහ ජනාධිපති අරමුදලට හා මහපොල හාර අරමුදලට දායකත්වය ලබා දීම තුළින් සෞඛ්‍ය රැකවරණය සහ අධ්‍යාපනය වැනි වැදගත් සේවාවන් සපයා දීමට සහාය වීම සඳහා ආදායම වැඩි කර ගැනීමට අරමුණු කරයි. සංවර්ධන ලොතරැයි මණ්ඩලය ලොතරැයි සපයා දීමේදී පාරිභෝගිකයින් කෙරෙහි වඩාත් නැඹුරුවී සිටින අතර, සේවා සපයන්නන් අධීක්ෂණය කිරීම අඛණ්ඩව සිදු කරයි.

පාරිසරික වගකීම

පරිසරයට වන බලපෑම අවම කිරීම සඳහා අප විසින් දරන ලද ප්‍රයත්නයන් සාර්ථක වී ඇත. සංවර්ධන ලොතරැයි මණ්ඩලය සේවකයින් සඳහා පරිපූර්ණ පුහුණුව, නව්‍ය තාක්ෂණය සහ පාර්ශවකරුවන් සමග සහයෝගීතාවය හරහා ඵලදායී ප්‍රජා සහාය සේවාවන් සපයා දීමට දොරටුවක් විවර කර දෙයි. DLB Sweep App යෙදවුම් හඳුන්වා දීම සහ සසිරි ඊ-ලොතරැයිය හා SMS ලොතරැයි සේවා වැනි නිෂ්පාදන හඳුන්වා දීම මෙම අරමුණුවලට සාක්ෂි වේ. ඩිජිටල්කරණය හරහා සංවර්ධන ලොතරැයි මණ්ඩලය ස්වකීය ගනුදෙනුකරුවන්ගේ පහසුව උදෙසා වැඩි වැඩියෙන් යෙදවුම් සහ ඊ-සේවා හඳුන්වා දෙමින් පෘථිවිය මත කාබන් පියසටහන අවම කිරීමට ඉලක්ක කරයි. අපි පාරිසරික බලපෑම පිළිබඳ සංවර්ධන ලොතරැයි මණ්ඩලයෙහි මෙහෙයුම් වැඩිදියුණු කිරීමට සහ ගනුදෙනුකරුවන් සහ සේවකයින් අතර හරිත දැනුවත්භාවය වැඩි කිරීමට ද අදහස් කරන්නෙමු. මෙම වාර්තාව තුළින් අපි සෑම වර්ෂකදී ම මෙම ක්ෂේත්‍රයන්හි අපි අත් කර ගනිමින් සිටින ප්‍රගතිය පෙන්වා දෙන අතර ඉදිරි වර්ෂය සඳහා අපගේ අරමුණු ද ප්‍රකාශ කරන්නෙමු. සංවර්ධන ලොතරැයි මණ්ඩලය සිය ලොතරැයි නිෂ්පාදන හා ත්‍යාග තුළින් ශ්‍රී ලාංකිකයින්ගේ ජීවිතවලට ස්ථාවර හා තිරසාර වටිනාකමක් නිර්මාණය කරමින් කැපවූ සංවර්ධනයක් කෙරෙහි අවධානය යොමු කරයි. සංවර්ධන ලොතරැයි මණ්ඩලය සමාජ, පාරිසරික සහ මූල්‍ය වගකීම් ඉටු කිරීම සඳහා වැඩපිළිවෙළ ක්‍රියාත්මක කර ඇති බව මෙම ක්‍රියාකාරකම් මගින් අවධාරණය කෙරෙයි. සංවර්ධන ලොතරැයි මණ්ඩලය ස්වකීය ආයතනික ව්‍යායාමයන්හි පාරිසරික බලපෑම් අධීක්ෂණය කරන අතර පාරිසරික වගකීම ඉටුකිරීම පිණිස බලශක්තිය ඉතිරි කිරීමේ ආයෝජන ද සිදු කරයි.

ආයතනික සමාජ වගකීම

අපගේ ආයතනික සමාජ වගකීම් ප්‍රතිපත්ති පදනම් කර ගෙන අපව වටිනා ප්‍රජා සාමාජිකයෙකු ලෙස පිළිගනු ලැබීමට සංවර්ධන ලොතරැයි මණ්ඩලයෙහි අපට අවශ්‍ය ය. එම නිසා අර්ථාන්විත, දිගුකාලීන හවුල්කාරිත්වයන් තුළින් ප්‍රජාවට දායකත්වය සපයා දීමට සහ පාරිසරික වශයෙන් තිරසාර ආකාරයකින් ව්‍යාපාර කටයුතු කර ගෙන යාමට සංවර්ධන ලොතරැයි මණ්ඩලය අවධානය යොමු කරයි. සංවර්ධන ලොතරැයි මණ්ඩලය ශ්‍රී ලංකා රජයට අරමුදල් සපයා දෙමින්, ප්‍රජා සත්කාර සිදු කිරීම, ප්‍රාදේශීය පුණ්‍ය ආයතන සඳහා සහාය දීම සහ ශ්‍රී ලංකාවේ අපගේ ජනතාවගේ ජීවිත පොහොසත් කිරීම සිදු කරයි. ලොතරැයි අලෙවිකරුවන්ගේ සමස්ත දාමයට ම සහාය සපයා දෙමින් පුද්ගලයින්ගේ ව්‍යවසායකත්වය සවිබල ගැන්වීම අරමුණු කර ගත් සමාජ ව්‍යාපාර වැඩසටහන් කිහිපයක් දියත් කිරීමට ද සංවර්ධන ලොතරැයි මණ්ඩලයට හැකි විය.

සේවා නියුක්තිය සවිබල ගැන්වීම සඳහා අප විසින් පහත සඳහන් ක්‍රියාමාර්ග ගෙන ඇත:

- කොවිඩ් සහන සහායයක් ලෙස අලෙවි සහායකයින් අතර රුපියල් මිලියන 40 ක් බෙදා දෙන ලදී.
- අත් ආවරණ (ග්ලවුස්) 37,500 ක් බෙදා දෙන ලදී.
- කොවිඩ් වසංගතය හේතුවෙන් කොළඹ දිස්ත්‍රික්කයේ පීඩාවට පත් ජනතාව අතර රු.මි. 3.2 ක් වටිනා ආහාර බෙදා දෙන ලදී.

අනෙකුත් ආයතනික සමාජ වගකීම් ක්‍රියාකාරකම්

අලෙවි නියෝජිතයින්ගේ විශ්ව විද්‍යාලවලට ඇතුළු වූ දරුවන් සඳහා ශිෂ්‍යත්ව ක්‍රමයක් හඳුන්වා දෙන ලදී. එවැනි ළමයින් 25 දෙනෙකුට මෙම යෝජනා ක්‍රමය යටතේ ප්‍රතිලාභ ලබා දෙන ලදී.

අපගේ සමාජයේ සිටින ආර්ථික දුෂ්කරතා සහිත සිසුන්ට ශිෂ්‍යත්ව ලබා දීම මගින් අපි සිසුන්ගේ ජීවිතවල බලපෑමක් ඇති කිරීම සඳහා අර්ථාන්විත දායකත්වයක් සපයා දී ඇති ආකාරය පිළිබඳ අපගේ ප්‍රතිලාභීන් ජීවමාන සාක්ෂියක් සපයා දෙයි.

මානව සම්පත්

යහපත් ව්‍යාපාරික පිළිවෙත් සංවර්ධනය කිරීමේදී සහ කල් පවත්නා පාරිභෝගික සම්බන්ධතා ගොඩනැගීමේදී අපගේ සේවකයින්ගේ වැදගත් කාර්යභාරය අපි පිළිගැනීමට ලක් කරන්නෙමු. අපි අපගේ සේවකයින්ව ඉතා දැඩි ලෙස අගය කරන අතර, ඔවුන් ලබා දෙන ඉතා වටිනා දායකත්වයන් පිළිබඳ අපගේ ඇගයීම පෙන්නුම් කිරීම සඳහා නව්‍ය, සහයෝගී සහ ආකර්ෂණීය සේවා ස්ථානයක් නිර්මාණය කිරීමට අපි උත්සාහ කරන්නෙමු.

කාර්ය මණ්ඩල සංවර්ධනයෙහි අරමුණු

- රැකියා සහ වෘත්තීය අවස්ථා නිර්මාණය කිරීම හා දිරිමත් කිරීම.
- ශ්‍රම බලකා සැලසුම් කිරීම සහ නිපුණතා කළමනාකරණ වැඩසටහන්, ගුණාත්මක බඳවා ගැනීම් සහ රඳවා ගැනීමේ ක්‍රියාමාර්ග, නායකත්ව සහ අනුප්‍රාප්තික සැලසුම්කරණය සංවර්ධනය කිරීම සහ අඛණ්ඩ අධ්‍යාපනය දැනුම් ලබා දීම අඛණ්ඩව වැඩිදියුණු කිරීම.
- අපගේ සේවකයින්ව සවිබල ගන්වනු ලබන බව සහ ඔවුන්ගේ ජයග්‍රහණ සඳහා ඔවුන්ට දිරිගැන්වීම් ලබා දෙනු ලබන බව සහතික කිරීම.
- සමාගමේ ක්‍රමෝපායික දිශාව පිළිබඳව අපගේ කාර්ය මණ්ඩලය හොඳින් දැනුවත් කර සහ දැන සිටින බව සහතික කිරීම.

දේශීය පුහුණු වැඩසටහන් (කෙටි කාලීන)

පුහුණු වැඩසටහන / වැඩමුළුව	සහභාගීවූවන්ගේ නම්	තනතුර	පුහුණු කාල පරිච්ඡේදය	පුහුණු ආයතනය
ගොඩනැගිලි සඳහා වායු සමනය කිරීමේ පද්ධති සහ යෙදවුම්	ඩී.එන්.එස්.ඒ. රාජපක්ෂ	විදුලි කාර්මික	දින 2	ඉදිකිරීම් උපකරණ පුහුණු මධ්‍යස්ථානය
නව කළමනාකරුවන් සඳහා අත්‍යාවශ්‍ය නිපුණතා		කනිෂ්ඨ කළමණාකරු	දින 2	නිපුණතා සංවර්ධන අරමුදල
ආරක්ෂක සහයකයින්ගේ සහ ආරක්ෂක නිලධාරීන්ගේ රාජකාරි සහ වගකීම් සහ ආචාර ධර්ම	ක්‍රිෂාන්ත ජයමහ මහතා සුජිත් ප්‍රියංකර මහතා ඩොනල්ඩ් දෙනවක මහතා ඒම්.ආර්.පී. උදයකුමාර මහතා නෙවිල් ගුණවර්ධන මහතා රසිකා ජයතිලක මහත්මිය ලක්සිරි ජයසිංහ මහතා මහේෂ් චමීර සමරතුංග මහතා නිශාන්ත අධිකාරී මහතා දුමිඳු මල්ලවාරච්චි මහත මංජුල සිසිරකුමාර මහතා කාමන් සමරතුංග මහතා එච්.පී. තිලකරත්න මහතා	ප්‍රධාන ආරක්ෂක නිලධාරී ආරක්ෂක සහායකයින් 12	දින 1	නිපුණතා සංවර්ධන අරමුදල
විශිෂ්ඨ පාරිභෝගික සේවාවක් සැපයීම		කළමනාකරණ සහාකාර වරුන් 25	පැය 3	ශ්‍රී ලංකා අලෙවිකරණ ආයතනය
ඉසව් කළමනාකරණය	සේපාලිකා ප්‍රේමතිලක මහත්මිය දිනේෂන් ප්‍රියශංගර් මහතා තාරක වික්‍රමසිංහ මහතා	අලෙවිකරණ හා ප්‍රචාරණ නිලධාරී කළමනාකරණ සහකාර	දින 2	නිපුණතා සංවර්ධන අරමුදල
නායකත්වය සහ පෞරුෂ සංවර්ධනය	ඉන්දික උපුල් මහතා චන්ද්‍රා රාජපක්ෂ මහත්මිය චමින්ද කරුණාරත්න මහතා ප්‍රසන්න ගෝකුල මහතා චමිලා තෙවරප්පෙරුම මහත්මිය	කණිෂ්ඨ කළමනාකරුවන්	දින 2	නිපුණතා සංවර්ධන අරමුදල
තොග පාලනය සහ ජාල කළමනාකරණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව	මනෝජිතා සංජීවනී මහත්මිය	කළමනාකරණ සහකාර	දින 5	ඉදිකිරීම් උපකරණ පුහුණු මධ්‍යස්ථානය
පොදු ප්‍රසම්පාදන පිළිබඳ සහතික පත්‍රය	දර්ශි රත්නසේකර මහත්මිය	කළමනාකරණ සහකාර	දින 5	මිලෝද්‍රා

ස්ත්‍රී පුරුෂ සමාජභාවය අනුව විශ්ලේෂණය

පිරිමි කාර්ය මණ්ඩලය	223
කාන්තා කාර්ය මණ්ඩලය	93
එකතුව	316

කාර්ය මණ්ඩල වයස් විශ්ලේෂණය

වයස් කාණ්ඩය	කාර්ය මණ්ඩල සාමාජිකයින් සංඛ්‍යාව
20-30	54
30-40	120
40-50	89
50 ට වැඩි	53
	316

කාණ්ඩය අනුව කාර්ය මණ්ඩලය

සභාපති / ප්‍රධාන විධායක නිලධාරී	1
සාමාන්‍යාධිකාරී	1
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී	2
සහකාර සාමාන්‍යාධිකාරී	8
අභ්‍යන්තර විගණක	1
පරිපාලන නිලධාරී	1
ප්‍රධාන ආරක්ෂක නිලධාරී	1
කලාප කළමනාකරු	9
ගිණුම් නිලධාරී	4
පද්ධති විශ්ලේෂක	1
මානව සම්පත් නිලධාරී	1
ප්‍රසම්පාදන නිලධාරී	1
ප්‍රවාහන නිලධාරී	1
අලෙවි හා ප්‍රචාරණ නිලධාරී	1
ප්‍රාදේශීය අලෙවි ප්‍රවර්ධන සහායක	16
තො.තා. සහායක	2
මාධ්‍ය හා මහජන සම්බන්ධතා සහකාර	1
ප්‍රධාන කළමනාකරණ සහකාර	1
කළමනාකරණ සහකාර	129
අලෙවි සම්බන්ධීකාරක	3
රියදුරු	44
විදුලි කාර්මික	2
කාර්යාල කාර්ය සහායක	60
ක්ෂේත්‍ර ප්‍රවර්ධක	9
ක්ෂේත්‍ර ජංගම නිවේදක	1
ආරක්ෂක සහායක	15
	316

2020.12.31 දිනට සේවක සංඛ්‍යා තත්වය

තනතුර		අනුමත සේවක සංඛ්‍යාව	සිටින සේවක සංඛ්‍යාව	පුරප්පාඩු	අතිරික්තය
සභාපති/ ප්‍රධාන විධායක නිලධාරී		1	1		
ක්‍රියාකාරී අධ්‍යක්ෂ		1		1	
සාමාන්‍යාධිකාරී	H.M - 2.1	1	1		
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අලෙවි)	H.M - 1.1	1	1		
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල්)	H.M - 1.1	1	1		
සහකාර සාමාන්‍යාධිකාරී (අලෙවි)	M.M-1.1	2	2		
සහකාර සාමාන්‍යාධිකාරී (මුදල්)	M.M- 1.1	3	2	1	
සහකාර සාමාන්‍යාධිකාරී (විකුණුම්)	M.M- 1.1	2	1	1	
සහකාර සාමාන්‍යාධිකාරී (මා.ස.ක./පරිපාලන)	M.M- 1.1	1	1		
සහකාර සාමාන්‍යාධිකාරී කළමනාකරු (ප්‍රසම්පාදනය)	M.M- 1.1	1	1		
සහකාර සාමාන්‍යාධිකාරී (තොරතුරු තාක්ෂණ)	M.M- 1.1	1	1		
අභ්‍යන්තර විගණක	M.M- 1.1	1	1		
පරිපාලන නිලධාරී	J.M- 1.1	1	1		
ප්‍රධාන ආරක්ෂක නිලධාරී	J.M- 1.1	1	1		
ප්‍රවාහන නිලධාරී	J.M- 1.1	1	1		
කලාප කළමනාකරු	J.M- 1.1	10	9	1	
ගිණුම් නිලධාරී	J.M- 1.1	4	4		
පද්ධති/වැඩසටහන් විශ්ලේෂක	J.M- 1.1	1	1		
ප්‍රසම්පාදන නිලධාරී	J.M- 1.1	1	1		
මානව සම්පත් නිලධාරී	J.M- 1.1	1	1		
අලෙවි හා ප්‍රචාරණ නිලධාරී	J.M- 1.1	1	1		
අලෙවි ප්‍රවර්ධන සහකාර	MA - 3	24	16	8	
තත්ත්ව පාලන සහකාර	MA - 3	1		1	
තොරතුරු තාක්ෂණ සහකාර	MA - 3	4	2	2	
මාධ්‍ය හා මහජන සම්බන්ධතා සහකාර	MA-3	1	1		
ගිණුම් සහකාර	M.A-2.2	2	0	2	
ප්‍රධාන කළමනාකරණ සහකාර	MA-1.2	1	1		
පුද්ගලික සහකාර	MA-1.2	1		1	
කළමනාකරණ සහකාර	MA-1.2	137	129	8	
විකුණුම් සම්බන්ධීකාරක	MA-1.1	5	3	2	
රියදුරු	P.L - 3	43	44		1
විදුලි කාර්මික	P.L -3	2	2		
කාර්යාල කාර්ය සහායක	P.L -1	65	60	5	
ක්ෂේත්‍ර ප්‍රවර්ධක	P.L -1	10	9	1	
ක්ෂේත්‍ර ජංගම රථ නිවේදක	P.L -1	6	1	5	
ආරක්ෂක සහකාර	P.L -1	3	15		12
එකතුව		342	316	39	13

ආයතනික පාලනය

ආයතනික පාලන පද්ධතිය සංවර්ධන ලොතරැයි මණ්ඩලයට තීරණ ගැනීම සඳහා වන පරිචයන් සහ මගපෙන්වීමේ ප්‍රතිපත්ති නිර්වචනය කර දෙන අතර ම, මණ්ඩලයෙහි දිගු කාලීන අරමුණු සහ උපාය මාර්ගික සැලසුම් වලට මග පෙන්වයි. ආයතනික පාලන ආකෘතිය මගින් සංවර්ධන ලොතරැයි මණ්ඩලයෙහි විවිධ මට්ටම් අතර, විශේෂයෙන් ම පාලනයෙහි මට්ටම් අතර, එනම් අධ්‍යක්ෂ මණ්ඩල සහ විධායක කළමනාකරණ මට්ටම් අතර බලතල සහ වගකීම බෙදී යන ආකාරය සංක්ෂිප්තව දක්වා ඇත. අධ්‍යක්ෂ මණ්ඩලය සමාගමේ ආයතනික ප්‍රතිපත්ති ස්ථාපනයක කරන අතර, තම ව්‍යාපාරයේ මනා ක්‍රියාකාරිත්වය සඳහා වගකිව යුතු පුද්ගලයින් වන ප්‍රධාන විධායක නිලධාරිට සහ විධායක නිලධාරීන්ට ක්‍රමෝපායික මග පෙන්වීමක් සපයා දෙයි.

සංවර්ධන ලොතරැයි මණ්ඩලය 1997 අංක 20 දරණ සංවර්ධන ලොතරැයි මණ්ඩල පනත මගින් පාලනය වේ. එම පනතෙහි 3(i) වගන්තිය මගින් මණ්ඩලයේ ව්‍යුහය පහත සඳහන් පරිදි දක්වා ඇත:

(අ). පහත සඳහන් නිල බලයෙන් පත්වන සාමාජිකයින්:

(i) මහපොළ උසස් අධ්‍යාපන ඝිෂ්‍යත්ව භාර අරමුදලෙහි සභාපති හෝ ඔහුගේ නියෝජිතයා.
(ii) ජනාධිපති ලේකම් හෝ ඔහුගේ නියෝජිතයා.
(iii) අමාත්‍යවරයාගේ අමාත්‍යංශයේ ලේකම් හෝ ඔහුගේනියෝජිතයා.

(ආ). අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන තවත් සාමාජිකයින් දෙදෙනෙක්.

අමාත්‍යවරයා විසින් මණ්ඩලයේ සභාපතිවරයා පත් කළ යුතු අතර, මණ්ඩලයේ ප්‍රධාන විධායක නිලධාරියා ද වන එම සභාපතිවරයා මණ්ඩලයේ කටයුතු පරිපාලනය හා කළමනාකරණය සම්බන්ධයෙන් වගකිව යුතු වන්නේය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්යභාරය

රජයේ ප්‍රතිපත්තිවලට අනුකූලව අධ්‍යක්ෂ මණ්ඩලය ආයතනයේ කාර්යක්ෂම කළමනාකරණය සම්බන්ධයෙන් වගකිව යුතු වන්නේය. සියලු ව්‍යවස්ථාපිත හා අනෙකුත් කළමනාකරණ නියාමන අවශ්‍යතාවයන්ට අනුකූලව වන අතර ම, සම්පත් ආරක්ෂා කිරීම, ප්‍රමාණවත් පරිදි ගිණුම් පවත්වා ගැනීම සහ නිවැරදි වාර්තා සම්පාදනය කිරීම සහතික කරමින් මෙය සාක්ෂාත් කරගත යුතුය.

එබැවින් අධ්‍යක්ෂ මණ්ඩලය පහත සඳහන් දෑ සහතික කළ යුතුය:

- සංවිධානයේ උපායමාර්ගික අරමුණු ක්‍රියාත්මකව පවතින බව සහතික කිරීම
- උපායමාර්ගික අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා නායකත්වය ලබා දීම
- ඵලදායී අභ්‍යන්තර පාලනයක් සහ අවදානම් කළමනාකරණ පද්ධතියක් ක්‍රියාත්මක වන බවට සහතික කිරීම
- ආයතන කළමනාකරණ කටයුතු ඵලදායී ලෙස අධීක්ෂණය කිරීම
- නීතිපතා වන පදනමකින් අවශ්‍ය කරනු ලබන මූල්‍ය අංග සහ අනාවරණයන් පිළිබඳව ප්‍රමාණවත් ලෙස කොටස් හිමියන් වෙත වාර්තා කිරීම.
- සම්පත් සහ වත්කම් වගකීමෙන් යුතුව භාවිතා කිරීම
- විගණන කමිටුව සහ අනෙකුත් කමිටු පත් කිරීම; සහ චර්යාධර්ම හා ආචාර ධර්ම පද්ධතියක් සහ ආයතනික පාලන උපාය මාර්ගයක් හඳුන්වා දීම
- අදාළ අණ පනත්, මාර්ගෝපදේශ සහ චක්‍රලේඛ ආදිය ප්‍රකාරව ඔවුන්ගේ සියලු ක්‍රියාමාර්ග සඳහා වගකිව යුතු වීම.
- අවම වශයෙන් වාර්ෂිකව හෝ ප්‍රධාන විධායක නිලධාරී සහ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කාර්ය මණ්ඩලය පිළිබඳ ඇගයීමක් කිරීම.

අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්

ආයතනික මෙහෙයුම් සහ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වල ප්‍රතිඵල අයවැය සහ අදාළ ප්‍රමිතීන්ට අනුකූලව දැඩි ලෙස හා නිරන්තරයෙන් අධීක්ෂණය කරනු ලැබේ. අධ්‍යක්ෂ මණ්ඩලයේ අවධානය සවිස්තරාත්මකව අවශ්‍ය කරන අනෙකුත් කාරණා සමග සම්මත න්‍යාය පත්‍රයක් අනුගමනය කරනු ලැබේ. අධ්‍යක්ෂ මණ්ඩලය මසකට වරක් රැස් වන අතර අවශ්‍ය ඕනෑම අවස්ථාවක විශේෂ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පවත්වනු ලැබේ.

සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ කමිටු

1. කළමනාකරණ කමිටුව
2. විගණන හා කළමනාකරණ කමිටුව
3. ටෙන්ඩර් මණ්ඩල කමිටුව
4. සේවක මණ්ඩල සුභසාධන කමිටුව
5. ප්‍රචාරණ කමිටුව
6. සංවර්ධන ලොතරැයි මණ්ඩල සංස්කෘතික හා කලා සංගමය

අනුකූලතා නිලධාරී

නියාමන හා ව්‍යවස්ථාපිත නියමයන්ට සහ මණ්ඩල පාලන නීති සහ රෙගුලාසි වලට අනුකූල වීම සහතික කිරීම පිණිස මූල්‍ය අංශ ප්‍රධානී, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල්), විසින් අනුකූලතා නිලධාරියාව නියෝජනය කරනු ලබයි.

කළමණාකාරිත්වය

මණ්ඩලයේ එදිනෙදා මෙහෙයුම් කටයුතු සභාපති හා ප්‍රධාන විධායක නිලධාරීගේ ඉහළ කළමනාකරණ සහ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කණ්ඩායම් වෙත පවරා තිබේ. අවදානම් සහ අවස්ථාවන් හඳුනා ගනු ලබන බව සහ නියමිත වේලාවට අවශ්‍ය පියවර ගනු ලබන බවත්, ඉලක්ක සපුරා ගැනීම සඳහා අයවැය සකස් කරනු ලබන බවත් එම කණ්ඩායම් විසින් සහතික කරනු ලබයි.

අධ්‍යක්ෂ මණ්ඩලය සහ පවත්වන ලද රැස්වීම් සංඛ්‍යාව - 2020

රැස්වීමෙහි දිනය	අධ්‍යක්ෂවරයාගේ නම	තනතුර	පැමිණීම
14.02.2020	ජගත් පී. විජේවීර මහතා	සභාපති/ප්‍ර.වි.නි.	☑
	එච්.ජී. සුමනසිංහ මහතා	අධ්‍යක්ෂ	☑
	අනුර දිසානායක මහතා	අධ්‍යක්ෂ	නොපැමිණි
	ජෙනට් ජයවර්ධන මහත්මිය	අධ්‍යක්ෂ	☑
27.02.2020	ජගත් පී. විජේවීර මහතා	සභාපති/ප්‍ර.වි.නි.	☑
	එච්.ජී. සුමනසිංහ මහතා	අධ්‍යක්ෂ	☑
	අනුර දිසානායක මහතා	අධ්‍යක්ෂ	☑
	ජෙනට් ජයවර්ධන මහත්මිය	අධ්‍යක්ෂ	☑
30.04.2020	ජගත් පී. විජේවීර මහතා	සභාපති/ප්‍ර.වි.නි.	☑
	එච්.ජී. සුමනසිංහ මහතා	අධ්‍යක්ෂ	☑
	අනුර දිසානායක මහතා	අධ්‍යක්ෂ	☑
	ජෙනට් ජයවර්ධන මහත්මිය	අධ්‍යක්ෂ	☑
22.06.2020	ජගත් පී. විජේවීර මහතා	සභාපති/ප්‍ර.වි.නි.	☑
	එච්.ජී. සුමනසිංහ මහතා	අධ්‍යක්ෂ	☑
	අනුර දිසානායක මහතා	අධ්‍යක්ෂ	☑
	ජෙනට් ජයවර්ධන මහත්මිය	අධ්‍යක්ෂ	නොපැමිණි
28.07.2020	ජගත් පී. විජේවීර මහතා	සභාපති/ප්‍ර.වි.නි.	☑
	එච්.ජී. සුමනසිංහ මහතා	අධ්‍යක්ෂ	☑
	අනුර දිසානායක මහතා	අධ්‍යක්ෂ	☑
	රවින්ද්‍ර ජේ. විමලවීර මහතා	අධ්‍යක්ෂ	☑
	ජෙනට් ජයවර්ධන මහත්මිය	අධ්‍යක්ෂ	නොපැමිණි
02.09.2020	එච්.ජී. සුමනසිංහ මහතා	අධ්‍යක්ෂ / වැ.බ. සභාපති	☑
	රවින්ද්‍ර ජේ. විමලවීර මහතා	අධ්‍යක්ෂ	☑
	ජෙනට් ජයවර්ධන මහත්මිය	අධ්‍යක්ෂ	☑
19.10.2020	එච්.ජී. සුමනසිංහ මහතා	අධ්‍යක්ෂ / වැ.බ. සභාපති	☑
	ජේ.එම්. භද්‍රානි ජයවර්ධන මහත්මිය	අධ්‍යක්ෂ	☑
	රවින්ද්‍ර ජේ. විමලවීර මහතා	අධ්‍යක්ෂ	☑
	ජෙනට් ජයවර්ධන මහත්මිය	අධ්‍යක්ෂ	☑
28.10.2020	එච්.ජී. සුමනසිංහ මහතා	අධ්‍යක්ෂ / වැ.බ. සභාපති	☑
	ජේ.එම්. භද්‍රානි ජයවර්ධන මහත්මිය	අධ්‍යක්ෂ	☑
	රවින්ද්‍ර ජේ. විමලවීර මහතා	අධ්‍යක්ෂ	☑
	ජෙනට් ජයවර්ධන මහත්මිය	අධ්‍යක්ෂ	☑
09.12.2020	එච්.ජී. සුමනසිංහ මහතා	අධ්‍යක්ෂ / වැ.බ. සභාපති	☑
	ජේ.එම්. භද්‍රානි ජයවර්ධන මහත්මිය	අධ්‍යක්ෂ	☑
	රවින්ද්‍ර ජේ. විමලවීර මහතා	අධ්‍යක්ෂ	☑
	ජෙනට් ජයවර්ධන මහත්මිය	අධ්‍යක්ෂ	☑
31.12.2020	අමිත ගමගේ මහතා	සභාපති/ප්‍ර.වි.නි.	☑
	එච්.ජී. සුමනසිංහ මහතා	අධ්‍යක්ෂ	☑
	ජේ.එම්. භද්‍රානි ජයවර්ධන මහත්මිය	අධ්‍යක්ෂ	නොපැමිණි
	රවින්ද්‍ර ජේ. විමලවීර මහතා	අධ්‍යක්ෂ	☑
	ජෙනට් ජයවර්ධන මහත්මිය	අධ්‍යක්ෂ	☑

අවදානම් කළමනාකරණ වාර්තාව

ඵලදායී අවදානම් කළමනාකරණය සංවර්ධන ලොතරැයි මණ්ඩලයෙහි ව්‍යාපාර ක්‍රියාවලියේ ප්‍රධාන සාධකයකි. අපගේ ව්‍යාපාරයෙහි අවදානම් සහ ප්‍රතිඵල අතර උචිත සමතුලිතතාවයක් ඇති කර ගැනීමට සහ පාලිත පරිසරයක් තුළ අපගේ වර්ධන සැලසුම් ක්‍රියාත්මක කිරීමට උපකාරී වන අවදානම් කළමනාකරණ හැකියාවන් අඛණ්ඩව වැඩි දියුණු කර ගැනීමට අපි උත්සාහ කරන්නෙමු. අවදානම් කළමනාකරණය සංවර්ධන ලොතරැයි මණ්ඩලයෙහි මෙහෙයුම් ව්‍යුහයේ ප්‍රධානතම අංගයක් වේ. මුහුණ දීමට සූදානම්ව සිටින අවදානම් මට්ටම් ඇතුළත අවදානම් නිරාවරණයවීම් කළමනාකරණය කිරීම මගින් ඉපැයීම්වල සහ ප්‍රාග්ධනයෙහි අහිතකර විචලනයන් සීමා කර ගැනීමට අපි උත්සාහ කරන්නෙමු.

අවදානම් හඳුනා ගැනීම සහ අවම කිරීම සඳහා වගකීම් සහගත ප්‍රවේශයක් සංවර්ධන ලොතරැයි අවදානම් කළමනාකරණ පද්ධතියට ඇතුළත් වේ. අවදානම් දැනුවත් කිරීමේ චර්යාවන්ට සහාය දෙන ශක්තිමත් අවදානම් කළමනාකරණ සංස්කෘතියක් නිර්මාණය කිරීම සහ එමගින් අවදානම් මත පදනම්ව තීරණ ගැනීමට අනුබලය දීම අපගේ ප්‍රධාන අවධානය වී තිබේ. සංවර්ධන ලොතරැයි මණ්ඩලයෙහි දිගුකාලීන තිරසාර බව සහතික කිරීම සඳහා අපි අපගේ අවදානම් උපාය මාර්ග තවදුරටත් වැඩිදියුණු කරන්නෙමු.

සංවර්ධන ලොතරැයි මණ්ඩලයෙහි අවදානම් කළමනාකරණ උපායමාර්ගය විශේෂිත පාර්ශ්වකරුවන්, කළමනාකරුවන් සහ අධ්‍යක්ෂ මණ්ඩල සඳහා ප්‍රතිපෝෂණ ක්‍රමවේදයක් ලෙස ක්‍රියාත්මක වේ. මණ්ඩලයේ ව්‍යාපාර, මෙහෙයුම්, පද්ධති සහ සේවාවන් සඳහා දැනුවත්භාවයෙන් යුතු තීරණ ගැනීමේ උපාය මාර්ගික කේන්ද්‍රයක් ලෙස එයට හිමි වන තත්ත්වයෙන් එය සුවිශේෂී වේ. මෙය පහත සඳහන් දෑ හරහා ව්‍යාපාර අවදානම්වලට ආමන්ත්‍රණය කිරීම සඳහා උපායමාර්ගික සහ ව්‍යාපාර සැලසුම්කරණයට, ව්‍යාපෘති කළමනාකරණයට සහ ව්‍යාපාර ක්‍රියාවලි මට්ටම්වලට ස්ථාවර ප්‍රවේශයක් සපයා දෙයි:

- ව්‍යාපාර කාර්යයන් සහ ඒකක පුරා ඇති අවදානම් පිළිබඳ පොදු අවබෝධයක් ලබා දීම
- වැඩිදියුණු වූ ප්‍රමුඛතා නියම කර ගැනීම සහ තීරණ ගැනීම සඳහා පහසුකම් සැලසීම පිණිස කළමනාකරණයට අඛණ්ඩ අවදානම් තක්සේරුවක් සපයා දීම
- සේවක දැනුවත්භාවය සහ කළමනාකරණ වගකීම් වැඩි කිරීම

සංවර්ධන ලොතරැයි මණ්ඩලය පහත සඳහන් කර ඇති පරිදි විශේෂිත අවදානම් සමූහයකට යටත් වේ:

ත්‍යාග මුදල් ගෙවීමේ අවදානම

සෑම තොග මට්ටමකදී ම ත්‍යාගවල සම්මත ගෙවීම් අනුපාතයක් පවත්වා ගත යුතුය. අවදානම විය හැක්කේ මුදල් ප්‍රවාහයට බලපෑ හැකි සිදුවීම් ඇතිවීමේ හැකියාව නිසා වැඩි මිල අනුපාතයක් තිබිය හැකි වීමයි. ඉහත සඳහන් කළ අවදානම ආවරණය කිරීම සඳහා සංවර්ධන ලොතරැයි මණ්ඩලය මුද්‍රණ ආයතන වලින් රක්ෂණ ආවරණයක් ද ලබා ගනියි.

ආර්ථික අවදානම

සංවර්ධන ලොතරැයි මණ්ඩලයෙහි ගනුදෙනුකරුවන්ගේ මිලදී ගැනීමේ රටාවන් රටෙහි පවතින සමාජ-ආර්ථික හා දේශපාලන වෙනස්කම් වල අනුබලය මත පදනම් වේ.

මූල්‍ය අවදානම

අකාර්යක්ෂම මුදල් ප්‍රවාහ කළමනාකරණය හා මූල්‍ය තොරතුරු සම්බන්ධ අවදානම් මගින් ආයතනවල ලාභදායීත්වයට හා ඵලදායීතාවයට හානි ගෙන දිය හැකියි. සංවර්ධන ලොතරැයි මණ්ඩලය නිසි රක්ෂණ ආවරණයක් සහතික කිරීම සහ ආයතනය පුරා පිරිවැය පාලන උපාය මාර්ග සම්බන්ධීකරණය කිරීම වැනි සාම්ප්‍රදායික මූල්‍ය අවදානම් කළමනාකරණ පිළිවෙත් භාවිතා කරයි.

ද්‍රවශීලතා අවදානම

ඉහළ මට්ටමේ ත්‍යාග වේලාසනින් උපයා ගැනීම මගින් ද්‍රවශීලතා අවදානම් ඇති විය හැකිය. මෙම අවදානම අවම කිරීම පිණිස සංවර්ධන ලොතරැයි මණ්ඩලය ඉහළ මුදල් වත්කම් පවත්වාගෙන යයි. සංවර්ධන ලොතරැයි මණ්ඩලය නුබුන්වත් වුව ද, මණ්ඩලය ගෙවීමට බැඳී සිටින ගෙවීම් ගෙවිය යුතු අවස්ථාව වන විට ඒවා ගෙවීම සඳහා ප්‍රමාණවත් තරම් මුදල් සම්පත් පවත්වාගෙන යාමට හෝ උත්පාදනය කිරීමට නොහැකි නම්, හෝ එසේ ගෙවීමට හැක්කේ සැලකිය යුතු ලෙස අවාසිදායක තත්ත්වයන් යටතේ පමණක් නම් ද්‍රවශීලතා අවදානම් පැන නගියි.

මෙහෙයුම් අවදානම

පද්ධති ඇනහිටීම්, පුද්ගලයින් අතින් සිදුවිය හැකි දෝෂ, සාපරාධී ක්‍රියාකාරකම් හෝ අභ්‍යන්තර පද්ධතිමය බිඳවැටීම් හේතුවෙන් සිදු විය හැකි පාඩු මෙහෙයුම් අවදානම් වලට අයත් වේ. එවැනි තත්වයන් මගින් පාරිභෝගික විශ්වාසයට හා ආයතනික ප්‍රතිරූපයට හානි සිදු විය හැකිය. මෙහෙයුම් අවදානම අවම කිරීම පිණිස සංවර්ධන ලොතරැයි මණ්ඩලය නිරතුරුව ම අභ්‍යන්තර පාලනයන් වැඩි දියුණු කරයි. ආයතනික අවදානම මගින් ඇති වන තර්ජනය අවම කිරීම සඳහා සංවර්ධන ලොතරැයි මණ්ඩලයෙහි කළමනාකාරිත්වය විසින් මෙහෙයුම් ඒකක, ව්‍යාපාර ක්‍රියාවලි සහ මහා පරිමාණ ඒකක පිළිබඳ නිරන්තර අවදානම් තක්සේරු කිරීම් සිදු කරනු ලබයි.

ව්‍යාපාර අවදානම

ව්‍යාපාර අවදානම උපායමාර්ගික සහ/හෝ කීර්තිනාම හේතූන් නිසා ඇති වන පිරිවැය පදනමට සාපේක්ෂව ඇති විය හැකි ආදායම් හිඟයට අදාළ වේ. අනෙකුත් අමතර කරුණු අතර, බාහිර සාර්ව ආර්ථික පරිසරය, සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් තෝරාගනු ලබන උපායමාර්ගය සහ මණ්ඩලය ක්‍රියාත්මක වන වෙළඳපොළ තුළ එයට ඇති කීර්තිනාමය මණ්ඩලයෙහි ආදායම් උත්පාදන හැකියාව කෙරෙහි බලපායි.

කීර්තිනාම අවදානම

පාර්ශ්වකරුවන් අතර සංවර්ධන ලොතරැයි මණ්ඩලයෙහි ප්‍රතිරූපයට හානි සිදු වීම හේතුවෙන් කීර්තිනාම අවදානම ඇති විය හැකි අතර, එමගින් ව්‍යාපාර රඳවා තබා ගැනීමට සහ උත්පාදනය කිරීමට ඇති හැකියාව අඩපණ කරයි. විශ්වාසය, පැහැදීම හෝ ව්‍යාපාරික සම්බන්ධතාවය බිඳවැටීමෙන් එවැනි හානියක් සිදුවිය හැකිය.
සංවර්ධන ලොතරැයි මණ්ඩලය දෘශ්‍ය මාධ්‍ය සහ මහජන බැඳියාව මත විශ්වාසය තබා සිටීම මගින් මණ්ඩලය සැලකිය යුතු කීර්තිනාම පාඩු අවදානමකට ලක් වෙයි. මෙම අවදානම අවම කිරීම පිණිස සංවර්ධන ලොතරැයි මණ්ඩලය මහජන බැඳියාව රඳවා ගැනීම සඳහා ඵලදායී අලෙවිකරණ ව්‍යාපාර ක්‍රියාත්මක කරන අතර දැඩි පද්ධතික විනිවිදභාවයක් අනුගමනය කරමින් කටයුතු කරයි.

නීති අවදානම

සංවර්ධන ලොතරැයි මණ්ඩලයට එරෙහිව ගනු ලැබිය හැකි අනාගත නීතිමය ක්‍රියාමාර්ග වලින් ආරක්ෂා වීමට අපොහොසත් වීම නීතිමය හානි සිදුවීමේ අවදානම වැඩි කරයි. සංවර්ධන ලොතරැයි මණ්ඩලය පිළිගත් නීති වෘත්තිකයන්ගේ උපදෙස් ලබා ගෙන එවැනි ක්‍රියාමාර්ග අවම කිරීම සඳහා සුදුසු පියවර ගෙන තිබේ.

තොරතුරු තාක්ෂණ අවදානම

තොරතුරු තාක්ෂණ පද්ධතිය මගින් ලබා ගන්නා නිශ්චිත හා කාලෝචිත තොරතුරු සංවර්ධන ලොතරැයි මණ්ඩලයෙහි මෙහෙයුම් ක්‍රියාවලියේ මූලික ම අංගයක් වේ. සංවර්ධන ලොතරැයි මණ්ඩලය ස්වකීය තොරතුරු තාක්ෂණ පද්ධතිය වැඩිදියුණු කිරීම සඳහා ක්‍රියාකාරී සැලැස්මක් දියත් කර ඇත.

විගණන හා කළමනාකරණ කමිටු වාර්තාව

2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය සඳහා වන අපගේ වාර්තාව අපි සතුටින් ඉදිරිපත් කරන්නෙමු.

විගණන කමිටුවේ සංයුතිය

විගණන කමිටුව පහත සඳහන් විධායක නොවන අධ්‍යක්ෂවරුන් හතර දෙනා (04) ගෙන් සමන්විත වේ.

1. එච්.ජී. සුමනසිංහ මයා	විගණන හා කළමනාකරණ කමිටුවේ සභාපති
2. රවීන්ද්‍ර විමලවීර මයා	විගණන හා කළමනාකරණ කමිටුවේ සාමාජික
3. ජෙනට් ජයවර්ධන මහත්මිය	විගණන හා කළමනාකරණ කමිටුවේ සාමාජික
4. ජේ.එම්. හද්‍රානි ජයවර්ධන මහත්මිය	විගණන හා කළමනාකරණ කමිටුවේ සාමාජික

සාමාන්‍යාධිකාරී, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - අලෙවිකරණ , නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - මූල්‍ය, අභ්‍යන්තර විගණක, සහකාර සාමාන්‍යාධිකාරී - මානව සම්පත් හා පරිපාලන සහ අනෙකුත් අදාළ නිලධාරීන් මෙම රැස්වීම් වලට සහභාගී වීම අනිවාර්ය වේ. විගණකාධිපති දෙපාර්තමේන්තුවේ විගණන අධිකාරී මෙම කමිටුවේ නිරීක්ෂකයෙකු ලෙස රැස්වීම්වලට සහභාගී වේ.

විගණන කමිටුවේ කාර්යභාරය

පාර්ශ්වකරුවන්ගේ බැඳියාව සහ මණ්ඩලය සතු වත්කම් ආරක්ෂා කර ගැනීම සඳහා සංවර්ධන ලොතරැයි මණ්ඩලයට ශක්තිමත් අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් පවත්වා ගත යුතු වේ. මුදල් අමාත්‍යාංශය සහ අදාළ බලධාරීන් විසින් නිකුත් කර ඇති මාර්ගෝපදේශ ද කමිටුව විසින් අනුගමනය කරනු ලබයි. 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය තුළ දී විගණන කමිටුව විසින් එහි ප්‍රධාන වගකීම් වලට අදාළව සිදු කරන ලද ක්‍රියාකාරකම් පිළිබඳ සාරාංශයක් පහත දක්වා ඇත.

1. වාර්ෂික මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීමට පෙර එම ප්‍රකාශනවල අනුකූලතාවය සහ සම්පූර්ණ බව පරීක්ෂා කර බැලීම සහ ඒවායෙහි අඩංගු වැදගත් මූල්‍ය වාර්තාකරණ විනිශ්චයන් සමාලෝචනය කිරීම. ගිණුම්කරණ ප්‍රතිපත්ති, සටහන් සහ පරිචයන්, විනිශ්චයකිරීම අවශ්‍ය කරන ප්‍රධාන අංශ සහ නෛතික හා නියාමන අවශ්‍යතා වලට අනුකූල වීම සමාලෝචනය කිරීම මෙයට ඇතුළත් වේ. මූල්‍ය ප්‍රකාශන විගණනය කිරීමෙන් සොයාගත් කරුණු සමාලෝචනය කිරීමෙහි කොටසක් ලෙස විගණන කමිටුව මෙම කරුණු විගණකාධිපති දෙපාර්තමේන්තුවෙහි නියෝජිත සමග සාකච්ඡා කළේය.

2. අනුමත වාර්ෂික විගණන සැලැස්මට අනුකූලව වරින් වර සිදු කරන ලද අභ්‍යන්තර විගණන පිළිබඳ කාලීන විගණන වාර්තා අභ්‍යන්තර විගණක විසින් ඉදිරිපත් කරනු ලැබේ. මෙම අභ්‍යන්තර විගණන වාර්තා මගින් මණ්ඩලයේ ක්‍රියාත්මකව පවතින පද්ධති හා ක්‍රියා පටිපාටිවල ඇති අඩුපාඩු අවධාරණය කර පෙන්වා දෙන අතර, නිර්දේශ ක්‍රියාත්මක කිරීම පිළිබඳ සාකච්ඡා කිරීමෙන් අනතුරුව අවශ්‍ය අවස්ථාවන්හි දී පවතින ක්‍රමවේද හා කාර්ය පටිපාටිවල වැඩිදියුණු කිරීම් නිර්දේශ කර, කළමනාකරණ හා විගණන කමිටුවට ප්‍රගතිය වාර්තා කරයි. විගණන කමිටුවට අභ්‍යන්තර විගණනයෙන් නිතිපතා වාර්තා ලැබෙන අතර, එම කාල පරිච්ඡේදය තුළ සිදු කරන ලද එක් එක් විගණනය මගින් සොයා ගත් ප්‍රධාන කරුණු පිළිබඳ සාරාංශයක් එම වාර්තාවලට ඇතුළත් වේ. කළමනාකරණයෙහි අදහස් ද එහි කොටසක් වන අතර, විගණනය විසින් නිරීක්ෂණය කර ඇති තත්ත්වයන්ට හේතු වී ඇති මූලික කරුණු සහ එම තත්ත්වයන් නැවත ඇතිවීම වළක්වා ගැනීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග ද කමිටුව විසින් සමාලෝචනය කරනු ලබයි.

3. අභ්‍යන්තර විගණනයේ සහ රජයේ විගණනයේ සහාය ඇතිව කමිටුව විසින් මණ්ඩලයේ මෙහෙයුම් සහ මූල්‍ය පාලන සහ කාර්ය පටිපාටිවල ඵලදායීතාවය තක්සේරු කරනු ලබන අතර, ඒවාට වියදම්, ආදායම් ක්‍රියාවලිය සහ ප්‍රාග්ධන වියදම් සඳහා අවසර දීමේ සීමා, අත්සන් කිරීමේ බලධාරීන්, තොරතුරු තාක්ෂණ යෙදවුම් පාලන සහ සංවර්ධනය කිරීම්, ආයතනික ව්‍යුහය, ප්‍රතිපත්ති, රාජකාරි වෙන් කර දීම සහ කළමනාකරණය විසින් සිදු කරන සමාලෝචන ඇතුළත් වේ. මණ්ඩලයෙහි මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ද්‍රවශීලතා තත්ත්වය නිරන්තරයෙන් නිරීක්ෂණය කරන ලදී. එහිදී හඳුනාගනු ලබන අඩුපාඩු අවශ්‍ය වැඩි දියුණු කිරීම් සඳහා වන නිර්දේශ ද සහිතව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කරනු ලැබේ. පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් මණ්ඩලය වෙත නිකුත් කරනු ලබන නියෝග කෙරෙහි කමිටුව විශේෂ අවධානයක් යොමු කරයි.

පවත්වන ලද විගණන කමිටු රැස්වීම් ගණන

2020 වර්ෂය සඳහා රැස්වීම් හතරක් (04) පවත්වන ලද අතර ඒ සඳහා පැමිණීම පහත සඳහන් පරිදි වේ:

අධ්‍යක්ෂවරයාගේ නම	පැමිණීම	නොපැමිණීම
එච්.ජී. සුමනසිංහ මයා	03/03	නැත
අනුර දිසානායක මහතා	01/01	නැත
රවීන්ද්‍ර විමලවීර මයා	03/03	නැත
ජෙනට් ජයවර්ධන මහත්මිය	04/03	01
ජේ.එම්. හද්‍රානි ජයවර්ධන මහත්මිය	03/02	01



එච්.ජී. සුමනසිංහ මයා
සභාපති - විගණන හා කළමනාකරණ කමිටුව

මූල්‍ය වාර්තා



පටුන

ස්වාධීන විගණකවරුන්ගේ වාර්තාව	38
කළමනාකරිත්වය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග	50
විස්තීර්ණ අදායම් ප්‍රකාශය	
මූල්‍ය තත්ත්ව ප්‍රකාශය	
මුදල් ප්‍රවාහ ප්‍රකාශය	62
හිමිකම් වෙනස්වීම් ප්‍රකාශය	63
ගිණුම්කරණ ප්‍රතිපත්ති	64
කාණ්ඩ වාර්තාව	65
අවසාන ගිණුම් සඳහා සටහන්	66
දස වසරක සාරාංශය	70
	72
	84

ස්වාධීන විගණකවරුන්ගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } පියූආර්/එෆ්/ඩීඑල්බී/1/20/එෆ්එස්1

මඹේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2021 අගෝස්තු 06 දින

Development Lotteries Board
12 AUG 2021
General Manager
Chairman Division

CHAIRMAN'S DIVISION
06 AUG 2021
DEVELOPMENT LOTTERIES B.C.

සභාපති

සංවර්ධන ලොතරැයි මණ්ඩලය

සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

යටෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති

පිටපත:- ලේකම්, මුදල් අමාත්‍යාංශය

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.
No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය
எனது இல.
My No. } පියූඅාර්/එෆ්/සීඑල්බී/1/20/එෆ්එස්1

මබේ අංකය
உமது இல.
Your No. }

දිනය
திகதி
Date } 2021 අගෝස්තු 05 දින

සභාපති

සංවර්ධන ලොතරැයි මණ්ඩලය

සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තිර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 නත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

1.2.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) රු.7,514,727 ක් පිරිවැය වටිනාකමක් සහිත වත්කම් වර්ග 5 ක එම පිරිවැය වටිනාකම ඉක්මවා රු.78,698,220 ක්ෂය වෙන්කිරීම් හේතුවෙන් එම වත්කම්වල ශුද්ධ පොත් අගය 2020 දෙසැම්බර් 31 දිනට රු.71,233,493 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) භෞතිකව මණ්ඩලය සතුව නොතිබුණු රු.8,095,000 ක් වටිනා කැබ් රථයක පිරිවැය ස්ථාවර වත්කම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඇ) මණ්ඩලයට අයිති නොමැති ඉඩමක ඉදිකිරීමේ කටයුත්තක් වෙනුවෙන් දරන ලද රු.492,392 ක මුදලක් ඉඩම් හා ගොඩනැගිලි යටතේ ගිණුම්ගත කර තිබුණද එම මුදල නිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලැබිය යුතු මුදලක් බව නිරීක්ෂණය විය. මේ හේතුවෙන් දේපල පිරියත හා උපකරණ වටිනාකම එම ප්‍රමාණයෙන් වැඩිපුර දැක්වුණු අතර ජංගම වත්කම්ද එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) ආනයනය කරන ලද වාහනයකට අදාළව පෞද්ගලික නියෝජිත ආයතනයකට ගෙවිය යුතුව පැවති රු.1,266,631 ක මුදලක් සම්බන්ධයෙන් උසාවියේ පැවති නඩු කටයුත්තක් සමාලෝචිත වර්ෂයේ අවසන් කර තිබුණද ඒ සඳහා වූ වගකීම ජංගම වගකීම්වලින් ඉවත් නොකර තවදුරටත් මූල්‍ය නත්ත්ව ප්‍රකාශනයේ දක්වා තිබුණි.

(ඉ) 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව අයවිය යුතු ණය ශේෂය රු.1,246,717 ක් වුවද විගණනය සඳහා ලබාදෙන ලද උපලේඛනයේ එම ශේෂය රු.1,096,717 ක් විය. ඒ අනුව රු.150,000 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඊ) 2020 දෙසැම්බර් 31 දිනට බැංකු ගිණුම් 03 ක පැවති රු.2,535,678 ක් වටිනා හඳුනානොගත් චෙක්පත් හා නැන්පතු හඳුනාගෙන ගිණුම්වල අවශ්‍ය ගැලපීම් කිරීමට කටයුතු කර නොතිබුණි.

(උ) 2020 ජනවාරි 01 දිනට ගෙවිය යුතු රඳවාගැනීමේ බදු ගිණුමේ ශේෂය රු. 36,259,336 ක් වුවද 2019 දෙසැම්බර් මසට අදාල වෙන්කිරීම් රු. 35,900,655 විය. ආරම්භක ශේෂය තුල පැවති එම රු.358,681 ක් වූ වෙනස සඳහා හේතු පැහැදිලි නොකල අතර සමාලෝචිත වර්ෂයේ අවසානයටද එම වෙනස එලෙසම පැවතුණි.

(ඌ) මණ්ඩලය විසින් චොක්ෂෝල් වීදියේ අංක 234 දරන ගොඩනැගිල්ල 2006 ඔක්තෝබර් සිට කුලී පදනම මත ලබාගැනීම සඳහා එළඹුණු ගිවිසුම ඒක පාර්ශ්විකව කඩ කිරීම නිසා තැන්පතු මුදල ලෙස ගෙවූ රු.723,780 ක් හා එම වර්ෂයන් සඳහා ගෙවූ කුලී මුදලින් කොටසක් වන රු.4,976,220 ක යන මුදල්වල එකතුව වන රු.5,700,000 ක මුදල දැනට වසර 15 ක් නිස්සේ අයකර ගැනීමට කටයුතු කර නොමැති බව නිරීක්ෂණය විය.

1.2.2 නොසැසඳූ ශේෂ

මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් න්‍යාග අයිතම තොගයේ හා ප්‍රවර්ධන අයිතම තොගයේ වටිනාකම, ගබඩාවේ පොත් හා කළමනාකරණ වාර්තා සමඟ සැසඳීමේදී රු.1,544,912 ක වෙනස්කමක් නිරීක්ෂණය විය.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මණ්ඩලයේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන මණ්ඩලයේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මණ්ඩලයේ 2020 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි

ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තිය විනිශ්චය සහ වෘත්තිය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මහ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම් යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරවිකිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරවිකිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති නිරීක්ෂණවලට යටත්ව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා මණ්ඩලය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මෙම වාර්තාවේ 1.2.1 (ආ), (ඇ) සහ (උ) ඡේදවල සඳහන් නිරීක්ෂණ සම්බන්ධයෙන් ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදීද ක්‍රියාත්මක කර නොතිබුණි.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට මණ්ඩලය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනු පහත සඳහන් නිරීක්ෂණයන් හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

නීතිරීති / විධානයට යොමුව	නිරීක්ෂණ
(අ) සංවර්ධන ලොතරැයි මණ්ඩල පනතේ 17(5) වගන්තිය	ත්‍යාගලාභීන් හිමිකම් නොපෑ, මාස 06 ක කාලසීමාව ඉකුත් වූ ත්‍යාග විකිණීමෙන් ලැබෙන මුදල පළමු කොට අරමුදලටද ඉන් පසුව ජනාධිපති අරමුදලටද බැර කල යුතු වුවත් 2020 පෙබරවාරි 12 දිනට මාස 06 ක කාලසීමාව ඉක්මවූ පිරිවැය රු.1,428,172 ක් වූ ත්‍යාග අයිතම් 11 කට අදාල භාණ්ඩ 162 ක් විකිණීමෙන් ලැබෙන මුදල ජනාධිපති අරමුදලට බැර කිරීමට කටයුතු කර නොතිබූ බව නිරීක්ෂණය විය.
(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XIV පරිච්ඡේදයේ 8 වගන්තිය	රාජ්‍ය ආයතනවල ක්ෂේත්‍ර රාජකාරියේ යෙදී සිටින නිලධාරීන් ඔවුන් එම රාජකාරී කටයුතු ඉටුකිරීම සඳහා ධාවනය කරනු ලබන වාහනය වෙනුවෙන් එක කිලෝමීටරයක් සඳහා රු.12 ක මුදලක් පමණක් ගෙවිය හැකි වුවද කිලෝමීටර් එකක් ධාවනය සඳහා මණ්ඩලය විසින් අලෙවි කළමනාකරුවන්ට රු.40 ක මුදලක් බැගින් ගෙවා තිබුණි.
(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මුදල් රෙගුලාසි 381	රාජකාරී බැංකු ගිණුමක් ආරම්භ කිරීම සඳහා භාණ්ඩාගාරයෙන් (රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවෙන්) ඉල්ලුම් කර අනුමැතිය ලබාගත යුතු වුවත් සංවර්ධන ලොතරැයි මණ්ඩලය නමින් රාජ්‍ය බැංකු 02 ක හා පෞද්ගලික බැංකු 02 ක පවත්වාගෙන ගොස් තිබූ ජංගම ගිණුම් 11 ක් සඳහා එසේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. එම ජංගම ගිණුම් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත පමණක් ආරම්භ කර තිබුණි.
(ඈ) 2018 නොවැම්බර් 14 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ (2) ඡේදය	රාජ්‍ය බැංකුවලින් පරිබාහිරව 2020 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.5,486,920 ක් වූ මණ්ඩලය සතු මුදල් පෞද්ගලික බැංකු ගිණුමක නැන්පත් කර එමගින් භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජන කර තිබුණි.
(ඉ) මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ 2008 දෙසැම්බර් 31 දිනැති අයවැය චක්‍රලේඛ අංක 142 හි 5.2 III ඡේදය	මණ්ඩලය විසින් නිලධාරීන් 144 දෙනෙකු වෙත රු.250,000 ඉක්මවා රු.10,011,540 ක මුදලක් ආපදා ණය වශයෙන් ගෙවා ඇති බව නිරීක්ෂණය විය. නවද කොරෝනා වසංගත තත්ත්වය හේතුවෙන් ඇතිවූ අයහපත් ආර්ථික තත්ත්වය මගහරවා ගැනීම සඳහා ආපදා ණය මුදලට සමගාමීව මූලික වැටුපට සමාන ණය මුදලක් ලබාදීමට කටයුතු කර තිබුණි.

2.2.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව

2.2.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණයන් හැර මණ්ඩලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායි ලෙස කාලසීමාවන් තුළ අදාළ නිතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

(අ) දෛනිකව දිනුම් අදිනු ලබන ලොතරැයිපත්වල දිනුම් අදිනු ලබන අවස්ථාව වන විට බෙදාහැරීමේ අලෙවි නියෝජිතයින් වෙත මණ්ඩලය විසින් ලබාදී නොතිබුණ ටිකට්පත් පැවතීම මෙන්ම උප ගබඩාව මගින් අදාල ඉන්වොයිස් අනුව නිවැරදි බාර්කෝඩ් සහිත ලොතරැයිපත් නිකුත් නොකිරීම යනාදී යම් දෝෂයක් මත ගැටළු ඇතිවන අවස්ථාවලදී එකී ටිකට්පත් අදාල නියෝජිතයාගේ විකුණුම් ලෙස සලකා පරිගණක පද්ධතියට ඇතුල් කර දිනුම් ඇදීමේ කටයුතු සිදු කර තිබුණු අවස්ථා විය. මේ සඳහා සහකාර සාමාන්‍යාධිකාරිගේ (මුදල්) අනුමැතිය ලබාදී තිබුණු අතර දිනුම් ඇදීමෙන් පසුව අදාල නියෝජිතයාගෙන් ලිඛිත ඉල්ලීමක් ලබාගැනීමෙන් පසු එකී ටිකට්පත්වල බාර්කෝඩ්වලට අදාල තැගි අත්හිටු වීම, එය පසුව ඉවත් කිරීම හා නියෝජිතයින් වෙත ආපසු මුදල් ගෙවීම ආදී කටයුතුද විධිමත් අනුමැතියකින් තොරව සහකාර සාමාන්‍යාධිකාරී (මුදල්) විසින්ම සිදුකර තිබුණි. 2020 වර්ෂය තුලදී එවැනි අවස්ථා 13 ක් නිරීක්ෂණය වූ අතර එහි විකුණුම් වටිනාකම රු.307,861 ක් විය.

(ආ) වර්ෂය තුල මුද්‍රණ ආයතනයෙන් අතිරේකව ඇණවුම් කල ටිකට්පත් ප්‍රමාණය 31,779,000 ක් වූ අතර ගබඩාවේ නිකුත් නොවී ඉතිරි වූ ටිකට්පත් ප්‍රමාණය 1,255,570 ක් විය. මෙය ප්‍රතිශතයක් ලෙස අතිරේකව ඇණවුම් කල ප්‍රමාණයෙන් සියයට 4 ක් වූ අතර අද කෝටිපති ටිකට් පතේ මෙම ප්‍රතිශතය සියයට 6 ක් ලෙස ඉහළ අගයක් ගෙන තිබුණි. ටිකට්පත් ඇණවුම් කිරීම නිසි කළමනාකරණයකින් සිදුනොවන බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ඇ) 2018 වර්ෂයේදී රු.5,565,000 කට මිලදිගන්නා ලද Rear body රහිත Double Wheel කෑ කැබ් රථය අලෙවි ප්‍රචාරණ රථයක් ලෙස සකස් කිරීමට 2018 ඔක්තෝබර් 18 දින පෞද්ගලික ආයතනයකට භාරදී ඇති අතර 2020 දෙසැම්බර් 30 දින වන විට වසර 2කට වැඩි කාලයක් ගතවී ඇති නමුත් මණ්ඩලය බලාපොරොත්තු වූ අරමුණ ඉටුවී නොතිබුණි. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.6 වගන්තියේ විධිවිධාන සැලකිල්ලට නොගෙන පිරිවිතරයන් සකස් කර මිල ගණන් කැඳවා තිබූ අතර මිලදීගත් ආයතනයේ අනුමැතියකින් තොරව නවීකරණය කර තිබුණි. තවද මෙම කාර්ය සඳහා මිලදිගන්නා ලද භාණ්ඩවල වසරක් සඳහා වූ වගකීම් කාලය අවසාන වී තිබීම, වත්කම හා එහි උපාංගවල ආරක්ෂාව පිළිබඳව සැලකිලිමත් නොවීම, හා කාර්ය සාධන ඇපකරවල වලංගු කාලයද ඉක්මවා ගොස් තිබීම යනාදී කරුණු මත රු.11,991,900 වැයක් දැරීමට යෝජිත මෙම මෙහෙයුම් කටයුත්ත ප්‍රශ්නගත බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ඇ) මණ්ඩලයේ ප්‍රධානතම මෙහෙයුම් කාර්යයක් වන ලොතරැයිපත් මුද්‍රණ කටයුතු 2017 වර්ෂයේ සිටම විධිමත් ප්‍රසම්පාදන සැලැස්මකට අනුව සිදුකර නොතිබූ අතර පවත්නා ගිවිසුම් කාලය අවසන්වීමට ලංවූ පසු ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භ කර තිබුණි. සාමාන්‍යයෙන් මාස 06 ක් පමණ ප්‍රසම්පාදන ක්‍රියාවලිය සිදුකරනු ලබන අතර එමනිසා පවත්නා ගිවිසුම් කාලයද මාස 06 ත් 08 ත් අතර කාලයක් දීර්ඝ කර තිබුණි. 2017 අගෝස්තු 01 දින සිට මේ දක්වාම මුද්‍රණ ආයතන දෙකක් පමණක් ඒ සඳහා තෝරා ගෙන තිබුණි.

2.3 වෙනත් විගණන නිරීක්ෂණ

(අ) විධිමත් සැලසුමකින් තොරව ප්‍රවර්ධන අයිතම් මිලදිගැනීම හේතුවෙන් රු.3,623,367 ක් වටිනා ප්‍රවර්ධන අයිතම් කුඩ (පිරිමි), ටී ෂර්ට්, සෝලා ලාම්පු,කැප් ,පොසිලේන් සෙට්, ජල පෙරන ගබඩාවේ තබාගෙන තිබුණි. මේ නිසා මණ්ඩලයේ ප්‍රවර්ධන තොග නැවත ඇණවුම් මට්ටම් පිළිබඳ ප්‍රමාණවත් අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් අනුගමනය කරනු ලබන බව නිරීක්ෂණය නොවුණි.

(ආ) 2019 ඔක්තෝබර් 24 දින ටිකට්පත්හි ත්‍යාග රටාවන් පිළිබඳ සාකච්ඡා කිරීම වෙනුවෙන් පැවති රැස්වීමේදී ගබඩාවේ පවතින ජයග්‍රහණ සඳහා හිමිකම් පා නොමැති මාස 06 ක කාලය ඉක්මවූ ත්‍යාග ඉදිරි තරඟ සඳහා යොදාගැනීමට මණ්ඩලය විසින් තීරණය කර තිබුණි. ඒ අනුව 2018 වර්ෂයේ මිලදිගත් රු.529,850 ක් වටිනා යතුරු පැදි 02 ක් 2019 දෙසැම්බර් මස වෙළඳපොලට හඳුන්වා දෙන ක්ෂණික ලොතරැයිපතේ ත්‍යාගයක් ලෙස හා 2020 පෙබරවාරි ලග්න වාසනාව විශේෂ දිනුම් ඇදීමේ ත්‍යාග ලෙස ලබාදීමට අවශ්‍ය කටයුතු කරන මෙන් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අලෙවි) වෙත උපදෙස් ලබාදී තිබුණද එම යතුරු පැදි 02 ම විගණන දිනය වූ 2021 පෙබරවාරි 12 වන දින වන විටත් ගබඩාවේ පවතින බව භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

(ඇ) භාවිතයට නොගෙන රඳවා තබාගෙන ඇති රු.592,500 වටිනා ත්‍යාග වවුචර්පත් 123 ම වසර 12 ක කාලයක් තුල මණ්ඩලය විසින් ප්‍රයෝජනයට නොගෙන රඳවා තබාගෙන ඇති බව නිරීක්ෂණය විය. මින් රු.7500 වටිනාකමින් යුත් වවුචර් පත් 07 ක් 2019 අගෝස්තු 31 දිනට කල්ඉකුත්වී තිබුණි. තවද රු.585,000 වටිනාකමින් යුත් රු.5000 වවුචර්පත් 117 ක් පැවති අතර, එම වවුචර් පත්වල කල්ඉකුත්වීමේ දිනය සඳහන් නොවන නමුත්, ඒවා 2009 වර්ෂයේදී මිලදී ගත් වවුචර්පත් වන බැවින් ඒවා මිලදීගෙන වර්ෂ 12 ගතවී ඇත. එබැවින් ඉදිරි ත්‍යාග ලබාදීමේ කටයුතුවලදී මෙම වවුචර්පත් භාවිතයට ගැනීමේ හැකියාවේ අවිනිශ්චිතභාවයක් පවතින බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ඇ) 2020 ජනවාරි 30 දින ප්‍රසම්පාදන කමිටු නිර්දේශ අනුව සුපර්බෝල් විශේෂ දිනුම් ඇදීමේ ස්කූටි සැපයීම් සඳහා තෝරාගනු ලැබූ ජයග්‍රාහී ලංසුකරුට එදිනම භාණ්ඩ ඇණවුම් නියෝග නිකුත් කර නිබුණි. එහෙත් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.7.1 (ආ) වගන්තිය ප්‍රකාරව කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා ලංසුවේ වලංගු කාලය ඇතුලත කොන්ත්‍රාත් ප්‍රදානය පිළිබඳ අවසාන තීරණය ගනුලැබූ විගස ප්‍රතිග්‍රහණ ලිපියක් අදාල සැපයුම්කරු වෙත නිකුත් කර නොතිබුණි. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.10 ප්‍රකාරව කාර්යසාධන සුරක්ෂණ ඉදිරිපත් කිරීමට හා 8.9.1 ප්‍රකාරව කොන්ත්‍රාත් ගිවිසුම් අත්සන් කිරීමටද කටයුතු කර නොතිබුණි.

(ඉ) මණ්ඩලය විසින් රු.3,275,246 ක වියදමක් දරා Sweep App හරහා ලොතරැයිපත් නිකුත් කිරීම සඳහා කටයුතු කර නිබුණුද පෞද්ගලික ආයතනයක් විසින් මුද්‍රණය කරන ලද ලොතරැයිපත් එම පහසුකම ඔස්සේ ලබාදීමට එකඟ වී නොතිබුණි. තවද අමතර මුද්‍රණ යන්ත්‍ර කිසිවක් නොමැතිවීම මෙන්ම මුද්‍රණ දෝෂ සහිතව දිගින් දිගටම ලොතරැයිපත් මුද්‍රණය කර නිබීම යන අඩුපාඩු නිබියදීත් එම ආයතනය සුදුසුකම් සපුරා ඇති ආයතනයක් ලෙස පිළිගැනීම විගණනයේදී ප්‍රශ්නගත කරුණක් විය.

(ඊ) ප්‍රසම්පාදන හා තාක්ෂණික ඇගයීම් කමිටු තීරණ හේතුවෙන් 2017 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා ලොතරැයිපත් මුද්‍රණයේදී මණ්ඩලයට දැරීමට සිදුවූ මුළු අතිරික්ත වියදම රු.72,479,000 ක් විය.

(උ) අලෙවි ප්‍රවර්ධන නිලධාරීන් භාවිතා කරන ලද පිරිවැය රු.1,352,610.58 ක් වූ යතුරුපැදි 07 ක් වසර 02 මාස 11 අධික කාලයක් කාර්යාල පරිශ්‍රයේ රථගාල තුල ප්‍රයෝජනයට නොගෙන ගබඩාවේ රඳවා තබා නිබුණි.

(ඌ) මණ්ඩලය සතු වාහන හා මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ මණ්ඩලය නමින් ලියාපදිංචි වී ඇති වාහන එකිනෙක සැසඳීමේදී මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ මණ්ඩලය නමින් ලියාපදිංචි වී ඇති වාහන 37 ක් මණ්ඩලයේ ස්ථාවර වත්කම් ලේඛනයේ ඇතුලත් නොවන බව නිරීක්ෂණය විය.

(එ) 2020 වර්ෂයේ මාර්තු සිට ජූලි දක්වා කාලපරිච්ඡේදය සැලකිමේදී කොරෝනා රෝගය පැතිර යෑම හේතුවෙන් මණ්ඩලයේ අලෙවි ආදායම 2019 වර්ෂයේ එම කාලපරිච්ඡේදයට සාපේක්ෂව රු.3,124,722,840 කින් හෙවත් සියයට 45 කින් පහත වැටී ඇති බව නිරීක්ෂණය විය.

(ඒ) ත්‍යාග අයිතම් අතුරින් මිලදීගෙන වර්ෂ 02 ඉක්මවූ රු.548,224 ක් වටිනා ජංගම දුරකථන 08 ක හා ටැබ් පරිගණක 04 ක වගකීම් කාලය ඉක්මවා තිබූ අතර රු.32,510 ක් වටිනා මවුන්ටන් බයිසිකල් 02 ක් හා ලී රූපවාහිනී රඳවනයක් භාවිතයට ගත නොහැකි මට්ටමේ පවතින බව භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. මීන් දුරකථන 03 ක්, ටැබ් පරිගණක 04 ක් හා මවුන්ටන් බයිසිකල් 02 ක් 2019 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණය මඟින් විකිණීම සඳහා හඳුනාගෙන තිබුණද විගණිත දිනය වූ 2021 පෙබරවාරි 12 වන විටත් එම නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබූ බව නිරීක්ෂණය විය.

(ඔ) 2016 වර්ෂයට පෙර සිට ගබඩාවේ පැවති භාවිතා නොකල නමුත් ප්‍රයෝජනයට ගත නොහැකි මට්ටමේ පැවති රු.505,407 ක් වටිනා ප්‍රවර්ධන අයිතම් 10 කට අදාළ භාණ්ඩ 119 ක් වෙන්දේසි කිරීමට පාලන අංශයට භාරදී තිබූ අතර ඉන් රු.325,569 ක් වටිනා අයිතම් 07 කට අදාල භාණ්ඩ 76 ක් වෙන්දේසි කොට 2020 වර්ෂයේදී රු.38,954 ක් උපයා තිබුණි. ඒ අනුව භාවිතයට ගනු නොලැබූ ප්‍රවර්ධන අයිතම් හේතුවෙන් රු.286,615 ක් එනම් සියයට 88 ක පාඩුවක් මණ්ඩලයට ඇතිවී තිබූ බව නිරීක්ෂණය විය.

(ඕ) මණ්ඩලය විසින් 1990 වර්ෂයේ චෝඩ් පෙදෙසේ පුද්ගලයෙකු සමඟ ඇතිකරගෙන තිබූ කුලී ගිවිසුම් ප්‍රකාරව එම පුද්ගලයා වෙත ලබාදී තිබූ රු.2,520,000 ක ගොඩනැගිලි කුලී තැන්පතු මුදලක් නැවත අයකර දෙන ලෙස ඉල්ලා අවුරුදු 23 කට පෙර ගොනුකර තිබූ නඩුවේ තීන්දුව 2016 ජනවාරි 11 දින ලැබී තිබූ අතර එහිදී තීන්දුකර තිබුණේ අදාල මුදල අයකර ගැනීමට චුවත් තීන්දුව ලැබී දැනට වසර 05 කට ආසන්න කාලයක් ගතවී ඇතත් අදාල මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ක) 2013 වර්ෂයේ අවස්ථා 3 කදී රු.2,877,144 ක් සහ 2014 වර්ෂයේදී රු.749,583ක් ලෙස එකතුව රු.3,626,727 ක මුදලක් පෞද්ගලික ආයතනයක් වෙත උපදේශන ගාස්තු ලෙස අත්තිකාරම් වශයෙන් ගෙවා තිබුණි. වසර 7 – 8 ක කාලයක් බාහිර පාර්ශවයක් අත රඳවා තිබෙන මෙම මුදල ලබාගැනීමට කටයුතු කර නොතිබූ බව නිරීක්ෂණය විය.

(ග) 2020 දෙසැම්බර් 31 දිනට මණ්ඩලය සතු එකතුව රු.270,749,417 ක මුදලක් ඒක්ෂණ තැන්පතු ගිණුමක තැන්පත් නොකර ජංගම ගිණුම් 06 ක රඳවා තබාගෙන තිබුණි.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති

විගණන වාර්තාව 2020 සහ කළමනාකාරීත්වය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග

සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව අවසාන විගණකාධිපති වාර්තාව සඳහා පිළිතුර

විගණකාධිපති වාර්තාවේ සඳහන් කරුණු	කළමණාකාරීත්වයේ ක්‍රියාමාර්ගය
1.2.1 ගිණුම්කරණ අඩු පාඩු	
(අ) රු. 7,514,727 ක් පිරිවැය වටිනාකමක් සහිත වත්කම් වර්ග 5ක එම පිරිවැය වටිනාකම ඉක්මවා රු. 78,698,220 ක්ෂය වෙන්කිරීම හේතුවෙන් එම වත්කම් වල ශුද්ධ පොත් අගය 2020 දෙසැම්බර් 31 දිනට රු.71,233,493 ක් අඩුවෙන් දක්වා තිබුණි.	වත්කම් වල පිරිවැය හා ශුද්ධ පොත් අගය මූල්‍ය ප්‍රකාශනයෙහි සටහන් අංක 11 යටතේ නිවැරදිව දක්වා ඇත.
(ආ) භෞතිකව මණ්ඩලය සතුව නොතිබුණු රු 8,095,000 ක් වටිනා කැබ් රථයක පිරිවැය ස්ථාවර වත්කම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.	මණ්ඩලය සතුව නොතිබුනද රු.8,095,000/-ක් වටිනා කැබ් රථය මිළදීගෙන මණ්ඩලය නමින් ලියාපදිංචි කර ඇති අතර ඒ සඳහා මුදල් "United Motors" ආයතනයට ගෙවා ඇති බැවින් එය ආයතනයේ වත්කමක් ලෙස සලකා එහි පිරිවැය ස්ථාවර වත්කම් යටතේ දක්වා ඇත. එම රථයට ගෙවන ලද පිරිවැය රථය රැගෙන ගිය පාර්ශවයෙන් අයකර ගැනීමට නීතිමය කටයුතු වර්තමානය වන විට කරගෙන යනු ලබයි.
(ඇ) මණ්ඩලයට අයිති නොමැති ඉඩමක ඉදිකිරීමේ කටයුත්තක් වෙනුවෙන් දරන ලද රු.492,392 ක මුදලක් ඉඩම් හා ගොඩනැගිලි යටතේ ගිණුම්ගත කර තිබුණද එම මුදල තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලැබිය යුතු මුදලක් බව නිරීක්ෂණය විය. මේ හේතුවෙන් දේපල පිරියත හා උපකරණ වටිනාකම එම ප්‍රමාණයෙන් වැඩිපුර දැක්වුණු අතර ජංගම් වත්කමද එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.	මෙම ඉඩම වෙනුවෙන් දරන ලද පිරිවැය වන රු.492,392/- ක් වන මුදල අයකර ගැනීමට උත්සාහ කලද තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම්වරයා විසින් දැනුම්දී ඇත්තේ රජය සතු ඉඩමක් සංවර්ධනය කිරීමට දරා ඇති පිරිවැය නැවත අයකර දීමේ හැකියාවක් නොමැති බවයි. ඒ අනුව එම මුදල කපාහැරීම සඳහා 2021 වර්ෂයේ මාර්තු මස 02 වැනි දින පැවති 248 වන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කරන ලද අතර ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය හිමිවිය. ඒ අනුව 2021 වර්ෂයේ ජූලි මස වන විට ගිණුම් තුළින් එම රු.492,392/- ක මුදල කපාහැරීමට කටයුතු කර ඇත.
(ඈ) ආනයනය කරන ලද වාහනයකට අදාළව පෞද්ගලික නියෝජිත ආයතනයකට ගෙවිය යුතුව පැවති රු. 1,266,631 ක	PB – 6024 දරණ කැබ් රථයට අදාලව යුනයිටඩ් මෝටර්ස් ආයතනයට ගෙවිය යුතුව පැවති රු.8,095,000 ක මුදල වෙනුවෙන් පොලිය

මුදලක් සම්බන්ධයෙන් උසාවියේ පැවති නඩු කටයුත්තක් සමාලෝචිත වර්ෂයේ අවසන් කර තිබුණ ද ඒ සඳහා වූ වගකීම ජංගම වගකීම් වලින් ඉවත් නොකර තවදුරටත් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා තිබුණි.	වශයෙන් වසර 10කට 10% බැගින් රු.8,095,000 ක අමතර මුදලක් 2018 වර්ෂය අවසානයේදී ඇස්තමේන්තු කරන ලදි. කෙසේ නමුත් මේ සඳහා පොලී වශයෙන් රු.6,828,368.83 ක මුදලක් පමණක් ගෙවීමට සිදුව ඇති බව පාලන අංශය විසින් 2021.03.10 වන දින ගිණුම් අංශය වෙත ලිපියක් මගින් දැනුම් දී ඇති අතර 2021 මාර්තු මසදී මෙම නෛතික ගාස්තු අධි වෙන් කිරීම සඳහා අවශ්‍ය ගැලපීම් සිදු කර නිවැරදිව ගිණුම්ගත කර ඇත.
(ඉ) 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව අයවිය යුතු ණය ශේෂය රු. 1,246,717 ක් වුවද විගණනය සඳහා ලබා දෙන ලද උප ලේඛනයේ එම ශේෂය රු.1,096.717 ක් විය. ඒ අනුව රු.150,000 ක වෙනසක් නිරීක්ෂණය විය.	එකග වේ. Employee Contribution ලෙස සටහන් විය යුතු රු.150,000/- ක මුදල Staff Loan Recovery Covid 19 ලෙස සටහන් වීම ප්‍රවර්තන වර්ෂයේ ගිණුම තුල නිවරදි කර ඇති අතර උප ලේඛන අංක 1ට අදාලව අවසන් ශේෂයෙහි කිසිදු වෙනසක් සිදු වී නොමැත.
(ඊ) 2020 දෙසැම්බර් 31 දිනට බැංකු ගිණුම් 03 ක පැවති රු.2,535,678 ක් වටිනා හඳුනා නොගත් චෙක්පත් හා තැන්පතු හඳුනා ගෙන ගිණුම්වල අවශ්‍ය ගැලපීම් කිරීමට කටයුතු කර නොතිබුණි.	බෙදාහැරීමේ අලෙවි නියෝජිතයින් සහ අලෙවි නියෝජිතයින් විසින් මණ්ඩලය වෙත ටිකට්පත් අලෙවිය වෙනුවෙන් සහ අනෙකුත් විශේෂ ගෙවීම් වෙනුවෙන් සිදු කරන ලද මුදල් තැන්පතු නිසි හඳුනා ගැනීම් රහිතව සිදු කිරීම හේතුකොට ගෙන මෙම ගැටලුව පැන නැගී ඇත. එයින් මාස 6ක් ඉක්මවූ හඳුනාගත නොහැකි තැන්පතු මණ්ඩලයේ අනෙකුත් අදායම් ලෙස ගිණුම් ගත කිරීමට මේ වන විටත් කටයුතු යොදා ඇත. එමෙන්ම මණ්ඩලයේ ගිණුම් වලට මුදල් තැන්පත් කිරීමේදී තැන්පතු හඳුනා ගැනීමට හැකි වන ලෙස අදාල උපදෙස් බෙදාහැරීමේ අලෙවි නියෝජිතයන් වෙත දන්වා ඇත.
(උ) 2020 ජනවාරි 01 දිනට ගෙවිය යුතු රඳවා ගැනීමේ බදු ගිණුමේ ශේෂය රු. 36,259,336 ක් වුවද 2019 දෙසැම්බර් මසට අදාල වෙන්කිරීම් රු. 35,900,655 විය. ආරම්භක ශේෂය තුල පැවති එම රු.358,681 ක් වූ වෙනස සඳහා හේතු පැහැදිලි නොකල අතර සමාලෝචිත වර්ෂයේ අවසානයට ද එම වෙනස එලෙසම පැවතුණි.	2021 වර්ෂයේ අගෝස්තු මස දී ගිණුම් තුළින් නිවැරදි කර ඇත.
(ඌ) මණ්ඩලය විසින් වොක්ෂෝල් වීදියේ අංක 234 දරන ගොඩනැගිල්ල 2006 ඔක්තෝබර් සිට කුලී පදනම මත ලබාගැනීම සඳහා එළඹුණු ගිවිසුම් ඒක පාර්ශිකව කඩ කිරීම නිසා තැන්පතු මුදල ලෙස ගෙවූ රු.723,780 ක් හා එම වර්ෂයන් සඳහා ගෙවූ කුලී මුදලින්	වොක්ෂෝල් වීදියේ අංක 234 දරණ ගොඩනැගිල්ල කුලියට ගැනීම වෙනුවෙන් ආයතනයට ආපසු අයකර ගතයුතු රු.5,700,000/- නැවත අයකර ගැනීම සම්බන්ධයෙන් හෝ කපාහැරීම සම්බන්ධයෙන් නිර්දේශ ලබාදෙන ලෙස මුදල් අමාත්‍යාංශ ලේකම්වරයා විසින් කමිටුවක් පත්කරන ලදී. එම කමිටුව අවස්ථා

කොටසක් වන රු.4,976,220 ක යන මුදල්වල එකතුව වන රු. 5,700,000 ක මුදල දැනට වසර 15 ක් තිස්සේ අයකර ගැනීමට කටයුතු කර නොමැති බව නිරීක්ෂණය විය.	04කදී රැස්වීම් පිළිබඳ දීර්ඝව සාකච්ඡා කර අවසන් වාර්ථාව මුදල් අමාත්‍යාංශ ලේකම්වරයා වෙත මේ වන විට ඉදිරිපත් කර ඇත. ඒ අනුව මුදල් අමාත්‍යාංශ ලේකම්වරයා විසින් ඉදිරියේදී ලබාදෙන උපදෙස් අනුව කටයුතු කරණු ඇත.
1.2.2 නොසැසඳූ ශේෂ මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් ත්‍යාග අයිතම් තොගයේ හා ප්‍රවර්ධන අයිතම තොගයේ වටිනාකම්, ගබඩාවේ පොත් හා කළමනාකරණ වාර්තා සමඟ සැසඳීමේදී රු. 1,544,912 ක වෙනස්කමක් නිරීක්ෂණය විය.	ගිණුම් අංශයේ හා ගබඩාවේ ඇති ත්‍යාග හා ප්‍රවර්ධන තොග ලෙජරයේ අයිතමයන් ප්‍රමාණාත්මකව නිවැරදි වන අතර ඒවායේ වටිනාකම් වල විචලතාවයන් පවති. මූල්‍ය ප්‍රකාශනයන්ගේ තොග අයිතම් වල වටිනාකම් ගණනය කරනු ලබන්නේ FIFO ගිණුම් ප්‍රතිපත්තියට අනුකූලව වේ.
2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව **2.2.2** 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණයන් හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.	
නීතිරීති / විධානයට යොමුව	**නිරීක්ෂණ**
(අ) සංවර්ධන ලොතරැයි මණ්ඩල පනතේ 17(5) වගන්තිය	ත්‍යාගලාභීන් හිමිකම් නොපෑ, මාස 06 ක කාලසීමාව ඉකුත් වූ ත්‍යාග විකිණීමෙන් ලැබෙන මුදල පළමු කොට අරමුදලටද ඉන් පසුව ජනාධිපති අරමුදලටද බැර කල යුතු වුවත් 2020 පෙබරවාරි 12 දිනට මාස 06 ක කාලසීමාව ඉක්මවූ පිරිවැය රු.1,428,172 ක් වූ ත්‍යාග අයිතම් 11 කට අදාල භාණ්ඩ 162 ක් විකිණීමෙන්
	මේ සඳහා නීතිපති දෙපාර්තමේන්තුව මගින් ලැබී ඇති උපදෙස් අනුව ත්‍යාග සංචිත ගිණුමෙහි මුදල් භාවිතා කර නැවත දිනුම් ඇදීම සඳහා ත්‍යාග ලබාගත් විට ඒ සඳහා අදාල ත්‍යාගලාභීන් ඉදිරිපත් නොවූ අවස්ථාවල එම ත්‍යාග අලෙවියෙන් පසු ලැබෙන මුදල් නැවත ත්‍යාග සංචිත ගිණුමට බැර කළ යුතුය යන්න සඳහන් කර ඇත. ඒ අනුව එම ත්‍යාග අයිතම වලින් කොටසක් අපහරණය කිරීම සඳහා අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය ලැබී ඇත. එසේ නැතහොත් එම ත්‍යාග ඉදිරි ප්‍රචාරණ වැඩසටහන් වල ත්‍යාග ලෙස භාවිතා කල හැකිය යන්න සඳහන්ව ඇත. ඉතිරි කොටස (යතුරු පැදි) නැවත ත්‍යාග ලෙස ලබා දීම සඳහා කළමනාකරණය තීරණය කර ඇත.

		ලැබෙන මුදල ජනාධිපති අරමුදලට බැර කිරීමට කටයුතු කර නොතිබූ බව නිරීක්ෂණය විය.	
(ආ)	**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XIV පරිච්ඡේදයේ 8 වගන්තිය**	රාජ්‍ය ආයතනවල ක්ෂේත්‍ර රාජකාරියේ යෙදී සිටින නිලධාරීන් ඔවුන් එම රාජකාරී කටයුතු ඉටුකිරීම සඳහා ධාවනය කරනු ලබන වාහනය වෙනුවෙන් එක කිලෝමීටරයක් සඳහා රු.12 ක මුදලක් පමණක් ගෙවිය හැකි වුවද කිලෝමීටර් එකක් ධාවනය සඳහා මණ්ඩලය විසින් අලෙවි කළමනාකරුවන්ට රු.40 ක මුදලක් බැගින් ගෙවා තිබුණි.	වෙනත් ආයතන වල ක්ෂේත්‍ර රාජකාරීවල නිරතවන කාර්යය මණ්ඩලය මෙන් නොව මණ්ඩලයේ ක්ෂේත්‍ර රාජකාරී වල නිරතවන කාර්යය මණ්ඩලය සෑම අවස්ථාවකම ක්ෂේත්‍රයේ ගැටලු ඇතිවන අවස්ථා වල ඒ සඳහා මැදිහත්වීමට සිදුවන බැවින් ඔවුන්ට නිතරම ක්ෂේත්‍රයේ රාජකාරී වල නිරත කරවීමට සිදුවේ. එමෙන්ම එක් ක්ෂේත්‍ර නිලධාරියෙකුට ආවරනය කලයුතු භූගෝලීය ප්‍රදේශය විශාල වේ. එබැවින් ඉහත කරුණු පදනම්ව කි.මී.රු.40/-ක ඉන්ධන දීමනාවක් ලබාදී ඇත.තවද එම මෝටර් රථම ඔවුගේම මෝටර් රථ වන බැවින් එම රථවල පිරිවැයද එම රථ ධාවනය කරන්නේ ආදාල නිලධාරීන් බැවින් රියදුරුගේ පිරිවැයන්ද මෙම රු.40/- තුළ අන්තර්ගතව ඇත. තවද මෙම රු.40/- තීරණය කිරීම සඳහා 2018 වසරේදී පැවති ඉන්ධන මිළ ගණන් මත පදනම්ව එවකට කුලීරථ සේවා සපයන ආයතන වලින් මිළ ගණන් කැඳවා ඔවුන් කි.මී.ට අයකරන ලද මිළද රු.40/-කට වඩා වැඩිවූ බැවින් රු.40/- මිළ ලබාදීම සුදුසු බව තීරණය කරන ලදී. ඒ අනුව මේ සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන ගෙවීම් සිදුකරණු ලබයි.
(ඇ)	**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය 381 වගන්තිය**	රාජකාරී බැංකු ගිණුමක් ආරම්භ කිරීම සඳහා භාණ්ඩාගාරයෙන් (රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවෙන්) ඉල්ලුම් කර අනුමැතිය ලබාගත යුතු වුවත් සංවර්ධන ලොතරැයි මණ්ඩලය නමින් රාජ්‍ය බැංකු 02 ක හා පෞද්ගලික බැංකු 02 ක පවත්වාගෙන ගොස් තිබූ ජංගම ගිණුම් 11 ක් සඳහා එසේ අනුමැතිය	සං.ලොම. අධ්‍යක්ෂ මණ්ඩලයකින් ස්වාධීන වූ මුදල් අමාත්‍යාංශය මගින් පාලනය වන ආයතනයකි. එබැවින් යම්කිසි රාජකාරිමය කටයුත්තක් සඳහා මණ්ඩලයට යම් බැංකු ගිණුමක් ආරම්භ කිරීමට අවශ්‍ය නම් ඒ සඳහා අවශ්‍ය කෙටුම්පත් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කොට අනුමැතිය ලබා එම ගිණුම රාජ්‍ය හෝ වාණිජ බැංකුවක ආරම්භ කර පවත්වා ගෙන යාම මේ වන තෙක් සිදු වී ඇති ක්‍රමවේදය වේ. මෙම විගණන විමසුමෙහි සඳහන් ගිණුම් 11 ද එම ක්‍රමවේදයට අනුව ආරම්භ කල ගිණුම් වේ. එසේම ඉහත සඳහන් කල සං.ලොම. අධ්‍යක්ෂක මණ්ඩලයේ මුදල් අමාත්‍යාංශය නියෝජනය කරන අධ්‍යක්ෂකවරයෙක්ද සිටින බැවින් ඔහු ඇතුළු අනෙකුත් සෙසු සාමාජික අධ්‍යක්ෂකවරුන්ගේ පූර්ණ අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව මෙම ගිණුම් ආරම්භ කර ඇත.

		ලබාගෙන නොතිබුණි. එම ජංගම ගිණුම් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත පමණක් ආරම්භ කර තිබුණි.	
(ඇ)	**2018 නොවැම්බර් 14 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ (2) වගන්තිය**	රාජ්‍ය බැංකුවලින් පරිබාහිරව 2020 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.5,486,920 ක් වූ මණ්ඩලය සතු මුදල් පෞද්ගලික බැංකු ගිණුමක තැන්පත් කර එමඟින් භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජන කර තිබුණි.	දිස්ත්‍රික් අලෙවි නියෝජිතයින්ගේ දෛනික තැන්පතුන් පහසු කිරීමේ අරමුණෙන් මෙම ගිණුම ආරම්භ කර ඇත. ඉදිරියේදී සිදු කරනු ලබන තැන්පතු ප්‍රමාණයන් නිරීක්ෂණය කර මෙම ගිණුම තව දුරටත් පවත්වාගෙන යන්නේද පිලිබඳව තීරණය කරනු ඇත.
(ඉ)	**මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ 2008 දෙසැම්බර් 31 දිනැති අයවැය චක්‍රලේඛ අංක 142 හි 5.2 III වගන්තිය**	මණ්ඩලය විසින් නිලධාරීන් 144 දෙනෙකු වෙත රු.250,000 ඉක්මවා රු.10,011,540 ක මුදලක් ආපදා ණය වශයෙන් ගෙවා ඇති බව නිරීක්ෂණය විය. තවද කොරෝනා වසංගත තත්ත්වය හේතුවෙන් ඇති වූ අයහපත් ආර්ථික තත්ත්වය මගහරවා ගැනීම සඳහා ආපදා ණය මුදලට සමගාමීව මූලික වැටුපට සමාන ණය මුදලක් ලබාදීමට කටයුතු කර තිබුණි.	සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ ආරම්භයේ සිට මේ දක්වා මෙම ක්‍රමවේදය යටතේ සේවකයන් අභිප්‍රේරණය කිරීම සඳහා ආපදා ණය ලබා දී ඇත. කොරෝනා වෛරසය ආරම්භවූ මුල් අවස්ථාවේ 2020 මාර්තු මස 18 සිට මැයි මස 12 දක්වා රට වසා තැබීම හේතුවෙන් මණ්ඩලයේ මෙහෙයුම් කටයුතුද එම කාලය තුල ක්‍රියාත්මක නොවීය. එම නිසා කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ ආදායම් අහිමි වීම නිසා ඔවුන්ගේ දෛනික ජීවිත අඩාල වී ඇති බවත් ඒ සඳහා ණය අත්තිකාරමක් ලබාදෙන ලෙස කාර්ය මණ්ඩල සාමාජිකයින් ඉල්ලීමක් සිදුකලද එය ලබාදීම ප්‍රතික්ෂේප කරන ලදී. නමුත් අඛන්ඩව ඉල්ලීම් සිදුකිරීම හා ඔවුන්ගේ දැඩි විරෝධතාවය හමුවේ ඉල්ලීම් කල අත්තිකාරම් මුදලට වඩා අඩු එනම් මූලික වැටුපට සමාන මුදලක් ලබාදීමට සිදුවිය. මේ සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගන්නා ලදී. වර්තමානය වන විට එම ලබාදුන් අත්තිකාරමට අදාල සියලු මුදල් මේ වන විට අයකරගෙන ඇත. මෙම අත්තිකාරම් මුදල ලබාදීම සඳහා මුදල් අමාත්‍යාංශයෙන් හෝ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවෙන් අනුමැතියක් ලබාගෙන නොමැත. කෙසේ නමුත් මින් ඉදිරියේදී මෙවැනි ආකාරයේ අත්තිකාරම් මුදල් ලබාදීමක් සිදු නොකිරීමට තීරණය කර ඇත.

2.2.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව

2.2.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණයන් හැර මණ්ඩලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාල සීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

(අ) දෛනිකව දිනුම් අදිනු ලබන ලොතරැයිපත්වල දිනුම් අදිනු ලබන අවස්ථාව වන විට බෙදාහැරීමේ අලෙවි නියෝජිතයින් වෙත මණ්ඩලය විසින් ලබාදී නොතිබුණ ටිකට්පත් පැවතීම මෙන්ම උප ගබඩාව මඟින් අදාල ඉන්වොයිස් අනුව නිවැරදි බාර්කෝඩ් සහිත ලොතරැයිපත් නිකුත් නොකිරීම යනාදී යම් දෝෂයක් මත ගැටළු ඇති වන අවස්ථා වලදී එකී ටිකට්පත් අදාල නියෝජිතයාගේ විකුණුම් ලෙස සලකා පරිගණක පද්ධතියට ඇතුල් කර දිනුම් ඇදීමේ කටයුතු සිදු කර තිබුණ අවස්ථා විය. මේ සඳහා සහකාර සාමාන්‍යාධිකාරිගේ (මුදල්) අනුමැතිය ලබා දී තිබුණ අතර දිනුම් ඇදීමෙන් පසුව අදාල නියෝජිතයාගෙන් ලිඛිත ඉල්ලීමක් ලබා ගැනීමෙන් පසු එකී ටිකට්පත් වල බාර්කෝඩ් වලට අදාල තැගි අත්හිටු වීම, එය පසුව ඉවත් කිරීම හා නියෝජිතයින් වෙත ආපසු මුදල් ගෙවීම ආදී කටයුතු ද විධිමත් අනුමැතියකින් තොරව සහකාර සාමාන්‍යාධිකාරී (මුදල්) විසින්ම සිදුකර තිබුණි. 2020 වර්ෂය තුලදී එවැනි අවස්ථා 13 ක් නිරීක්ෂණය වූ අතර එහි විකුණුම් වටිනාකම රු.307,861 ක් විය.	ලොතරැයි තොග බෙදාහැරීමේ නියෝජිතයන් හට ප්‍රවාහනය කරනු ලබන්නේ දුම්රිය සහ බස් රථ යොදා ගනිමිනි. ඇතැම් අවස්ථා වලදී එම ලොතරැයි තොග දුම්රියේදී හෝ බස් රථ වලදී අස්ථාන ගත වන අවස්ථා ඇත. එවැනි අවස්ථා වලදී එම ටිකට් තොග අදාල බෙදාහැරීමේ අලෙවි නියෝජිතයන් අලෙවි කල සේ සලකා ඔවුන්ගේ නමින් ගනුදෙනු සටහන් කරනු ලැබේ. පසුව එම තොග බෙදාහැරීමේ අලෙවි නියෝජිතයන් වෙත ලැබුණු බව ඔවුන් මඟින් ලිඛිතව සනාථ කර ගැනීමෙන් පසුව එම මුදල් නැවත බෙදා හැරීමේ අලෙවි නියෝජිතයන්ගේ ගිණුම් වලට බැර කරනු ලැබේ. නමුත් ඉහත ක්‍රියාවලිය පිළිබඳ විගණන අංශය විසින් පෙන්වා දුන් පසු බෙදාහැරීමේ අලෙවි නියෝජිතයන් වෙත ප්‍රවාහනය කරනු ලබන දිනට පසු දින එම ටිකට් තොග අස්ථාන ගත වූ බව බෙදාහැරීමේ අලෙවි නියෝජිතයන් විසින් තහවුරු කර ගැනීමෙන් පසු එම ටිකට් තොගය විකුණුම් ලෙස ගිණුම් ගත නොකරයි. ඒ අනුව මෙවැනි ආකාරයේ ගැටළුවක් ඉදිරියේදී ඇති නොවනු ඇත.
(ආ) වර්ෂය තුල මුද්‍රණ ආයතනයෙන් අතිරේකව ඇණවුම් කල ටිකට්පත් ප්‍රමාණය 31,779,000 ක් වූ අතර ගබඩාවේ නිකුත් නොවී ඉතිරි වූ ටිකට්පත් ප්‍රමාණය 1,255,570 ක් විය. මෙය ප්‍රතිශතයක් ලෙස අතිරේකව ඇණවුම් කල ප්‍රමාණයෙන් සියයට 4 ක් වූ අතර අද කෝටිපති ටිකට් පතේ මෙම ප්‍රතිශතය සියයට 6 ක් ලෙස ඉහළ අගයක් ගෙන තිබුණි. ටිකට්පත් ඇණවුම් කිරීම නිසි කළමනාකරණයකින් සිදු නොවන බව විගණනයේදී නිරීක්ෂණය විය.	2020 ජනවාරි මස සිට ජුලී මස දක්වා කාලවකවානුව තුළ ආයතනයට පාලනය කල නොහැකි සිද්ධීන් හේතුවෙන් එනම් රටේ උද්ගත වී ඇති COVID 19 වසංගත තත්වය වරින් වර උත්සන්න වීම හා ඊට අනුකූලව රජය රට වසා තැබීම හා පැනවූ යම් යම් පාලන උපක්‍රම හේතුවෙන් අලෙවිය ප්‍රභල ලෙස අඩු වූ අතර ආයතනයේ අලෙවි නොවී ඉතිරි වූ ටිකට්පත් ප්‍රමාණයද ඉහළ අගයක් ගෙන ඇත. ඒ අනුව මෙම කාලවකවානුවේ ටිකට්පත් මුද්‍රණය සීමා සහිතව සිදු කරනු ලබයි.

(ඇ) 2018 වර්ෂයේදී රු5,565,000 කට මිලදී ගන්නා ලද Rear body රහිත Double Wheel කෘ කැබ් රථය අලෙවි ප්‍රචාරණ රථයක් ලෙස සකස් කිරීමට 2018 ඔක්තෝබර් 18 දින පෞද්ගලික ආයතනයකට භාරදී ඇති අතර 2020 දෙසැම්බර් 30 දින වන විට වසර 2කට වැඩි කාලයක් ගත වී ඇති නමුත් මණ්ඩලය බලාපොරොත්තු වූ අරමුණ ඉටු වී නොතිබුණි. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.6 වගන්තියේ විධිවිධාන සැලකිල්ලට නොගෙන පිරිවිතරයන් සකස් කර මිල ගණන් කැඳවා තිබූ අතර මිලදිගත් ආයතනයේ අනුමැතියකින් තොරව නවීකරණය කර තිබුණි. තවද මෙම කාර්ය සඳහා ගන්නා ලද භාණ්ඩවල වසරක් සඳහා වූ වගකීම් කාලය අවසාන වී තිබීම, වත්කම හා එහි මිලදී උපාංගවල ආරක්ෂාව පිළිබඳව සැලකිලිමත් නොවීම. හා කාර්ය සාධන ඇපකරවල වලංගු කාලය ද ඉක්මවා ගොස් තිබීම යනාදී කරුණු මත රු.11,991,900 වැයක් දැරීමට යෝජිත මෙම මෙහෙයුම් කටයුත්ත ප්‍රශ්නගත බව විගණනයේදී නිරීක්ෂණය විය.	මෙම රථයෙහි වැඩ නිමකොට මේ වන විට මණ්ඩලයට භාර දී ඇත.මෙම රථය භාවිතා කර ඉදිරියේදී අලෙවි ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට සැලසුම සකසා තිබුණ ද මේ වන විට රටෙහි පවතින කොරෝනා වසංගත තත්ත්වය හේතුවෙන් මෙම කාලයෙහි සියලු ප්‍රවර්ධන වැඩසටහන් තාවකාලිකව නතර කර ඇත. රටෙහි තත්ත්වය යථාතත්වයට පත් වූ පසු එම අලෙවි ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට කටයුතු කරනු ලැබේ.
(ඈ) මණ්ඩලයේ ප්‍රධානතම මෙහෙයුම් කාර්යයක් වන ලොතරැයිපත් මුද්‍රණ කටයුතු 2017 වර්ෂයේ සිටම විධිමත් ප්‍රසම්පාදන සැලැස්මකට අනුව සිදුකර නොතිබූ අතර පවත්නා ගිවිසුම් කාලය අවසන් වීමට ලංවූ පසු ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භ කර තිබුණි. සාමාන්‍යයෙන් මාස 06 ක් පමණ ප්‍රසම්පාදන ක්‍රියාවලිය සිදු කරනු ලබන අතර එම නිසා පවත්නා ගිවිසුම් කාලයද මාස 06 ත් 08 ක් අතර කාලයක් දීර්ඝ කර තිබුණි. 2017 අගෝස්තු 01 දින සිට මේ දක්වාම මුද්‍රණ ආයතන දෙකක් පමණක් ඒ සඳහා තෝරා ගෙන තිබුණි.	ඒ අනුව දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව විසින් මේ සඳහා ලංසු කැඳවන ලද අතර එම ලංසු විවෘත කිරීම 2020.08.04 දින සිදු කර ඇත. එහෙත් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව විසින් තාක්ෂණික කරුණක් හේතු කොට ගෙන එම ලංසු කැඳවීම අවලංගු කොට ඒ සඳහා අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව මගින් නැවත ලංසු කැඳවීමට තීරණය කරන ලදී. ඒ අනුව මේ වන විට මේ සඳහා අමාත්‍යාංශ මණ්ඩලය පත්කළ ප්‍රසම්පාදන කමිටුව (SCAPL) මගින් ලංසු කැඳවීම සඳහා වන ලංසු ලියවිලි කට්ටලය තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් පිළියෙළ කර ඇති බවද දන්වා සිටිමි. ඒ අනුව ඔක්තෝම්බර් මස මුල් භාගයේදී මේ සඳහා ලංසු කැඳවීමේ හැකියාවක් පවතින බව දන්වා සිටිමි.
2.3 වෙනත් නිරීක්ෂණ (අ) විධිමත් සැලසුමකින් තොරව ප්‍රවර්ධන අයිතම මිලදි ගැනීම හේතුවෙන් රු.3,623,367 ක් වටිනා ප්‍රවර්ධන අයිතම කුඩ (පිරිමි), ටී ෂර්ට්, සෝලා ලාම්පු, කැප්, පොසිලේන් සෙට්, ජල පෙරන ගබඩාවේ තබාගෙන තිබුණි. මේ නිසා මණ්ඩලයේ ප්‍රවර්ධන තොග නැවත ඇණවුම්	මෙම අයිතම මිලදි ගෙන ඇත්තේ සැලසුමකට අනුවය. එනම්, එවකට වෙළඳපලට නිකුත් කිරීමට සැලසුම් කර තිබූ ක්ෂණික ලොතරැයිපත්වල තෑග සඳහා ඇතුළත් කල අයිතම ලෙසය. එහිදි එක් තරහ වර්ගයක් සඳහා (එක් ක්ෂණික ලොතරැයිපත් වර්ගයකට) මෙම අයිතම 5000ක් යොදා ගත් අතර ලොතරැයිපත වෙළඳපලට නිකුත් කිරීමට පෙර එම අයිතම මණ්ඩලයේ ගබඩාවේ තිබිය යුතු බැවින් කලින් ඇනවුම් කර ගබඩාවට ගෙන්වා ගෙන

	මට්ටම පිළිබඳ ප්‍රමාණවත් අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් අනුගමනය කරනු ලබන බව නිරීක්ෂණය නොවුණි.	තිබුණි. එම අයිතම සියල්ල ත්‍යාග භාණ්ඩ ලෙස වෙළඳපලට නිකුත් කල අතර එම ලොතරැයිපත් දිනුම් අතරින් ත්‍යාග සඳහා ඉදිරිපත් නොවූ ත්‍යාග අයිතම ප්‍රමාණයක් පමණක් ඉතිරි වී ඇත. ත්‍යාග ලෙස ලබා ගන්නා ලද අයිතම ලොතරැයිපතේ ත්‍යාග ප්‍රතිශතය ඇතුලත අඩංගු ඒවාය.තව ද, ඊට අමතරව අප විසින් ක්ෂණික ලොතරැයිපත් සහ විශේෂ ලොතරැයිපත් ප්‍රවර්ධන කටයුතු වෙනුවෙන් අලෙවි සහයිකයින් සඳහා ත්‍යාග ලෙස ලබා දීමට පහත පරිදි අයිතම මිලදි ගත් අතර එවැයින් යම් ප්‍රමාණයක් ගබඩාවේ ඉතිරිව ඇත්තේ පසුගිය වසර සිට පැවත එන කොවිඩ් වසංගතය හේතුවෙන් සැලසුම් කල ප්‍රවර්ධන කටයුත්තන් සිදු කිරීමට නොහැකි වූ බැවිනි.
(ආ)	2019 ඔක්තෝබර් 24 දින ටිකට්පත්හි ත්‍යාග රටාවන් පිළිබඳ සාකච්ඡා කිරීම වෙනුවෙන් පැවති රැස්වීමේදි ගබඩාවේ පවතින ජයග්‍රහණ සඳහා හිමිකම්පා නොමැති මාස 06 ක කාලය ඉක්ම වූ ත්‍යාග ඉදිරි තරග සඳහා යොදාගැනීමට මණ්ඩලය විසින් තීරණය කර තිබුණි. ඒ අනුව 2018 වර්ෂයේ මිලදී ගත් රු.529,850 ක් වටිනා යතුරු පැදි 02 ක් 2019 දෙසැම්බර් මස වෙළඳ පොලට හඳුන්වා දෙන ක්ෂණික ලොතරැයිපතේ ත්‍යාගයක් ලෙස හා 2020 පෙබරවාරි ලග්න වාසනාව විශේෂ දිනුම් ඇදීමේ ත්‍යාග ලෙස ලබාදීමට අවශ්‍ය කටයුතු කරන මෙන් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අලෙවි) වෙත උපදෙස් ලබා දී තිබුණද එම යතුරු පැදි 02 ම විගණිත දිනය වූ 2021 පෙබරවාරි 12 වන දින වන විටත් ගබඩාවේ පවතින බව භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.	ඉන් එක් අයිතමයක් එනම්, Honda CD 11 වර්ගයේ යතුරුපැදියක් ලග්න වාසනා විශේෂ ලොතරැයිපත සඳහා යොදා ගත් අතර ක්ෂණික ලොතරැයිපත සඳහා යොදා ගැනීමට යෝජනා වූ අයිතම 2020 මුල කාලයේදි ක්ෂණික ලොතරැයිපත සඳහා යොදා ගත්තද, කොවිඩ් වසංගතය හේතුවෙන් එම ලොතරැයිපත් මුද්‍රණය කිරීම තාවකාලිකව නතර කරන ලදි. ඉදිරියේදි මෙම අයිතම නැවත එම ප්‍රවර්ධන කටයුතු සඳහා යොදා ගැනීමට කටයුතු කරනු ලැබේ.
(ඇ)	භාවිතයට නොගෙන රඳවා තබාගෙන ඇති රු.592,500 වටිනා ත්‍යාග වවුචර්පත් 123 ම වසර 12 ක කාලයක් තුල මණ්ඩලය විසින් ප්‍රයෝජනයට	මෙහි සඳහන් වටිනාකම ඇති වවුචරපත් යාවත්කාලීන කර ගැනීම වෙනුවෙන් වෙළඳ අමාත්‍යාංශයේ ලේකම්තුමියගේ ප්‍රධානත්වය යටතේ සතොස ආයතනය සමඟ සාකච්ඡා පැවැත්වූ අතර එහිදී සතොස ආයතනය සතුව අදාල

	නොගෙන රඳවා තබාගෙන ඇති බව නිරීක්ෂණය විය. මින් රු.7,500 වටිනාකමින් යුත් වවුවර්පත් 07 ක් 2019 අගෝස්තු 31 දිනට කල් ඉකුත්වී තිබුණි. තවද රු.585,000 වටිනාකමින් යුත් රු.5,000 වවුවර්පත් 117 ක් පැවති අතර එම වවුවර්පත් වල කල් ඉකුත් වීමේ දිනය සඳහන් නොවන නමුත්, ඒවා 2009 වර්ෂයේදී මිලදී ගත් වවුවර්පත් වන බැවින් ඒවා මිලදී ගෙන වර්ෂ 12 ගත වී ඇත. එබැවින් ඉදිරි ත්‍යාග ලබාදීමේ කටයුතු වලදී මෙම වවුවර්පත් භාවිතයට ගැනීමේ හැකියාවේ අවිනිශ්චිත භාවයක් පවතින බව විගණනයේදී නිරීක්ෂණය විය.	තොරතුරු නොමැති වූ හෙයින් ඊට අදාල සියළු තොරතුරු සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් ලබාදෙන ලදී. ඒ අනුව වෙළඳ අමාත්‍යාංශය විසින් සතොස ආයතනය වෙත ලිඛිතව දන්වා ඇත්තේ එකී මුදල සංවර්ධන ලොතරැයි මණ්ඩලය වෙත නැවත ගෙවීමට කටයුතු කරන ලෙසයි. ඉදිරියේදී එය මණ්ඩලය වෙත ලැබීමට නියමිතය.
(ඈ)	2020 ජනවාරි 30 දින ප්‍රසම්පාදන කමිටු නිර්දේශ අනුව සුපර්බෝල් විශේෂ දිනුම් ඇදීමේ ස්කූටි සැපයීම සඳහා තෝරාගනු ලැබූ ජයග්‍රාහී ලංසුකරුට එදිනම භාණ්ඩ ඇණවුම් නියෝග නිකුත් කර තිබුණි. එහෙත් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.7.1 (ආ) වගන්තිය ප්‍රකාරව කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා ලංසුවේ වලංගු කාලය ඇතුලත කොන්ත්‍රාත් ප්‍රදානය පිළිබඳ අවසාන තීරණය ගනු ලැබූ විගස ප්‍රතිග්‍රහණ ලිපියක් අදාල සැපයුම්කරු වෙත නිකුත් කර නොතිබුණි. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.10 ප්‍රකාරව කාර්ය සාධන සුරක්ෂණ ඉදිරිපත් කිරීමට හා 8.9.1 ප්‍රකාරව කොන්ත්‍රාත් ගිවිසුම් අත්සන් කිරීමට ද කටයුතු කර නොතිබුණි.	ත්‍යාග ලෙස ලබා දීම වෙනුවෙන් යතුරුපැදි මිළට ගැනීමේදී ඒවා එක වර මිළට ගෙන ගබඩා කර තබා ගැනීම අවම කර ඇති අතර ඊට හේතුව වන්නේ සියළුම ත්‍යාග සඳහා ජයග්‍රාහකයින් ඉදිරිපත් නොවීම මත ඉතිරි වන යතුරු පැදි ගබඩා කර තබා ගැනීමේදී ඒවායේ කොටස් මළ බැඳීම, මොඩලයන් පැරණි වීම, නිෂ්පාදිත වර්ෂය පැරණි වීම හා භෞතික අලාභ හානි සිදු වීම වේ. එබැවින් සියළුම යතුරුපැදි එකවර මිළට ගැනීම සිදු නොකෙරේ. ජයග්‍රාහකයින් ඉදිරිපත් වන ආකාරයට අවශ්‍ය යතුරුපැදි ප්‍රමාණය පමණක් වෙන වෙනම ඇණවුම් කර ලබා ගන්නා අතර සාමාන්‍ය වෙනත් ප්‍රසම්පාදනයක් සේ එකවර ලංසු පැවරීම් කොට ගිවිසුම් අත්සන් කිරීම ඉහත කරුණු හේතු කොට ගෙන සිදු කොට නොමැති බව දන්වා සිටිමි. එකවර සියළුම යතුරුපැදි සඳහා ලංසු පැවරුවහොත් එම මුළු ප්‍රමාණය මිළට ගැනීමට මණ්ඩලය ගිවිසුම්ගත වන බැවින් මෙලෙස කටයුතු කර ඇති බව දන්වා සිටිමි.
(ඉ)	මණ්ඩලය විසින් රු.3,275,246 ක වියදමක් දරා Sweep App හරහා ලොතරැයිපත් නිකුත් කිරීම සඳහා කටයුතු කර තිබුණ ද පෞද්ගලික ආයතනයක් විසින්	Sweep app. සඳහා ලොතරැයිපත් නිකුත් කිරීමේදී ඒ සඳහා ලබාගනු ලබන ලොතරැයිපත් ප්‍රමාණය නිශ්චිතව නොදැක්වීම හා එම ඊ ටිකට්පත් සඳහා අමතර රක්ෂණාවරණයක් ලබාගතයුතු හෙයින් එම රක්ෂණ පිරිවැය ඉහල අගයක් ගැනීම මත Oracle

	මුද්‍රණය කරන ලද ලොතරැයිපත් එම පහසුකම් ඔස්සේ ලබාදීමට එකඟ වී නොතිබුණි. තවද අමතර මුද්‍රණ යන්ත්‍ර කිසිවක් නොමැතිවීම මෙන්ම මුද්‍රණ දෝෂ සහිතව දිගින් දිගටම ලොතරැයිපත් මුද්‍රණය කර තිබීම යන අඩුපාඩු තිබියදීත් එම ආයතනය සුදුසුකම් සපුරා ඇති ආයතනයක් ලෙස පිළිගැනීම විගණනයේදී ප්‍රශ්නගත කරුණක් විය.	International ආයතනය විසින් එම ඊ ටිකට්පත් සැපයීම සිදු කර නොමැත. කෙසේ වෙතත් Oracle සමාගම මේ වන විටත් මණ්ඩලයේ ටිකට්පත් සැපයුම් කරුවකු වන බැවින් හා Oracle සමාගම සාර්ථක සැපයුම්කරුවකු ලෙස සඳහන් කිරීමට නොහැකි තරමටම සැපයීම් දුර්වලතා නොමැති බැවින් තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් Oracle සමාගම සාර්ථක ලංසු කරුවකු බවට හඳුනාගෙන ඇත.
(ඊ)	ප්‍රසම්පාදන හා තාක්ෂණික ඇගයීම් කමිටු තීරණ හේතුවෙන් 2017 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා ලොතරැයිපත් මුද්‍රණයේදී මණ්ඩලයට දැරීමට සිදුවූ මුළු අතිරික්ත වියදම රු.72,479,000 ක් විය.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව යම් ප්‍රසම්පාදනයකට අදාල නිර්දේශයන් ඉදිරිපත් කිරීම තාක්ෂණික ඇගයීම් කමිටුව හා ප්‍රසම්පාදන කමිටුව විසින් සිදු කරනු ලබයි. එබැවින් එම කමිටු නිර්දේශ ප්‍රකාරව ලංසු පැවරීම සිදුවන හෙයින් විගණනය විසින් දක්වා ඇති පරිදි අතිරික්ත වියදමක් දැරීමට සිදුව නොමැත.
(උ)	අලෙවි ප්‍රවර්ධන නිලධාරීන් භාවිතා කරන ලද පිරිවැය රු.1,352,610.58 ක් වූ යතුරු පැදි 07 ක් වසර 02 මාස 11 අධික කාලයක් කාර්යාල පරිශ්‍රයේ රථගාල තුල ප්‍රයෝජනයට නොගෙන ගබඩාවේ රඳවා තබා තිබුණි.	ඉදිරි කාල වකවානුව තුළ මෙම යතුරු පැදි විධිමත් අපහරණ ක්‍රියාවලිය තුලින් අපහරණය කරණු ඇත.
(ඌ)	මණ්ඩලය සතු වාහන හා මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ මණ්ඩලය නමින් ලියාපදිංචි වී ඇති වාහන එකිනෙක සැසඳීමේදී මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ මණ්ඩලය නමින් ලියාපදිංචි වී ඇති වාහන 37ක් මණ්ඩලයේ ස්ථාවර වත්කම් ලේඛනයේ ඇතුලත් නොවන බව නිරීක්ෂණය විය.	මණ්ඩලය සතුව පැවති එහෙත් අපහරණය කල ඇතැම් මෝටර් රථ විධිමත් ටෙන්ඩර් පටිපාටිය ඔස්සේ බාහිර පුද්ගලයන්ට හෝ ආයතනයන්ට අලෙවි කර ඇත. එබැවින් එවැනි අවස්ථා වලදී එම මෝටර් රථ මිළදී ගන්නා ලද පාර්ශවයන් විසින් පැවරීම ඔවුන්ගේ නමට සිදුකරගෙන නොමැති තත්ත්වයක් නිසා මෙය සිදුවී ඇති බව නිරීක්ෂණය වේ. කෙසේ නමුත් ඉදිරියේදී මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවෙන් වාර්ථාවක් ලබාගැනීමෙන් පසුව මේ පිළිබඳව සොයාබලා අපහරණ ක්‍රියාවලිය මඟින් ටෙන්ඩර් කරන ලද මෝටර් රථ මිළදී ගත් පාර්ශවයන් සම්බන්ධව ක්‍රියා කිරීමට අපේක්ෂා කරන්නෙමු.
(එ)	2020 වර්ෂයේ මාර්තු සිට ජූලි දක්වා කාල පරිච්ඡේදය සැලකීමේදී කොරෝනා රෝගය පැතිර යෑම හේතුවෙන් මණ්ඩලයේ අලෙවි ආදායම	මෙහිදී මෙම අලෙවිය අඩුවීම අවම කරගැනීමේ පියවරක් ලෙස මණ්ඩලය විසින් වෙළඳපලට නිකුත් කරනු ලැබූ ලොතරැයිපත්වල දිනුම් අදින දිනය වෙනස් කිරීම, ශනිදා, සුපර් බෝල් ලොතරැයිපත් දිනපතා දිනුම් ඇදීම, සසිරි නමින්

	2019 වර්ෂයේ එම කාලපරිච්ඡේදයට සාපේක්ෂව රු.3,124,722,840 කින් හෙවත් සියයට 45 කින් පහත වැටී ඇති බව නිරීක්ෂණය විය.	නව ලොතරැයිපතක් හඳුන්වා දීම. ඩිජිටල් ලොතරැයිපත් ලෙස DLB Sweep App එක හඳුන්වා දීම සහ SMS ලොතරැයිපතක් හඳුන්වා දීම සිදු කරන ලදි. තවද, මෙම වසංගත තත්වයේදී මණ්ඩලයට විශාල අභියෝගයක් වුයේ, දිවයින පුරා ටිකට්පත් බෙදාහැරීම සම්බන්ධවයි.මෙයට විකල්ප ක්‍රියාමාර්ගයක් වශයෙන් මණ්ඩලය සතු වාහන වලින් දිවයින පුරා ටිකට්පත් බෙදාහැරීමේ කටයුතු සිදු කරන ලදි.නැවත පැමිණි දෙවන කොරෝනා හමුවේ වුවද ඒ ඒ තත්වයන් වලට සාපේක්ෂව අලෙවියේ සැලකිය යුතු මට්ටමක පවත්වා ගැනීමට මණ්ඩලයට හැකි විය.
(ඒ)	ත්‍යාග අයිතම් අතුරින් මිලදිගෙන වර්ෂ 02 ඉක්ම වූ රු.548,224 ක් වටිනා ජංගම දුරකථන 08 ක හා ටැබ් පරිගණක 04 ක වගකීම් කාලය ඉක්මවා තිබූ අතර රු.32,510 ක් වටිනා මවුන්ටන් බයිසිකල් 02 ක් හා ලී රූපවාහිනී රඳවනයක් භාවිතයට ගත නොහැකි මට්ටමේ පවතින බව භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. මින් දුරකථන 03 ක්, ටැබ් පරිගණක 04 ක් හා මවුන්ටන් බයිසිකල් 02 ක් 2019 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණය මඟින් විකිණීම සඳහා හඳුනාගෙන තිබුණ ද විගණිත දිනය වූ 2021 පෙබරවාරි 12 වන විටත් එම නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබූ බව නිරීක්ෂණය විය.	මෙම අයිතම ඉදිරියේදි වෙන්දේසියට ඉදිරිපත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය (අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අංක 2021/04/1792) ලබා ගෙන ඇති අතර ඒ අනුව කටයුතු කරමින් පවතී.
(ඔ)	2016 වර්ෂයට පෙර සිට ගබඩාවේ පැවති භාවිතා නොකළ නමුත් ප්‍රයෝජනයට ගත නොහැකි මට්ටමේ පැවති රු.505,407 ක් වටිනා ප්‍රවර්ධන අයිතම් 10 කට අදාළ භාණ්ඩ 119 ක් වෙන්දේසි කිරීමට පාලන අංශයට භාරදී තිබූ අතර ඉන් රු.325,569 ක් වටිනා අයිතම් 07 කට අදාල භාණ්ඩ 76 ක් වෙන්දේසි කොට 2020 වර්ෂයේදී රු.38,954 ක් උපයා තිබුණි. ඒ අනුව භාවිතයට ගනු නොලැබූ ප්‍රවර්ධන අයිතම් හේතුවෙන් රු.286,615 ක් එනම්	2016 වර්ෂයේ මිල දී ගෙන එම අයිතම ගබඩාවේ වසර 04කට අධික කාලයක් පැවතීම නිසා එම අයිතම මිල දී ගත් මුදලට වෙන්දේසි කිරීමේ හැකියාවක් නොමැත. එයට හේතු ලෙස වෙළඳපල වටිනාකම අඩුවීම, ගුණාත්මකභාවය අඩුවීම සහ එම අයිතම යල් පැන යාම පෙන්වා දිය හැක. එම නිසා මෙවැනි භාණ්ඩ අයිතම වෙන්දේසියක අරමුණ වන්නේ භාවිතයට ගත නොහැකි අයිතම වෙන්දේසි කර ආයතනයට සිදු වන පාඩුව අවම කිරීමකි. එබැවින් ඔබ සඳහන් කල මුදල වන රු.286,615/-ක පාඩුවක් සිදු වී ඇත.

	සියයට 88 ක පාඩුවක් මණ්ඩලයට ඇති වී තිබූ බව නිරීක්ෂණය විය.	
(ඕ)	මණ්ඩලය විසින් 1990 වර්ෂයේ වෝඩ් පෙදෙසේ පුද්ගලයෙකු සමඟ ඇති කරගෙන තිබූ කුලී ගිවිසුම ප්‍රකාරව එම පුද්ගලයා වෙත ලබාදී තිබූ රු.2,520,000 ක ගොඩනැගිලි කුලි තැන්පතු මුදලක් නැවත අයකර දෙන ලෙස ඉල්ලා අවුරුදු 23 කට පෙර ගොනු කර තිබූ නඩුවේ තීන්දුව 2016 ජනවාරි 11 දින ලැබී තිබූ අතර එහිදී තීන්දුකර තිබුණේ අදාල මුදල අයකර ගැනීමට වුවත් තීන්දුව ලැබී දැනට වසර 05 කට ආසන්න කාලයක් ගතවී ඇතත් අදාල මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.	1990 වර්ෂයේ වෝඩ් පෙදෙසේ පුද්ගලයෙකු සමග ඇති කරගෙන තිබූ කුලී ගිවිසුමකට අනුව මණ්ඩලයට අයවිය යුතුව ඇති 25,20,000/-ක මුදල අයකර ගැනීම සඳහා අවශ්‍ය නීතිමය කටයුතු මේ වන විටත් සිදු කර ඇති අතර නඩුව ගොනු කරන ලද දිසා අධිකරණය නඩුවේ ප්‍රගතිය අප වෙත ඉදිරියේ දී දැනුම් දෙන බව දන්වා ඇත. ඒ අනුව අධිකරණය මගින් අදාල පාර්ශවය වෙත මෙම මුදල් ලබාදෙන ලෙස එන්තරවාසියක් මේ වන විට යොමු කර ඇත.
(ක)	2013 වර්ෂයේ අවස්ථා 3 කදි රු 2,877,144 ක් සහ 2014 වර්ෂයේදී රු.749,583ක් ලෙස එකතුව රු.3,626,727 ක මුදලක් පෞද්ගලික ආයතනයක් වෙත උපදේශන ගාස්තු ලෙස අත්තිකාරම් වශයෙන් ගෙවා තිබුණි. වසර 7 - 8 ක කාලයක් බාහිර පාර්ශවයක් අත රඳවා තිබෙන මෙම මුදල ලබා ගැනීමට කටයුතු කර නොතිබූ බව නිරීක්ෂණය විය.	2014 වර්ෂයේ දී Archtype ආයතනයට ගොඩනැඟිලි නවීකරණය කිරීම සඳහා අවශ්‍ය වන සැලසුම් සකස් කිරීම හා ගෘහ නිර්මාණ සකස් කිරීම වෙනුවෙන් රු.36,26,727/-ක අත්තිකාරම් මුදලක් ගෙවා ඇත. නමුත් මෙම නවීකරණ කටයුතු පසුව සිදු නොකිරීමට තීරණය කර ඇත. මෙම ප්‍රසම්පදනයට අදාල ලිපිගොනු අල්ලස් හා දූෂණ කොමිසම් සභාව භාරයට ගෙන විමර්ශනයක් සිදු කරනු ලබයි.
(ග)	2020 දෙසැම්බර් 31 දිනට මණ්ඩලය සතු එකතුව රු 270,749,417 ක මුදලක් ඒක්ෂණ තැන්පතු ගිණුමක තැන්පත් නොකර ජංගම ගිණුම් 06 ක රඳවා තබාගෙන තිබුණි.	මෙම මුදල් ත්‍යාග ගෙවීම් වෙනුවෙන් එකතුවන්නා වූ මුදල් වන අතර මෙම මුදල් අපගේ ජංගම ගිණුම් වල රඳවා නොගෙන සත් දින ඒක්ෂණ ගිණුම් වල රඳවනු ලැබේ. එසේ සත් දින ඒක්ෂණ ගිණුමෙහි මුදල් රඳවා තැබීමෙන් මණ්ඩලයට අමතර ආදායමක් ජනිත වේ. එසේම මෙම මුදල් මණ්ඩලයේ අවශ්‍යතාවය පරිදි හා කුමන අවස්ථාවකදී කොපමණ ජයග්‍රාහකයන් සංඛ්‍යාවක් ඉදිරිපත් වේද යන්න අප නොදන්නා බැවින් එම මුදල් කෙටි කාලීන ආයෝජන වශයෙන් වත් නොරඳවා ඉහත කී ආකාරයෙන් සත් දින ඒක්ෂණ ගිණුමක රඳවනු ලැබේ.

විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය

දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා		2020 රු.	2019 රු.
ආදායම	01	**15,033,029,360**	17,065,414,012
ටිකට්පත් පිරිවැය	02	**451,308,013**	460,097,151
ත්‍යාග ගෙවීම	03	**7,702,515,219**	8,903,494,383
ඩිනුම් ඇදීමේ පිරිවැය	04	**509,983,411**	584,074,507
දළ ලාභය		**6,369,222,716**	7,117,747,971
වෙනත් ආදායම්	05	**158,323,671**	193,820,035
බෙදාහැරීම් පිරිවැය	06	**3,357,266,425**	4,219,036,579
පරිපාලන වියදම්	07	**506,926,732**	541,799,568
මෙහෙයුම් වියදම්වලින් පසු අතිරික්තය		**2,663,353,230**	2,550,731,860
මූල්‍ය පිරිවැය	08	**382,172**	438,396
ලබා නොගත් ත්‍යාග		**330,530,580**	346,837,460
බදු පෙර ලාභය		**2,993,501,638**	2,897,130,924
ආදායම් බදු	09	**10,921,555**	235,073,385
ආදායම් බදු ගෙවීමෙන් පසු ලාභය	10	**2,982,580,083**	2,662,057,539
වෙනත් විස්තීර්ණ ආදායම්			
සේවක ප්‍රතිලාභ සැලසුම් ආයුගණක ලාභ/(පාඩු)	17.1	**(3,139,116)**	6,735,128
ප්‍රත්‍යාගණන අතිරික්තය		**39,213,944**	
වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම		**3,018,654,911**	2,668,792,667

ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අත්‍යාවශ්‍ය කොටසක් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකීමට බැඳී සිටී. මෙම මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද අතර ඔවුන් වෙනුවෙන් අත්සන් කරන ලදී.

ඩබ්.ඒ.වී.සී. සෝමරත්න
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මූල්‍ය)

අමිත කේ. ගමගේ
සභාපති/ප්‍ර.වි.නි.

ජෙනට් ජයවර්ධන
අධ්‍යක්ෂ

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා		2020 රු.	2019 රු.
වත්කම්			
ජංගම නොවන වත්කම්	11		
දේපළ, පිරියත සහ උපකරණ		**1,192,868,608**	1,221,373,015
ප්‍රාග්ධන නොනිමි වැඩ		**37,729,237**	14,665,947
අස්පෘශ්‍ය වත්කම්	11	**6,051,604**	9,549,182
		1,236,649,449	1,245,588,144
සේවක ප්‍රතිලාභ වත්කම්	17		7,038,067
මුළු ජංගම නොවන වත්කම්		**1,236,649,449**	1,252,626,211
ජංගම වත්කම්			
තොග	13	**32,590,632**	51,026,204
වෙළඳ ණයගැතියෝ සහ වෙනත් ලැබිය යුතු	14	**92,541,218**	126,012,880
පූර්ව ගෙවීම් සහ තැන්පතු	15	**8,197,378**	5,212,271
ස්ථාවර තැන්පත්	12	**1,338,731,761**	1,451,307,572
මුදල් සහ මුදල් හා සමාන දෑ	16	**541,662,763**	795,666,048
මුළු ජංගම වත්කම්		**2,013,723,752**	2,429,224,975
මුළු වත්කම්		**3,250,373,201**	3,681,851,186
ස්කන්ධය සහ වගකීම්			
ද්‍රායකත්ව ප්‍රාග්ධනය			
ජනාධිපති අරමුදල		**2,200,000**	2,200,000
මහපොල භාර අරමුදල		**2,200,000**	2,200,000
ත්‍යාග සංචිත ගිණුම		**698,558,607**	1,103,197,285
ජනාධිපති අරමුදලට ගෙවිය යුතු		**685,860,083**	477,792,667
ප්‍රත්‍යාගණන අතිරික්තය		**614,729,237**	575,515,293
සේවක ප්‍රතිලාභ සැලසුම් ආයුගණක ලාභ/(පාඩු)		**(3,139,116)**	
මුළු හිමිකම		**2,000,408,811**	2,160,905,245
ජංගම නොවන වගකීම්			
සේවක ප්‍රතිලාභ වගකීම්	17	**3,636,437**	
ගෙවිය යුතු අලෙවි නියෝජිත හා බෙදාහැරීමේ අලෙවි නියෝජිත තැන්පතු	18	**36,390,381**	36,110,381
මුළු ජංගම නොවන වගකීම්		**40,026,818**	36,110,381
ජංගම වගකීම්			
වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු	19	**516,032,675**	563,493,496
ගෙවිය යුතු ත්‍යාග	20	**578,618,857**	760,794,203
ගෙවිය යුතු ණය වට්ටම්		**115,286,040**	160,547,860
මුළු ජංගම වගකීම්		**1,209,937,573**	1,484,835,560
මුළු හිමිකම් සහ වගකීම්		**3,250,373,201**	3,681,851,186

ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අත්‍යාවශ්‍ය කොටසක් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකීමට බැඳී සිටී. මෙම මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද අතර ඔවුන් වෙනුවෙන් අත්සන් කරන ලදී.

ඩබ්.ඒ.වී.සී. සෝමරත්න
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මූල්‍ය)

අමිත කේ. ගමගේ
සභාපති/ප්‍ර.වි.නි.

ජෙනට් ජයවර්ධන
අධ්‍යක්ෂ

මුදල් ප්‍රවාහ ප්‍රකාශය

දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා		2020 රු.	2019 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම් තුළින් සිදුවූ මුදල් ප්‍රවාහ			
බදු පෙර ලාභය		**2,993,501,638**	2,897,130,924
ගැළපීම්			
ස්ථාවර වත්කම් මත අගය ක්ෂය කිරීම		**81,003,610**	80,242,809
ත්‍යාග සංචිත ගිණුම		**(404,638,678)**	132,151,335
පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන		**8,615,668**	8,395,852
ගෙවන ලද පාරිතෝෂික		**(612,535)**	(1,031,009)
පොළී ආදායම		**(151,670,804)**	(173,307,868)
ස්ථාවර වත්කම් විකිණීමෙන් ලැබුණු ලාභය		**(501,217)**	-
ගෙවන ලද ආදායම් බදු			(27,382,719)
ගෙවන ලද පෙර වර්ෂ සඳහා ආදායම් බදු		**(88,020,107)**	(190,444,919)
ජනාධිපති අරමුදලට ගෙවන ලද මුදල්		**(2,774,512,667)**	(2,428,466,297)
කාරක ප්‍රාග්ධන වෙනස්වීම්වලට පෙර මෙහෙයුම් ලාභය		**(336,835,092)**	297,288,108
මෙහෙයුම් වත්කම්වල වැඩිවීම/අඩුවීම			
බඩු තොග වැඩිවීම/අඩුවීම		**18,435,572**	29,314,446
ණය ගැතියන් වැඩිවීම/අඩුවීම		**41,830,116**	43,362,714
තැන්පතු හා පෙරගෙවුම් අඩුවීම		**(2,985,107)**	6,421,509
මෙහෙයුම් වගකීම් වැඩිවීම/අඩුවීම			
ණය හිමියන් වැඩිවීම		**888,914**	(140,214,430)
ගෙවිය යුතු ත්‍යාග වැඩිවීම/අඩුවීම		**(182,175,346)**	111,959,087
ණය වවුචර් අඩුවීම		**(45,261,820)**	66,274,100
මෙහෙයුම් ක්‍රියාකාරකම් තුළින් සිදුවූ ශුද්ධ මුදල් ප්‍රවාහ		**(506,102,763)**	414,405,534
කාර්ය මණ්ඩලයෙන් ණය ලැබීම්		**16,751,788**	
කාර්ය මණ්ඩලයට ණය ගෙවීම්		**(25,110,242)**	
ස්ථාවර තැන්පත් වීකතු කිරීම් (දේපළ, පිරියත සහ උපකරණ)		**(4,102,154)**	(15,882,721)
ස්ථාවර තැන්පත් බැහැරකිරීම් (දේපළ, පිරියත සහ උපකරණ)			
ස්ථාවර වත්කම් අලෙවි කිරීමෙන් ලැබුණු ලාභය		**501,217**	
පොළී ආදායම		**151,670,804**	173,307,868
ස්ථාවර තැන්පතු වල ආයෝජන		**112,108,066**	(238,562,026)
නියෝජිත හා බෙදාහරින්නන්ගේ තැන්පතු වල වැඩි වීම		**280,000**	715,000
ආයෝජන ක්‍රියාකාරකම් තුළින් සිදුවූ ශුද්ධ මුදල් ප්‍රවාහ		**252,099,478**	(80,421,879)
		(254,003,285)	333,983,655
මුදල් සහ මුදල් හා සමාන දේ ශුද්ධ මුදල් වැඩිවීම/අඩුවීම		**(254,003,285)**	333,983,655
වර්ෂය ආරම්භයේදී මුදල් සහ මුදල් හා සමාන දේ		**795,666,048**	461,682,393
වර්ෂය අවසානයේදී මුදල් සහ මුදල් හා සමාන දේ	16	**541,662,763**	795,666,048
බැංකුවේ ඇති මුදල් ලංකා බැංකුව		**326,599,529**	485,654,516
මහජන බැංකුව		**208,778,128**	268,621,669
සම්පත් බැංකුව		**5,486,920**	41,373,458
හැටන් නැෂනල් බැංකුව		**783,781**	
අත ඇති මුදල		**14,404**	16,404
		541,662,763	795,666,048

ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය

2020 දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා	ජනාධිපති අරමුදල සහ මහපොල භාර අරමුදල	ත්‍යාග සංචිත ගිණුම	රඳවාගත් ඉපැයීම්	ප්‍රත්‍යාගණන සංචිතය	සේවක ප්‍රතිලාභ සැලසුම් නැවත මැනීම මත ලාභ/(පාඩු)	එකතුව
	රු.	රු.	රු.	රු.	රු.	රු.
2019.01.01 දිනට ශේෂය	4,400,000	971,045,950	237,466,297	-		1,212,912,247
වර්ෂය තුළ එකතු කිරීම්		132,151,335	2,668,792,667			2,800,944,001
ප්‍රත්‍යාගණන සංචිතය				575,515,293		575,515,293
ජනාධිපති අරමුදලට විසර්ජනය කිරීම			(2,428,466,297)			(2,428,466,297)
2019.12.31 දිනට ශේෂය	4,400,000	1,103,197,285	477,792,667	575,515,293		2,160,905,245
වර්ෂය තුළ එකතු කිරීම්		(404,638,678)	2,982,580,083	39,213,944	(3,139,116)	2,614,016,233
ජනාධිපති අරමුදලට විසර්ජනය කිරීම			(2,774,512,667)			(2,774,512,667)
2020.12.31 දිනට ශේෂය	**4,400,000**	**698,558,607**	**685,860,083**	**614,729,237**	**(3,139,116)**	**2,000,408,810**

ගිණුම්කරණ ප්‍රතිපත්ති

1. වාර්තාකරණ ආයතනය

සංවර්ධන ලොතරැයි මණ්ඩලය 1997 අංක 20 දරණ සංවර්ධන ලොතරැයි මණ්ඩල පනත යටතේ සංස්ථාගත කරන ලදී. මණ්ඩලයේ ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය අංක 356, ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා මාවත, යුනියන් පෙදෙස, කොළඹ 02 වේ. මෙම වර්ෂය තුළ දී මණ්ඩලයේ ප්‍රධානතම ක්‍රියාකාරකම වූයේ ලොතරැයි අලෙවි කිරීමයි.

2. සකස් කිරීමේ පදනම

2.1 අනුකූලතා ප්‍රකාශනය

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය විසින් නිකුත් කරනලද, මෙහි මින් මත SLFRS/LKAS යනුවෙන් හඳුවන්වනු ලබන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට සහ ශ්‍රී ලංකා රජයේ මූදල් රෙගුලාසි වල සහ පරිපාලන රෙගුලාසි වල සඳහන් නියමයන්ට අනුකූලව මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත.

2.1. මිනුම් කිරීමේ පදනම

පහතින් දක්වා ඇති පරිදි හැරෙන්නට මෙම මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය පදනමින් සකස් කර ඇත:

ස්ථාවර තැන්පතු මත ආයෝජන

- සාධාරණ වටිනාකමට

ඉඩම් සහ ගොඩනැගිලි

- ප්‍රත්‍යාගණනය කළ වටිනාකමට

පාරිතෝෂික සඳහා වෙන්කිරීම්

- පාරිතෝෂික සූත්‍රය සහ නිර්වචිත ප්‍රතිලාභ බැඳීමෙහි වර්තමාන වටිනාකමට

2.3. ක්‍රියාකාරී සහ ඉදිරිපත් කිරීමේ මුදල් ඒකකය

මෙම මූල්‍ය ප්‍රකාශන මණ්ඩලයේ ක්‍රියාකාරී මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර ඇත. ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර ඇති සියලුම මූල්‍ය තොරතුරු ආසන්න රුපියලට වටයා ඇත.

2.4. නිකුත් කිරීම සඳහා අවසර ලබා දුන් දිනය

2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වන මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීමට 2021 පෙබරවාරි 23 වැනි දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අවසර දී ඇත.

2.5. ඇස්තමේන්තු හා විනිශ්චයන් යොදා ගැනීම

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා කළමනාකාරිත්වය විසින් ගිණුම්කරණ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට සහ වාර්තා කරනු ලබන වත්කම්, වගකීම්, ආදායම් සහ වියදම් ප්‍රමාණයන්ට බලපාන විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පන සිදු කළ යුතු වේ. විනිශ්චයන් සහ ඇස්තමේන්තු ඓතිහාසික අත්දැකීම් සහ පවතින වාතාවරණයන් යටතේ සාධාරණ යැයි විශ්වාස කෙරෙන අපේක්ෂාවන් ද ඇතුළු අනෙකුත් සාධක මත පදනම්ව සිදු කර ඇත. එබැවින් සැබෑ ප්‍රතිඵල මෙම විනිශ්චයන් හා ඇස්තමේන්තු වලට වඩා වෙනස් විය හැකිය.

ඇස්තමේන්තු සහ පාදක වී ඇති උපකල්පන අඛණ්ඩ පදනමකින් සමාලෝචනය කරනු ලැබේ. ඇස්තමේන්තු සංශෝධනය කරනු ලබන කාල පරිච්ඡේදය තුළ සහ එය බලපාන ඕනෑම අනාගත කාල පරිච්ඡේදයක් තුළ ගිණුම්කරණ ඇස්තමේන්තු සඳහා වන සංශෝධන හඳුනා ගනු ලැබේ.

2.6. ප්‍රමාණවත් බව හා සමාහරණය

මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 01 ට අනුකූලව සෑම සමාන අයිතම වර්ගයක් ම මූල්‍ය ප්‍රකාශනවල වෙන වෙනම ඉදිරිපත් කරනු ලැබේ. ස්වභාවයෙන් හෝ කාර්යයෙන් අසමාන අයිතම ද වීවා වැදගත් වේ නම් වෙන වෙනම ඉදිරිපත් කරනු ලැබේ. හඳුනාගන්නා ලද ප්‍රමාණයන් හිලව් කිරීම සඳහා නීත්‍යානුකූලව හිලව් කළ හැකි අයිතියක් ඇති විට සහ ශුද්ධ පදනමකින් පියවීම සඳහා හෝ එක විට වත්කම උපලබ්ධි කර වගකීම පියවීමට අභිප්‍රායයක් ඇති විට පමණක් මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම් හිලව් කර ශුද්ධ අගය මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වාර්තා කරනු ලැබේ. කිසියම් ගිණුම්කරණ ප්‍රමිතියක් හෝ අර්ථ නිරූපණයක් මගින් නියම කර හෝ අවසර දී ඇත්තේ නම් මිස, සහ ගිණුම්කරණ ප්‍රතිපත්තිවල විශේෂිත වශයෙන් අනාවරණය කර ඇති පරිදි, ආදායම සහ වියදම් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයෙහි හිලව් නොකරනු ලැබේ.

2.7. ආදායම් බදු

මණ්ඩලය ආදායම් බදු වලට සහ අගය එකතු කළ බද්ද හා ජාතිය ගොඩනැගීමේ බද්ද ඇතුළු අනෙකුත් බදු වලට යටත් වේ. මූල්‍ය ප්‍රකාශනවල ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත අනුගත කර ගැනීම පිළිපැදීම පිළිබඳ බදු මාර්ගෝපදේශ නිකුත් කරන තුරු ප්‍රවර්තන සහ අනෙකුත් බදු සඳහා වන මුළු ප්‍රතිපාදන පිළිබඳව සහ බදු පැනවීමේ කාර්යය සඳහා බදු අය කළ හැකි ලාභය පිළිබඳව තීරණය කිරීම සඳහා සැලකිය යුතු විනිශ්චයක් අවශ්‍ය විය. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරන අවස්ථාවේ දී බදු නීති අදාළවීම පිළිබඳ අර්ථ නිරූපණයට අදාළ අවිනිශ්චිතතාවයන් පවතී. 2019 වර්ෂය තුළදී දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් ආදායම් බදු සහ වැට් බදු තක්සේරු 7 ක් නිකුත් කර ඇත. මණ්ඩලය අභියාචන ඉදිරිපත් කර විරෝධය දක්වා ඇත. එකී තක්සේරු කිරීම් වලින් විශාල වගකීමක් පැන නොනගිනු ඇති බව මණ්ඩලයේ මතය වේ. එකී තක්සේරු කිරීම් මේ වන තෙක් අවසන් කර නැත.

2.8. අඛණ්ඩ භාවය

පූර්වේක්ෂ අනාගතයේදී ව්‍යාපාර කටයුතු කරගෙන යාමට මණ්ඩලය සතුව සම්පත් ඇති බවට මණ්ඩලය සෑහීමකට පත්වේ. තවද, ප්‍රවර්තන ව්‍යාපාරයක් ලෙස සමාගමට අඛණ්ඩව පැවතීමේ හැකියාව පිළිබඳව සැලකිය යුතු සැකයක් ඇති විය හැකි ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයන් පිළිබඳව මණ්ඩලය නොදන්නා අතර, මණ්ඩලය ඈවර කිරීමට හෝ එහි

මෙහෙයුම් නතර කිරීමට මණ්ඩලය අදහස් නොකරයි. එම නිසා, මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම අඛණ්ඩ භාවය පදනම් කර ගෙන අඛණ්ඩව සිදු කරනු ලැබේ.

2.9. දේපළ, පිරියත සහ උපකරණවල ප්‍රයෝජනවත් ජීවිත කාලය

සෑම වාර්තාකරණ දිනයක දී ම මණ්ඩලය වත්කම්වල අවශේෂ්‍ය වටිනාකම්, ප්‍රයෝජනවත් ජීවිත කාල සහ අගය ක්ෂය කිරීමේ ක්‍රම සමාලෝචනය කරයි. මෙම අගයන්, අනුපාත සහ ක්‍රම තක්සේරු කිරීමේදී කළමනාකාරිත්වයේ විනිශ්චය ක්‍රියාත්මක කරනු ලබන අතර, එබැවින් ඒවා අවිනිශ්චිතතාවයකට භාජනය වේ.

3. වැදගත් වන ගිණුම්කරණ ප්‍රතිපත්ති

3.1. දේපළ, පිරියත සහ උපකරණ

3.1.1. හඳුනා ගැනීම සහ මැනීම

දේපළ, පිරියත සහ උපකරණ යනු සේවා සැපයීම සඳහා හෝ පරිපාලන කාර්යයන් සඳහා තබා ඇති ස්පෘශ්‍ය අයිතම වන අතර ඒවා එක් කාල පරිච්ඡේදයකට වඩා වැඩි ගණනක් තුළ භාවිතා කිරීමට අපේක්ෂා කෙරේ.

අ. හඳුනා ගැනීම

වත්කම් හා සම්බන්ධ අනාගත ආර්ථික ප්‍රතිලාභ මණ්ඩලය වෙත ගලා ඒමේ හැකියාව තිබේ නම් සහ වත්කමෙහි පිරිවැය විශ්වාසනීය ලෙස මැනිය හැකි නම් ඒවා දේපළ, පිරියත සහ උපකරණ හඳුනා ගනු ලැබේ.

ආ. මිනුම්කරණය

දේපළ, පිරියත සහ උපකරණ අයිතම සමුච්චිත ක්ෂයවීම් අඩු කර පිරිවැයට හෝ තක්සේරු කළ අගයට සඳහන් කරනු ලැබේ.

වත්කම් අත්පත් කර ගැනීම සඳහා සෘජුවම අදාළ වන වියදම් පිරිවැය යන්නට ඇතුළත් වේ. ස්වයංව ඉදිකරන ලද වත්කම්වල පිරිවැයට එම ඉදිකිරීම සඳහා යොදා ගත් ද්‍රව්‍යවල සහ සෘජු ශ්‍රමයෙහි පිරිවැය, එම වත්කම එහි අපේක්ෂිත භාවිතය සඳහා ක්‍රියාත්මක තත්වයකට ගෙන ඒමට සෘජුවම ආරෝපණය කළ හැකි අනෙකුත් වියදම් සහ භාණ්ඩ කොටස් වලට ගලවා ඉවත් කර ඒවා පිහිටා තිබූ භූමිය යළි යථා තත්ත්වයට පත් කිරීමේ පිරිවැය ඇතුළත් වේ.

වත්කම් වලින් අපේක්ෂිත අනාගත ආර්ථික ප්‍රතිලාභ යථා තත්ත්වයට පත් කිරීම හෝ පවත්වාගෙන යාම සඳහා දේපළ, පිරියත සහ උපකරණ ඇළුත්වැඩියා කිරීම හෝ නඩත්තු කිරීම සඳහා දරනු ලබන වියදම් එම වියදම් දරනු ලැබූ විට වියදමක් ලෙස හඳුනා ගෙන ඇත.

ඇ. පසුකාලීන වියදම්

දීර්ඝ පරීක්ෂා කිරීමේ සහ අලුත්වැඩියා වියදම් ද ඇතුළුව වෙන වෙනම ගිණුම් ගත කර ඇති දේපළ, පිරියත සහ උපකරණ අයිතමයක උපාංගයක් ප්‍රතිස්ථාපනය කිරීම සඳහා දරනු ලබන වියදම ප්‍රාග්ධනීත කරනු ලැබේ. යම් දේපළ, පිරියත සහ උපකරණ අයිතමයක කොටසක අන්තර්ගත අනාගත ආර්ථික ප්‍රතිලාභ මණ්ඩලයට ගලා ඒමේ හැකියාව තිබේ නම් සහ එහි පිරිවැය විශ්වාසනීය ලෙස මැනිය හැකි නම්, එම අයිතම කොටස ප්‍රතිස්ථාපනය කිරීමේ පිරිවැය අයිතමයේ ධාරණ අගයෙහි හඳුනාගෙන ඇත. ප්‍රතිස්ථාපනය කරනු ලැබූ කොටසෙහි ධාරණ අගය ඉවත් කර ඇත. දේපළ, පිරියත සහ උපකරණවල වඳිනෙදා සේවා පිරිවැය දරන ලද පිරිවැයක් ලෙස ලාභයෙහි හෝ අලාභයෙහි හඳුනාගෙන ඇත.

ඈ. ක්ෂය කිරීම

දේපළ, පිරියත සහ උපකරණ අයිතමවල සෑම කොටසකම ඇස්තමේන්තු කළ ප්‍රයෝජනවත් ජීවිත කාලය මත අගය ක්ෂය කිරීම සරල රේඛීය පදනමක් මත ලාභයෙහි හෝ අලාභයෙහි හඳුනා ගනු ලැබේ. වත්කම්වල ඇස්තමේන්තු කළ ප්‍රයෝජනවත් ජීවිත කාලය පහත සඳහන් පරිදි වේ.

ගොඩනැගිලි/මැදිරිය	10%
ලීබඩු සහ සවිකිරීම්	25%
කාර්යාල උපකරණ	25%
යන්ත්‍රසූත්‍ර	12.50%
මෝටර් වාහන/ත්‍රිරෝද රථ	20%
පරිගණක සහ උපාංග	33.33%
සන්නාම කරන ලද අලෙවි කුට්	16.66%
යතුරුපැදි	25%
යෙදුවුම් මෘදුකාංග	33.33%
ජංගම දුරකථන	50%

වත්කමක් භාවිතයට ගත හැකිවන පරිදි මණ්ඩලය සතුව තිබෙන දිනයේ සිට එම වත්කම බැහැර කරන දිනය දක්වා හෝ එම වත්කමෙහි ප්‍රයෝජනවත් ජීවිත කාලය පුරා මණ්ඩලය එම වත්කමෙහි අගය ක්ෂය කිරීම සිදු කරයි.

යම් අස්පෘශ්‍ය වත්කමකට ආරෝපණය කළ හැකි අනාගත ආර්ථික ප්‍රතිලාභ මණ්ඩලයට ගලා ඒම සිදු විය හැකි නම් සහ එම වත්කමෙහි පිරිවැය විශ්වාසනීය ලෙස මැනිය හැකි නම් එවැනි අස්පෘශ්‍ය වත්කමක් හඳුනා ගනු ලැබේ. අදාළ දෘඩාංගයට සංකලිත ලෙස සම්බන්ධ නොවන, පැහැදිලිව හඳුනාගත හැකි, විශ්වාසනීය ලෙස මැනිය හැකි සහ අනාගත ආර්ථික ප්‍රතිලාභ ගෙන දීමට හේතු විය හැකි, මණ්ඩලය විසින් භාවිතා කරනු ලැබීමට බලය ලබා දී ඇති සියලුම පරිගණක මෘදුකාංග වල පිරිවැය ශේෂ පත්‍රයේ අස්පෘශ්‍ය වත්කම් කාණ්ඩය යටතේ ඇතුළත් කර, සමුච්චිත ක්‍රමක්ෂය සහ සමුච්චිත හානිකරණ පාඩු අඩු කළ පිරිවැයට ඉදිරියට ගෙන යනු ලැබේ.

3.2. භාණ්ඩ තොග

බඩු තොගවල පිරිවැයට එම තොග අත්පත් කර ගැනීම සඳහා දරන ලද වියදම් සහ ඒවා පවතින ස්ථානයට හා තත්වයට ගෙන ඒම සඳහා දරන ලද අනෙකුත් වියදම් ඇතුළත් වේ. ඒ අනුව, බඩු තොග වල පිරිවැය පහත දක්වා ඇති පරිදි ගණනය කරනු ලැබේ:

ලග්න වාසනා	සත්‍ය පිරිවැයට
ශනිදා	සත්‍ය පිරිවැයට
ජයෝදා	සත්‍ය පිරිවැයට
ක්ෂණික	සත්‍ය පිරිවැයට
කෝටිපති කප්රුක	සත්‍ය පිරිවැයට
සංවර්ධන වාසනාව	සත්‍ය පිරිවැයට
සුපර් බෝල්	සත්‍ය පිරිවැයට
අද කෝටිපති	සත්‍ය පිරිවැයට
සසිරි	සත්‍ය පිරිවැයට

3.3. වගකීම් සහ ප්‍රතිපාදන

3.3.1. වගකීම්

ශේෂ පත්‍රයේ ජංගම වගකීම් ලෙස වර්ගීකරණය කර ඇත්තේ ඉල්ලූ විට ගෙවීමට නියමිතව ඇති හෝ ශේෂ පත්‍ර දිනයේ සිට වසරක් ඇතුළත ගෙවිය යුතු වන වගකීම් වේ.

ජංගම නොවන වගකීම් වන්නේ ශේෂ පත්‍ර දිනයේ සිට වසරකට පසු ගෙවිය යුතු ශේෂයන් වේ.

3.3.2. ප්‍රතිපාදන

අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස මණ්ඩලයට විශ්වාසනීය ලෙස ඇස්තමේන්තු කළ හැකි වර්තමාන නෛතික හෝ සම්මුතික බැඳීමක් ඇත් නම්, සහ එම වගකීම පියවීම සඳහා ආර්ථික ප්‍රතිලාභ පිටතට ගලා යාමක් අවශ්‍ය විය හැකි නම් ඒ සඳහා ප්‍රතිපාදන හඳුනාගනු ලැබේ.

මණ්ඩලයට එරෙහිව නඩු පැවරීම්

1. WP/HCCA/COL/160/2004/F1
මණ්ඩලය එම්.ඒ.එම්. අමීන් මහතාට එරෙහිව නඩු පවරා ඇත. අධිකරණය මණ්ඩලයට පක්ෂව තීන්දුව ලබා ඇත. නීතිපති දෙපාර්තමේන්තුව විසින් පුද්ගලයාගෙන් රු. 2,520,000 මුදල අයකර ගැනීමට පියවර ගෙන ඇත.

3.3.3 ත්‍යාග සඳහා වෙන් කිරීම

දළ විකුණුම් වලින් 50% ක් ත්‍යාග වියදම් සඳහා වෙන් කර ඇත. දිනා නොගත් ත්‍යාග සඳහා බැර කිරීම පිණිස සංවර්ධන ලොතරැයි මණ්ඩල පනතෙහි සඳහන් නියමය ප්‍රකාරව මණ්ඩලය ත්‍යාග සංචිත ගිණුමක් පවත්වා ගෙන යයි. ත්‍යාග සංචිත ගිණුම් භාවිතා කළ හැක්කේ පසු කාල වලදී ත්‍යාග ගෙවීමේ කාර්යය සඳහා පමණකි.

3.4. සේවක ප්‍රතිලාභ

අ. නිර්වචිත දායක සැලසුම්

නිර්වචිත දායක සැලැස්මක් යනු සේවා නියුක්තියෙන් පසු කාලීන සැලැස්මක් වන අතර, ඒ යටතේ ආයතනයක් වෙනත් ආයතනයකට ස්ථාවර දායක මුදලක් ගෙවන අතර, එයට අමතරව තවදුරටත් මුදලක් ගෙවීමට නීතිමය හෝ සම්මුතික බැඳීමක් එම ආයතනයට නැත. නිර්වචිත දායක සැලසුම් වලට දායකත්වය ගෙවීම් සඳහා වන බැඳීම් සේවකයින් විසින් අදාළ සේවාවන් සපයනු ලබන කාල සීමාව තුළ දී ලාභය හා අලාභයේ වියදම් ලෙස හඳුනා ගනු ලැබේ.

සේවක අර්ථසාධක අරමුදල

එක් එක් සේවකයාගේ වැටුපෙන් මණ්ඩලය සහ අදාළ සේවකයා විසින් පිළිවෙලින් 15% සහ 10% බැගින් දායක මුදල් ගෙවනු ලැබේ. එකී අර්ථසාධක අරමුදල ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කළමනාකරණය කරනු ලැබේ.

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල

මණ්ඩලය එක් එක් සේවකයාගේ වැටුපෙන් 3% ක් සේවා නියුක්තයන්ගේ භාර අරමුදලට දායක මුදල් ලෙස ගෙවයි. නිර්වචිත දායක සැලසුම් සඳහා වන දායක මුදල් දරන ලද වියදමක් ලෙස ආදායම් ප්‍රකාශනයේ හඳුනා ගනු ලැබේ.

ආ. නිර්වචිත ප්‍රතිලාභ සැලසුම් විශ්‍රාම පාරිතෝෂිකය

නිර්වචිත ප්‍රතිලාභ සැලැස්මක් යනු නිර්වචිත දායක සැලැස්මක් හැරෙන්නට ඇති පශ්චාත් සේවා නියුක්ති ප්‍රතිලාභ සැලැස්මකි.

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 19 හි 57 වැනි ඡේදය අනුව, භාණ්ඩ අලෙවි කිරීමේ හෝ සේවා සැපයීමේ නිරතව සිටින රාජ්‍ය සංස්ථා විසින් සුදුසුකම් ලත් ආයුගණකවරයෙකු හෝ පාරිතෝෂික සූත්‍ර ක්‍රමය භාවිතා කිරීම තෝරා ගත හැකිය. ඒ අනුව මණ්ඩලය පාරිතෝෂික වගකීම ගණනය කිරීම සඳහා පාරිතෝෂික සූත්‍ර ක්‍රමයක් භාවිතා කරයි. කෙසේ වෙතත්, 1983 අංක 12 දරණ පාරිතෝෂික ගෙවීමේ පනත යටතේ සේවකයකු සම්බන්ධ පාරිතෝෂික වගකීම පැන නගින්නේ එම සේවකයා වසර 5 ක අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කිරීමෙන් පසුව පමණි. ලැබෙන යම් ලාභ හෝ අලාභ වහාම ආදායම් ප්‍රකාශනයේ හඳුනා ගනු ලැබේ. පාරිතෝෂික අරමුදල බාහිර වශයෙන් අරමුදල් සපයනු ලැබ ඇත. පාරිතෝෂික ප්‍රතිපාදන වලින් සහ අරමුදලෙන් ඇති වන ශුද්ධ බලපෑම 17 වැනි සටහන යටතේ පෙන්වා ඇත.

3.5. ප්‍රාග්ධන බැඳීම් සහ අවිනිශ්චිතතාවයන්

අවිනිශ්චිත වගකීම් යනු ආර්ථික ප්‍රතිලාභ හුවමාරු වීමේ හැකියාවක් නොමැති හෝ විශ්වාසනීය ලෙස මැනිය නොහැකි අවිනිශ්චිත අනාගත සිදුවීම් හෝ වර්තමාන බැඳීම් මගින් පමණක් පැවැත්ම තහවුරු කළ හැකි බැඳීම් වේ. මණ්ඩලයේ ප්‍රාග්ධන බැඳීම සහ අවිනිශ්චිත වගකීම් මූල්‍ය ප්‍රකාශනවල අදාළ සටහන් මගින් අනාවරණය කරනු ලැබේ.

3.6. ශේෂ පත්‍ර දිනයෙන් පසු සිදුවීම්

ශේෂ පත්‍ර දිනයෙන් පසුව සිදුවූ සිදුවීම්වල ප්‍රමාණාත්මක බව සලකා බලා අවශ්‍ය තැන්හිදී මූල්‍ය ප්‍රකාශනවල සුදුසු ගැළපීම් සහ වෙන්කිරීම් සිදු කර ඇත. 2020 වර්ෂය ආරම්භයේ සිට ම කෝවිඩ්-19 වසංගතය පැතිරීම අපගේ මෙහෙයුම්වලට මෙන් ම ගනුදෙනුකරුවන්, බෙදාහරින්නන්, නියෝජිතයින් සහ ප්‍රතිවිකුණුම්කරුවන් යන අපගේ ප්‍රධාන පාර්ශ්වකරුවන්ට අවහිරතා ඇති කර තිබේ. මණ්ඩලය මෙම තත්වය මගින් ඇති කර තිබෙන දුෂ්කරතා හඳුනාගෙන ඇති අතර, මෙම අභියෝගාත්මක අවස්ථාවේ ඔවුන්ට උපකාර කිරීම පිණිස ක්‍රියාමාර්ග ගෙන තිබේ. මෙම තත්වය හේතුවෙන් යම් ආර්ථික පසුබෑමක් ඇතිවීමේ හැකියාව තිබෙන අතර එය අපගේ ලොතරැයි ක්‍රියාකාරකම්වලට බලපෑමක් ඇති කරනු ඇත. ලොතරැයිපත් අලෙවිය අඩුවීම හේතුවෙන් සහ සිදු වෙමින් පවතින ගනුදෙනු ප්‍රමාණය අනුව ආදායම් අඩුවීමක් සිදු විය හැකි බව සහ අපගේ පාර්ශ්වකාර පදනමට ඇතිවන අවහිරතාවය හේතුවෙන් පාඩු සිදු විය හැකි බව අපි අපේක්ෂා කරන්නෙමු. අපි ඇතිවී තිබෙන තත්වය අඛණ්ඩව දැඩි ලෙස නිරීක්ෂණය කර, නැවත යථා තත්වයට පත් කර ගැනීම සඳහා උපාය මාර්ග සකස් කරන්නෙමු.

3.7. මුදල් ප්‍රවාහ ප්‍රකාශය

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 7 - මුදල් ප්‍රවාහ ප්‍රකාශය යටතේ දක්වා ඇති පරිදි, වක්‍ර ක්‍රමය භාවිතා කරමින් මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස් කර ඇත. මුදල් සහ මුදල් හා සමාන දෑ අත ඇති මුදල් සහ බැංකුවේ ඇති මුදල් වල ශුද්ධ අගයෙන් සමන්විත වේ.

3.8. අංශමය තොරතුරු

කළමනාකරණ කාර්යයන් සඳහා, මණ්ඩලය විසින් නිෂ්පාදන මත පදනම්ව මෙහෙයුම් කාණ්ඩ එකොළහක් සකස් කර ඇත. සම්පත් වෙන් කිරීම පිළිබඳ තීරණ ගැනීමේ සහ කාර්යසාධනය තක්සේරු කිරීමේ කාර්යයන් සඳහා කළමනාකාරීත්වය මණ්ඩලයේ නිෂ්පාදනවල මෙහෙයුම් ප්‍රතිඵල වෙන වෙනම අධීක්ෂණය කරනු ලබයි. මෙහෙයුම් ලාභ හෝ අලාභ මත පදනම්ව බණ්ඩවල කාර්ය සාධනය ඇගයීම සිදු කරනු ලැබේ.

4. ආදායම් ප්‍රකාශන

4.1. ආදායම් හඳුනා ගැනීම

ආර්ථික ප්‍රතිලාභ මණ්ඩලය වෙත ගලා ඒමට ඉඩ ඇති තාක් දුරට සහ ආදායම හා ඒ හා සම්බන්ධයෙන් දරන ලද හෝ දැරීමට ඇති පිරිවැය විශ්වසනීයව මැනිය හැකි තාක් දුරට ආදායම හඳුනා ගනු ලැබේ. ලැබුණු හෝ ලැබිය යුතු ප්‍රතිඵලයේ සාධාරණ වටිනාකමට ආදායම මනිනු ලැබේ. පොළී ආදායම සහ අනෙකුත් ආදායම් උපචිත පදනමක් මත හඳුනා ගනු ලැබේ.

4.2. වියදම

ව්‍යාපාරය පවත්වාගෙන යාමේ දී සහ දේපළ, පිරියත සහ උපකරණ කාර්යක්ෂමව නඩත්තු කිරීමේදී දරන ලද සියලු වියදම් වර්ෂය සඳහා ලාභය ගණනය කිරීමේදී ආදායමට අය කර ඇත. ආදායම් ප්‍රකාශනය ඉදිරිපත් කිරීමේ කාර්යය සඳහා, වියදමෙහි ක්‍රියාකාරිත්වය නැමති ක්‍රමය මගින් මණ්ඩලයේ කාර්යසාධනයේ අංග සාධාරණ ලෙස ඉදිරිපත් කරන බව මණ්ඩලයේ මතය වේ. එබැවින් එම ඉදිරිපත් කිරීමේ ක්‍රමය අනුගමනය කරනු ලැබේ. ව්‍යාපාරය සිදු කර ගෙන යාම සඳහා හෝ ව්‍යාපාරයේ ඉපැයීම් ධාරිතාවය ඉහළ නැංවීම සඳහා හෝ ස්ථිර ස්වභාවයක වත්කම් අත්පත් කර ගැනීම, පුළුල් කිරීම හෝ වැඩිදියුණු කිරීම සඳහා දරනු ලබන වියදම් ප්‍රාග්ධන වියදම් ලෙස සලකනු ලැබේ. අළුත්වැඩියා කිරීම් සහ නැවත අළුත් කිරීම් ඒ සඳහා වියදම දරන ලද වර්ෂය තුළ ආදායමට අය කර ඇත.

5. මූල්‍ය වත්කම්

5.1 මූලික හඳුනා ගැනීම

සියලුම මූල්‍ය වත්කම් වෙළඳ දිනයේදී, එනම් මණ්ඩලය උපකරණයේ ගිවිසුම්ගත විධිවිධානවල පාර්ශවකරුවෙකු බවට පත්වන දිනයෙහි දී මූලිකව හඳුනා ගනු ලැබේ. 'විධිමත් ක්‍රමයේ වෙළඳාම්': සාමාන්‍යයෙන් වෙළඳපොළ තුළ නියාමනය හෝ සම්ප්‍රදායය මගින් ස්ථාපිත වී ඇති කාල රාමුව තුළ වත්කම් භාර දීම අවශ්‍ය කරන මූල්‍ය වත්කම් මිලදී ගැනීම හෝ විකිණීම මෙයට අයත් වේ. මූලික හඳුනා ගැනීමේදී මූල්‍ය උපකරණ වර්ගීකරණය කිරීම ඒවායෙහි කාර්යය සහ ලක්ෂණ මත සහ කළමනාකාරිත්වය විසින් ඒවා අත්පත් කර ගනු ලැබීමේ අභිප්‍රායය මත රඳා පවතී. ලාභය හෝ අලාභය හරහා සාධාරණ වටිනාකමට වාර්තා කර ඇති මූල්‍ය වත්කම් සහ මූල්‍යමය වගකීම් හැරෙන්නට, සියලු ම මූල්‍ය උපකරණ මූලිකව ගනුදෙනු පිරිවැය ද ඇතුළුව ඒවායෙහි සාධාරණ වටිනාකමට මනිනු ලැබේ.

5.2 පසුකාලීනව මැනීම

ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් ලාභය හෝ අලාභය හරහා සාධාරණ වටිනාකමට ඇති මූල්‍ය වත්කම්, කල්පිරීම දක්වා තබා ගෙන ඇති ආයෝජන, ණය සහ ලැබිය යුතු දෑ, සහ විකිණීම සඳහා තිබෙන මූල්‍ය වත්කම් යන කාණ්ඩවලට වර්ගීකරණය කර පසුකාලීනව මැනීම.

5.2.1 කල්පිරීම දක්වා තබාගෙන තිබෙන මූල්‍ය වත්කම්

ස්ථාවර තැන්පතු වල තිබෙන ආයෝජන කල්පිරීම දක්වා තබාගෙන තිබෙන මූල්‍ය ආයෝජන යටතේ වර්ගීකරණය කර ඇත. ස්ථාවර කල්පිරීමේ කාලයන් ඇති මූල්‍ය වත්කම් කල්පිරීම දක්වා තබාගෙන සිටීමට මණ්ඩලයට ධනාත්මක අභිප්‍රායයක් සහ හැකියාවක් ඇති විට එම වත්කම් කල්පිරීම දක්වා තබාගෙන ඇති මූල්‍ය වත්කම් ලෙස වර්ගීකරණය කරනු ලැබේ. මූලික මිනුමෙන් පසුව, කල්පිරීම දක්වා තබාගෙන ඇති ආයෝජන ක්‍රමක්ෂය කළ පිරිවැයට මනිනු ලැබේ.

5.2.2 මුදල් සහ බැංකු ශේෂ

මුදල් සහ බැංකු ශේෂ අතැති මුදල් සහ බැංකුවේ ඇති ශේෂ ලෙස නිර්වචනය කරනු ලැබේ. මුදල් ප්‍රවාහ ප්‍රකාශනයෙහි කාර්යය සඳහා, මුදල් සහ මුදල් හා සමාන දෑ අතැති මුදල් සහ බැංකුවල ඇති මුදල් වලින් සමන්විත වේ. කෙටි කල්පිරීම් කාලයන් සහිත ආයෝජන, එනම් අත්පත් කර ගත් දිනයේ සිට මාස තුනක් හෝ එයට අඩු කල්පිරීමේ කාලයන් සහිත ආයෝජන ද මුදල් හා සමාන දෑ ලෙස සලකනු ලැබේ.

5.2.3 මූල්‍ය අවදානම් කළමනාකරණය

මණ්ඩලයේ ක්‍රියාකාරකම් විවිධ වූ මූල්‍ය අවදානම් ගණනාවකට නිරාවරණය වෙයි; ණය අවදානම, ද්‍රවශීලතා අවදානම සහ වෙළඳපොළ අවදානම එම අවදානම් වේ.

සේවාවක් ලබන්නෙකු හෝ මූල්‍ය උපකරණයක ප්‍රතිපාර්ශ්වය එහි ගිවිසුම්ගත බැඳීම් ඉටුකිරීමට අපොහොසත් වුව හොත් මණ්ඩලයට ඇතිවිය හැකි මූල්‍ය අලාභය ණය අවදානම වේ. ණය අවදානම අවම කිරීම සඳහා රජයට අයත් බැංකු ආයතන වල ස්ථාවර තැන්පතු තබා ඇත.

මණ්ඩලයේ කීර්ති නාමයට පිළිගත නොහැකි මට්ටමේ හානියක් සිදු නොවන පරිදි ස්වකීය වගකීම් ඉටුකිරීම සඳහා ප්‍රමාණවත් ද්‍රවශීලතාවයක් සැමවිටම පවතින බව සහතික කිරීම මගින් මණ්ඩලය ද්‍රවශීලතා අවදානම කළමනාකරණය කරයි. ස්ථාවර තැන්පතු කෙටි කාලීනව රජයට අයත් බැංකු ආයතන වල තබා ඇත.

වෙළඳපොළ අවදානම යනු මණ්ඩලයේ ආදායමට හෝ මණ්ඩලය විසින් තබා ගෙන ඇති මූල්‍ය උපකරණවල වටිනාකමට බලපෑ හැකි පරිදි පොළී අනුපාත වෙනස් වීමේ අවදානම වේ. මණ්ඩලය ප්‍රතිලාභ උපරිම කරගනිමින් වෙළඳපොළ අවදානම් නිරාවරණය නිතිපතා කළමනාකරණය කර පාලනය කරයි.

6.1 සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු

සංවර්ධන ලොතරැයි මණ්ඩලය 1997 අංක 20 දරණ සංවර්ධන ලොතරැයි මණ්ඩල පනත යටතේ ස්ථාපනය කරන ලදී. පනතට අනුව, එහි අධ්‍යක්ෂ මණ්ඩලය පහත සඳහන් අධ්‍යක්ෂවරුන්ගෙන් සමන්විත වේ:

1. මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදලෙහි සභාපති හෝ ඔහුගේ නියෝජිතයෙක්.
2. ජනාධිපති ලේකම් හෝ ඔහුගේ නියෝජිතයෙක්.
3. විෂය භාර අමාත්‍යාංශයේ ලේකම් හෝ ඔහුගේ නියෝජිතයෙක්.
4. අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන තවත් සාමාජිකයින් දෙදෙනෙක්.

අධ්‍යක්ෂ මණ්ඩලය ආයතනයේ ප්‍රධාන කළමනාකරණ සේවක පිරිස ලෙස සලකනු ලැබේ. වර්ෂය තුළදී කිසිදු අධ්‍යක්ෂවරයෙකුට මණ්ඩලය සමග වළඹ ඇති කිසිදු ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජු හෝ වක්‍රාකාර බැඳියාවක් නොපවතියි.

අංශමය වාර්තාව

සටහන 01 - I - අංශමය වාර්තාව

	ශනිදා	ලග්න වාසනාව	ජයෝදා	නියත ජය	සුපර් බෝල්
විකුණුම්	2,036,709,215	4,889,527,220	701,767,000		2,034,276,780
බදු - වැට් 15%	48,539,558	116,528,903	16,724,753		48,481,587
ආදායම	**1,988,169,657**	**4,772,998,317**	**685,042,246**		**1,985,795,193**
විකුණුම් පිරිවැය	58,200,515	130,483,610	19,724,110		57,306,090
ත්‍යාග	1,018,406,920	2,444,863,410	350,898,900		915,278,490
දිනුම් ඇදීම් පිරිවැය	75,700,981	116,322,080	32,367,829		83,348,857
දළ ලාභය	**835,861,241**	**2,081,329,218**	**282,051,407**		**929,861,756**
එකතුකිරීම් - වෙනත් ආදායම්	20,938,848	50,267,887	7,214,674		20,913,841
ප්‍රචාරණ වියදම්	19,579,746	9,102,088	3,394,723		38,026,305
අලෙවිකරණය සම්බන්ධ වියදම්	823,099	1,976,013	283,606		822,116
ආයතනික සහ වෙනත්	2,688,587	6,454,489	926,377		2,685,376
අලෙවි නියෝජිත කොමිස්	381,883,283	916,786,354	131,581,313		381,426,896
බෙදාහරින්නන්ගේ කොමිස්	25,347,016	60,885,485	8,736,563		25,326,875
පරිපාලන හා මූල්‍ය වියදම්	67,093,341	161,070,965	23,117,631		67,013,212
විකුණුම් සහ බෙදා හැරීමේ වියදම්	20,274,113	48,672,057	6,985,633		20,249,899
එකතු කළා - ලබා නොගත් ත්‍යාග	38,003,120	100,022,600	16,121,460	2,204,100	39,270,560
බදු පෙර ලාභය	**377,114,025**	**1,026,672,253**	**130,361,695**	**2,204,100**	**454,495,478**
ආදායම් බදු	1,444,413	3,467,602	497,686		1,442,688
බදු පසු ලාභය	**375,669,612**	**1,023,204,651**	**129,864,009**	**2,204,100**	**453,052,790**
වෙනත් විස්තීර්ණ ආදායම්					
සේවක ප්‍රතිලාභ සැලැස්ම ආයුගණක ලාභ/(පාඩු)	(415,159)	(996,672)	(143,047)		(414,663)
ප්‍රත්‍යාගණන අතිරික්තය	5,186,179	12,450,457	1,786,946		5,179,985
වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම	**380,440,632**	**1,034,658,437**	**131,507,908**	**2,204,100**	**457,818,111**

කෝටිපති කප්රුක	සංවර්ධන වාසනාව	අද කෝටිපති	සසිරි	ක්ෂණික	2020 එකතුව
1,107,771,000	642,494,988	3,294,700,000	116,192,440	576,610,000	**15,400,048,643**
26,400,781	15,312,163	78,520,429	2,769,138	13,741,969	**367,019,283**
1,081,370,219	**627,182,825**	**3,216,179,571**	**113,423,302**	**562,868,031**	**15,033,029,360**
32,052,685	18,285,805	93,325,210	3,854,291	38,075,697	**451,308,013**
655,806,600	321,263,900	1,647,384,100	58,096,220	290,516,679	**7,702,515,219**
47,674,493	33,385,906	114,750,924	6,432,341		**509,983,411**
345,836,440	**254,247,214**	**1,360,719,336**	**45,040,449**	**234,275,655**	**6,369,222,716**
11,388,689	6,605,315	33,871,906	1,194,543	5,927,969	**158,323,671**
3,364,370	4,790,331	7,128,914	18,481,116	245,000	**104,112,592**
447,685	259,653	1,331,493	46,957	233,026	**6,223,649**
1,462,329	848,135	4,349,215	153,381	761,162	**20,329,050**
207,707,063	120,467,963	617,756,250	21,786,083	104,485,025	**2,883,880,228**
13,795,083	8,001,588	41,011,300	1,447,896	4,871,655	**189,423,459**
36,492,228	21,165,091	108,534,115	3,827,615	18,994,705	**507,308,904**
11,027,138	6,395,619	32,796,591	1,156,620	5,739,777	**153,297,447**
32,957,920	14,822,100	87,128,720			**330,530,580**
115,887,154	**113,746,251**	**668,812,085**	**(664,676)**	**104,873,273**	**2,993,501,638**
785,620	455,651	2,336,567	82,402	408,926	**10,921,555**
115,101,534	**113,290,600**	**666,475,518**	**(747,079)**	**104,464,347**	**2,982,580,083**
(225,806)	(130,965)	(671,585)	(23,684)	(117,535)	**(3,139,116)**
2,820,775	1,636,018	8,389,466	295,867	1,468,252	**39,213,944**
117,696,503	**114,795,653**	**674,193,398**	**(474,896)**	**105,815,064**	**3,018,654,911**

අවසාන ගිණුම් සඳහා සටහන්

දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා	2020	2019
	රු.	රු.
සටහන 01 - ආදායම		
දළ විකුණුම්		
ශනිදා	2,036,812,215	2,175,605,225
ලග්න වාසනා	4,889,726,820	4,074,350,800
ජයෝදා	701,797,800	990,764,800
ක්ෂණික	576,610,000	566,718,000
ගැලැක්සි ස්ටාර්	-	16,961,600
නියත ජය	-	468,700,000
සුපර් බෝල්	2,034,347,180	2,214,580,000
දස ලක්ෂපති	-	16,318,200
කෝටිපති කප්රුක	1,107,823,000	1,847,575,600
සංවර්ධන වාසනාව	642,526,988	872,109,613
අද කෝටිපති	3,294,768,200	4,561,106,000
සසිරි	116,192,440	
මුළු විකුණුම්	**15,400,604,643**	**17,804,789,838**
අඩුකළා: අලෙවි ආපසු එවීම්	556,000	5,465,620
ශුද්ධ අලෙවි එකතුව	**15,400,048,643**	**17,799,324,218**
අඩු කළා: වැට් බදු	367,019,283	733,910,206
බදු පසු ආදායම	**15,033,029,360**	**17,065,414,012**

සටහන 02 - ටිකට්පත් පිරිවැය		
ක්ෂණික	38,075,697	36,073,962
ශනිදා	58,200,515	54,004,361
ලග්න වාසනා	130,483,610	99,384,827
ජයෝදා	19,724,110	24,296,719
නියත ජය	-	11,541,524
සුපර් බෝල්	57,306,090	53,889,057
ගැලැක්සි ස්ටාර්	-	418,863
දස ලක්ෂපති	-	381,582
කෝටිපති කප්රුක	32,052,685	50,051,548
සංවර්ධන වාසනාව	18,285,805	21,468,233
අද කෝටිපති	93,325,210	108,586,476
සසිරි	3,854,291	
	451,308,013	**460,097,151**

දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා	2020	2019
	රු.	රු.
සටහන 03 - ත්‍යාග ගෙවීම		
ත්‍යාග වියදම් - ශනිදා	1,018,406,920	1,087,801,500
ත්‍යාග වියදම් - ලග්න වාසනා	2,444,863,410	2,037,175,400
ත්‍යාග වියදම් - ක්ෂණික	290,516,679	284,459,983
ත්‍යාග වියදම් - ජයෝදා	350,898,900	495,382,400
ත්‍යාග වියදම් - ගැලැක්සි ස්ටාර්	-	8,480,800
ත්‍යාග වියදම් - නියත ජය	-	234,350,000
ත්‍යාග වියදම් - සුපර් බෝල්	915,278,490	1,107,290,000
ත්‍යාග වියදම් - දස ලක්ෂපති	-	8,159,100
ත්‍යාග වියදම් - කෝටිපති කප්රුක	655,806,600	923,787,800
ත්‍යාග වියදම් - සංවර්ධන වාසනාව	321,263,900	436,054,400
ත්‍යාග වියදම් - අද කෝටිපති	1,647,384,100	2,280,553,000
ත්‍යාග වියදම් - සසිරි	58,096,220	
	7,702,515,219	**8,903,494,383**
සටහන 04 - දිනුම් ඇදීමේ පිරිවැය		
ශනිදා	75,700,981	62,582,507
ලග්න වාසනා	116,322,080	122,374,096
ජයෝදා	32,367,829	42,180,369
ගැලැක්සි ස්ටාර්		1,208,650
නියත ජය		24,431,958
සුපර් බෝල්	83,348,857	80,314,098
දස ලක්ෂපති		824,612
කෝටිපති කප්රුක	47,674,493	62,565,190
සංවර්ධන වාසනාව	33,385,906	43,044,151
අද කෝටිපති	114,750,924	144,548,877
සසිරි	6,432,341	
	509,983,411	**584,074,507**

අවසාන ගිණුම් සඳහා සටහන්

දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා	2020	2019
	රු.	රු.
සටහන 05 - වෙනත් ආදායම්		
සම්පත් ප්‍රතිමිලදී ගැනීම් පොළී	168,697	645,008
ලියාපදිංචි ගාස්තු	(1,750)	21,500
රසිට් පොත් අලෙවි කිරීම	5,655	23,790
කාර්ය මණ්ඩල ණය පොළී	2,775,429	2,547,378
කොවිඩ්-19 ණය පොළී	27,393	
විවිධ ලැබීම්	378,185	1,160,923
ආයෝජන පොළී ආදායම	124,654,328	145,207,283
ආපසු නොගෙවන තැන්පතු	1,447,000	1,249,500
ආපසු නොවූ ටිකට්පත් අවලංගු කිරීම මත දඩ	-	5,000
ස්වීප් ගිණුම් පොළිය	18,480,698	20,635,172
දින 7 කෙටි කාලීන තැන්පතු පොළී ආදායම	5,564,258	4,273,027
ඉවතලන ටිකට්පත් ආදායම	824,995	540,408
අයිතම බැහැර කිරීම	24,320	51,389
කුලී ආදායම් - බස් රථය	240,506	486,853
මෝටර් වාහන විකිණීම මත ලාභය	459,081	-
මැදිරිය කුලියට දීමේ ආදායම	-	6,000
ප්‍රවර්ධන සහ ත්‍යාග අයිතම බැහැර කිරීම මත ලාභය	153,370	
බෙදාහරින්නන්ගේ අඩු කිරීම්	1,896,186	5,866,720
විවිධ ලැබීම් - කාර්ය මණ්ඩලයෙන් අයකරගැනීම්	-	7,625
නියත ජය ජැක්පොට් ආපසු ලිවීම්	-	10,441,580
දිරි දීමනා ආපසු ලිවීම්	-	650,879
මාස හයට වැඩි චෙක්පත් ආපසු ලිවීම්	1,183,184	
ත්‍රිරෝද රථය අලෙවි කිරීමෙන් ලැබූ ලාභය	42,136	
වෙනත් ආදායම් එකතුව	**158,323,671**	**193,820,035**

සටහන 06 - බෙදාහැරීමේ වියදම්		
සටහන 06 - I - ප්‍රචාරණය		
ශනිදා	19,579,746	48,698,329
ලග්න වසනා	9,102,088	35,848,302
ජයෝදා	3,394,723	19,366,888
ක්ෂණික	245,000	567,254
ගැලැක්සි ස්ටාර්		31,684
නියත ජය		1,745,319
සුපර් බෝල්	38,026,305	28,779,796
දස ලක්ෂපති		94,986
කෝටිපති කප්රුක	3,364,370	59,302,052
සංවර්ධන වාසනාව	4,790,331	20,555,198
අද කෝටිපති	7,128,914	43,234,029
සසිරි	18,481,116	
ආයතනික සහ වෙනත්	16,061,216	29,059,344
නව දිනුම් ඇදීම් ආකෘතිය	4,230,355	
වෙබ් වෙළඳ ප්‍රචාරණය	37,479	455,795
එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා	-	39,418,099
	124,441,642	**327,157,074**

සටහන 06 - II - අලෙවිකරණය සම්බන්ධ ක්‍රියාකාරකම්

ආයතනික සමාජ වගකීම් ව්‍යාපෘතිය	3,200,000	11,116,745
සභාපතිගේ වැය ශීර්ෂය	-	1,074,420
සමරු තිළිණ සහ බැනර්	2,944,400	29,001,160
අලෙවිකරණය සම්බන්ධ වෙනත් වියදම්	79,249	2,818,059
	6,223,649	44,010,383

සටහන 06 - III - විකිණීමේ සහ බෙදා හැරීමේ වියදම්

ජා.ගො.ඛ. 2%	-	250,694,455
අලෙවි වියදම්	56,583,648	62,753,531
වෙනත් අලෙවි සහ බෙදා හැරීම් (ස්කෑන් කිරීම/වලංගුකරණය)	8,780,579	9,967,149
ප්‍රවාහනය	14,041,829	13,306,945
වෙළඳුන් සහ බෙදාහරින්නන් උත්ප්‍රේරණ පිරිවැය	17,420,625	57,741,532
SO/ASPO දිරි දීමනා	2,484,676	1,829,238
ප්‍රවර්ධන වාහන වියදම්	51,450	1,045,923
වාහන කුලියට ගැනීම - ටිකට්පත් අලෙවි කිරීම	412,475	455,756
වෙළඳුන්ගේ සහ බෙදාහරින්නන්ගේ රැස්වීම	-	70,000
විළිමහන් අවස්ථා / වාර්ෂික ප්‍රවර්ධන දිනදර්ශනය	398,648	570,540
නව අලෙවි කවුළුව ඉදි කිරීම	1,746,460	16,723,934
ලොතරැයි සාප්පුව	4,901,416	386,990
සිල්ලර සාප්පු	127,626	
විකුණුම් දිරි දීමනා - අලෙවි සහකාර	-	3,076,300
බෙදාහරින්නන්ගේ අලෙවි කාර්ය මණ්ඩලය සඳහා දිරි දීමනා	172,000	380,700
දිනුම් ඇදීම් ක්‍රියාවලිගත කිරීමේ ගාස්තු	-	447,384
කොවිඩ්-19 - වෙළඳුන්	44,172,000	
රක්ෂණ වාරික	966,095	
දිනුම් ඇදීමේ යන්ත්‍ර නඩත්තු කිරීම	1,037,920	
	153,297,447	419,450,376

සටහන 06 - IV - කොමිස්

අලෙවි නියෝජිත කොමිස් (1)		
ශනිදා	381,883,283	392,140,567
ලග්න වාසනා	916,786,354	740,406,850
ජයෝදා	131,581,313	178,827,273
ක්ෂණික	104,485,025	97,426,550
ගැලැක්සි ස්ටාර්	-	2,968,280
නියත ජය	-	81,871,412
සුපර් බෝල්	381,426,896	399,550,094
දස ලක්ෂපති	-	2,855,685
කෝටිපති කප්රුක	207,707,063	333,065,491
සංවර්ධන වාසනාව	120,467,963	157,209,464
අද කෝටිපති	617,756,250	823,029,495
සසිරි	21,786,083	
	2,883,880,228	3,209,351,159

අවසාන ගිණුම් සඳහා සටහන්

දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා	2020	2019
	රු.	රු.
බෙදාහැරීමේ අලෙවි නියෝජිත කොමිස්		
ශනිදා	25,347,016	27,115,752
ලග්න වාසනා	60,885,485	50,771,942
ජයෝදා	8,736,563	12,349,594
ක්ෂණික	4,871,655	4,282,035
ගැලැක්සි ස්ටාර්		211,130
නියත ජය		5,826,778
සුපර් බෝල්	25,326,875	27,603,387
දස ලක්ෂපති		203,175
කෝටිපති කප්රුක	13,795,083	23,006,618
සංවර්ධන වාසනාව	8,001,588	10,872,050
අද කෝටිපති	41,011,300	56,825,126
සසිරි	1,447,896	
	189,423,459	219,067,587
	3,357,266,425	**4,219,036,579**
සටහන 07 - පරිපාලන වියදම්		
කාර්ය මණ්ඩල පිරිවැය	351,843,167	356,298,212
ක්ෂය කිරීම්	48,316,517	47,823,897
වෙනත් පරිපාලන වියදම්	106,767,048	137,677,459
	506,926,732	**541,799,568**
සටහන 08- මූල්‍ය වියදම්		
බැංකු ගාස්තු - සාමාන්‍ය	348,372	406,896
බැංකු ගාස්තු - ත්‍යාග	33,800	31,500
මූල්‍ය වියදම් එකතුව	**382,172**	**438,396**

දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා	2020	2019
	රු.	රු.
සටහන 09 - ආදායම් බදු		
බදු ගෙවීමට පෙර වියදම් අඩු කළ පසු ආදායම	2,993,501,638	2,897,130,924
ආදායම් බදු ගෙවීමට යටත් නොවන ආදායම	(2,756,433,830)	(2,322,914,188)
බදු ගෙවිය යුතු වන ආදායම	237,067,808	574,216,736
බදු	56,896,274	160,780,686
පෙර වර්ෂයට අදාළව වැඩිපුර වෙන්කිරීම්	(45,974,719)	74,292,699
වර්ෂය සඳහා (අයකිරීම/ප්‍රතිවර්තන)	**10,921,555**	**235,073,385**
සටහන 10 - ජනාධිපති අරමුදලට දායකත්වය		
ආදායම් බදු ගෙවීමෙන් පසු ලාභය	**2,982,580,083**	**2,668,792,667**
ජනාධිපති අරමුදලට ප්‍රේෂණය කළ හැකි අතිරික්තය	**2,982,580,083**	**2,668,792,667**
වර්ෂය සඳහා ජනාධිපති අරමුදලට විසර්ජනය කිරීම	2,296,720,000	2,191,000,000
ජනාධිපති අරමුදලට ගෙවිය යුතු මුළු මුදල	**685,860,083**	**477,792,667**

අවසාන ගිණුම් සඳහා සටහන්

සටහන 11 - ස්ථාවර වත්කම් රු.

	ඉඩම්	ඉඩම් තිස්සමහාරාමය	ගොඩනැගිලි/- වැඩිදියුණු කිරීම්	සිදු කෙරෙමින් පවතින ප්‍රාග්ධන වැඩ	මෝටර් වාහන/ ත්‍රිරෝද රථ/- මෝටර්සයිකල්
			10%		20%,25%
පිරිවැය					
2020.01.01 දිනට ශේෂය	855,500,000	492,392	109,808,250	14,665,947	150,044,030
ප්‍රත්‍යාගණනය			468,000		(23,382,012)
වර්ෂය තුළ එකතුකිරීම්				24,845,653	175,000
වර්ෂය තුළ බැහැරකිරීම්					(1,895,639)
මාරුකිරීම්				(1,782,363)	
	855,500,000	**492,392**	**110,276,250**	**37,729,237**	**124,941,380**
අගය ක්ෂය කිරීම්					
2020.01.01 දිනට ශේෂය			10,918,555		46,792,272
ප්‍රත්‍යාගණනය					(62,127,956)
වර්ෂය සඳහා ක්ෂය			11,074,425		26,059,073
මාරුකිරීම්					
බැහැර කිරීම් සඳහා ක්ෂය					(1,895,639)
	-	**-**	**21,992,980**	**-**	**8,827,751**
2020.12.31 දිනට ශුද්ධ පොත් ශේෂය	**855,500,000**	**492,392**	**88,283,270**	**37,729,237**	**116,113,629**

	යන්ත්‍රසූත්‍ර	කාර්යාල උපකරණ සහ ජංගම දුරකථන	පරිගණක සහ උපාංග	ලීබඩු සහ සවිකිරීම්	සන්නාම කළ වෙළඳ කුට්ටි	පරිගණක මෘදුකාංග	වෙබ්අඩවි සෑදීම	ජාල පද්ධතිය	එකතුව
	12.50%	25% 50%	33.33%	25%	16.66%	33.33%	33.33%		
	135,036,884	34,549,721	50,072,848	16,421,311	8,735,946	15,269,335	989,655		1,391,586,319
									(22,914,012)
		3,848,480	3,923,023	364,707				1,481,592	34,638,454
									(1,895,639)
		(5,120)							(1,787,483)
									-
	135,036,884	**38,393,081**	**53,995,871**	**16,786,018**	**8,735,946**	**15,269,335**	**989,655**	**1,481,592**	**1,399,627,640**
									-
									-
	23,445,237	16,688,824	24,591,283	8,116,249	8,735,946	5,856,626	853,182		145,998,175
									(62,127,956)
	16,254,175	7,646,131	11,814,563	3,176,073	-	4,667,291	136,473	175,406	81,003,610
									-
									(1,895,639)
	39,699,412	**24,334,956**	**36,405,847**	**11,292,322**	**8,735,946**	**10,523,917**	**989,655**	**175,406**	**162,978,191**
									-
	95,337,472	**14,058,125**	**17,590,024**	**5,493,696**	**-**	**4,745,418**	**-**	**1,306,186**	**1,236,649,449**

අවසාන ගිණුම් සඳහා සටහන්

දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා	2020	2019
	රු.	රු.
සටහන 12 - කල්පිරීම දක්වා තබාගෙන ඇති මූල්‍ය වත්කම්		
ස්ථාවර තැන්පතු - ලංකා බැංකුව / මහජන බැංකුව	1,246,519,291	1,365,380,923
අලෙවි නියෝජිත තැන්පතු-	92,212,470	85,926,650
මුළු ස්ථාවර තැන්පතු	**1,338,731,761**	**1,451,307,572**
සටහන 13 - භාණ්ඩ තොග		
13.1 - ටිකට් පත් තොගය		
ශනිදා	1,667,040	1,426,000
ලග්න වාසනාව	2,937,100	3,730,600
ජයෝදා	354,200	745,200
ක්ෂණික	4,496,762	7,000,059
සුපර් බෝල්	1,486,030	1,818,800
කෝටිපති කප්රුක	542,800	1,391,500
සංවර්ධන වාසනාව	333,960	890,560
අද කෝටිපති	1,742,710	4,069,620
සසිරි	281,260	
මුළු ටිකට් තොග	**13,841,862**	**21,072,339**
13.2 - වෙනත් තොග		
ලිපි ද්‍රව්‍ය තොගය	5,856,498	8,525,850
ප්‍රවර්ධන අයිතම තොගය	4,343,148	5,624,293
තෑග අයිතම තොගය	7,788,902	14,995,427
රන් කාසි තොගය - කාර්ය මණ්ඩලය	155,200	64,000
වෙනත් අයිතම තොග	365,760	365,760
ලග්න වාසනා තේ කෝප්ප කට්ටල තොගය	239,262	378,534
වෙනත් තොග එකතුව	**18,748,770**	**29,953,865**
මුළු තොග	**32,590,632**	**51,026,204**

දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා	2020	2019
	රු.	රු.
සටහන 14 - වෙළඳ ණය ගැතියෝ සහ වෙනත් ලැබිය යුතු දෑ		
ලැබිය යුතු	12,492,241	11,386,218
ණය ගැතියෝ - බෙදාහැරීමේ අලෙවි නියෝජිත	8,296,082	8,562,452
කාර්ය මණ්ඩලයට ලබා දුන් ණය	72,124,799	63,766,345
උත්සව අත්තිකාරම්	468,750	8,750
ආපසු ගෙවිය යුතු තැන්පතු	1,479,114	1,737,114
ආර්ථික සේවා ගාස්තු බැර	-	32,824,620
ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව සඳහා සුරැකුම් තැන්පතුව (ඇපය)	1,800,000	1,800,000
ලැබිය යුතු ස්ථාවර තැන්පතු රඳවාගැනීමේ බදු	3,246,551	13,258,499
හානි වූ තෑග්ග අයිතම සඳහා ලැබිය යුතු	129,901	165,101
	100,037,438	**133,509,100**
අඩුකළා :		
අඩමාන ණය සඳහා වෙන් කිරීම්	**7,496,220**	**7,496,220**
	92,541,218	**126,012,880**
සටහන 15 - පෙරගෙවුම් සහ තැන්පතු		
පෙරගෙවුම්	1,592,312	1,369,015
අත්තිකාරම් - අභ්‍යන්තර	325,539	13,729
අත්තිකාරම් - බාහිර	6,279,527	3,829,527
	8,197,378	**5,212,271**
සටහන 16 - මුදල් සහ මුදල් හා සමාන දෑ		
බැංකු ශේෂ		
ලංකා බැංකුව - සාමාන්‍ය ලැබීම්	116,708,235	174,840,607
ලංකා බැංකුව - සාමාන්‍ය 7 දින කෙටිකාලීන තැන්පතු	62,184,487	141,324,975
ලංකා බැංකුව - තෑග්ග	44,943,263	40,757,500
සම්පත් බැංකුව	5,486,920	41,373,458
මහජන බැංකුව	(389,495)	679,465
ස්විප් ගිණුම	206,987,668	267,842,204
ලංකා බැංකුව- සාමාන්‍ය ගෙවීම්	100,765,944	126,753,935
ලංකා බැංකුව	997,500	977,500
මහජන බැංකුව	335,000	100,000
ලංකා බැංකුව - 84401075	1,000,100	1,000,000
මහජන බැංකුව 014-1-002-7-0010010	1,844,955	
හැටන් නැෂනල් බැංකුව 0030105259 41	566,261	
හැටන් නැෂනල් බැංකුව 3010534602	217,520	
	541,648,359	**795,649,644**
උප ගබඩාව සඳහා සුළු මුදල්	-	2,000
සුළු මුදල්-ප්‍රාදේශීය කාර්යාල	5,000	5,000
සං.ලො.ම. ආපදා සහන අරමුදල	9,404	9,404
	14,404	**16,404**
	541,662,763	**795,666,048**

අවසාන ගිණුම් සඳහා සටහන්

දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා	2020	2019
	රු.	රු.
සටහන -17 සේවක ප්‍රතිලාභ වගකීම්		
වර්ෂය ආරම්භයේදී ශේෂය	46,321,413	45,691,696
වර්ෂය තුළ වෙන් කරන ලද ප්‍රතිපාදන	11,754,784	1,660,725
වර්ෂය තුළ ගෙවීම්	(612,535)	(1,031,009)
වර්ෂය අවසානයේ ශේෂය	**57,463,662**	**46,321,413**
පාරිතෝෂික අරමුදල සඳහා ස්ථාවර තැන්පතුව	53,827,225	53,359,480
ශුද්ධ ශේෂය	**3,636,437**	**(7,038,067)**
සටහන- 17.1 වර්ෂය තුළ වෙන් කරන ලද ප්‍රතිපාදන		
පොළී පිරිවැය	4,362,314	4,490,847
ජංගම සේවා පිරිවැය	4,253,353	3,905,006
	8,615,668	**8,395,852**
හඳුනාගත් ශුද්ධ අයුගණක (ලාභ(/පාඩු)	3,139,116	(6,735,128)
වර්ෂය තුළ වෙන් කරන ලද මුළු ප්‍රතිපාදන	**11,754,784**	**1,660,725**
සටහන- 17.2 විශ්‍රාම ප්‍රතිලාභ පිරිවැය		
වට්ටම් අනුපාතය	10%	10.05%
වැටුප් වැඩි කිරීම් අනුපාතය	7%	5%
විශ්‍රාම ගන්නා වයස	60	60
වර්ෂය අවසානයේ සේවක ප්‍රතිලාභ වගකීමට සමාන ස්ථාවර තැන්පතුවක් පවත්වාගෙන ගොස් ඇත.		
සටහන 18 - ගෙවිය යුතු අලෙවි නියෝජිත සහ බෙදාහැරීමේ අලෙවි නියෝජිත තැන්පතු		
ගෙවිය යුතු අලෙවි නියෝජිත තැන්පතු	32,840,381	32,560,381
ගෙවිය යුතු බෙදාහැරීමේ අලෙවි නියෝජිත තැන්පතු	3,550,000	3,550,000
ගෙවිය යුතු අලෙවි නියෝජිත සහ බෙදාහැරීමේ අලෙවි නියෝජිත තැන්පතු	**36,390,381**	**36,110,381**

දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා	2020	2019
	රු.	රු.
සටහන 19 - වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු		
වෙළඳ ණය හිමියෝ	278,980,880	261,825,182
දිරිදීමනා ගෙවීම් සඳහා ප්‍රතිපාදන	225,555	225,555
අලෙවි නියෝජිත අත්තිකාරම්	671,684	671,647
බෙදාහැරීමේ අලෙවි නියෝජිත අත්තිකාරම්	63,783,221	51,177,346
ගෙවිය යුතු ජා.ගො.බ.	(110,107)	(110,107)
ගෙවිය යුතු වැට්	19,893,000	(715,942)
උපයන විට ගෙවීමේ බදු	40,438	259,018
බෙදාහරින්නන්ගේ කොමිස් සහ ගෙවිය යුතු වලංගුකිරීම්	21,127,313	21,171,376
ගෙවිය යුතු රඳවා ගැනීමේ බදු	31,134,390	37,313,971
ගෙවිය යුතු අලෙවි නියෝජිත හා බෙදාහැරීමේ අලෙවි නියෝජිත ඉලක්ක	8,115,950	8,617,130
ගෙවිය යුතු අලෙවි නියෝජිත කොමිස්	444,538	15,971,718
ගෙවිය යුතු සේ.අ.අ./සේ.නි.හා.අ	3,559,440	3,217,062
යුනයිටඩ් මෝටර්ස් ආයතනයට ගෙවිය යුතු	1,266,631	1,266,631
ආපසු ගෙවිය යුතු ආරක්ෂක තැන්පතු	2,645,375	1,164,000
ගෙවිය යුතු ආදායම් බදු සඳහා වෙන්කිරීම්	56,299,415	133,397,967
ලොතරැයි කූඩු සඳහා බෙදාහරින්නන්ට ගෙවිය යුතු	7,000	-
ආදායම් බදු සඳහා වෙන්කිරීම් (2016)	20,000,000	20,000,000
වැට් බදු සඳහා වෙන් කිරීම් (2016)	4,655,245	4,655,245
මුද්දර ගාස්තු	35,500	23,575
සංවර්ධන ලොතරැයි මණ්ඩල සුභසාධන	18,900	27,200
ගෙවිය යුතු දිනුම් ඇදීමේ යන්ත්‍ර ගිණුම	1,513,900	1,513,900
ගෙවිය යුතු මාස හයට වඩා පැරණි චෙක්පත්	369,667	1,381,588
රඳවා ගැනීම්	-	117,850
ආපසු ගෙවිය යුතු ටෙන්ඩර් තැන්පතු	670,001	321,585
ගෙවිය යුතු විද්‍යුත්-ලොතරැයි තැන්පතු	675,940	
ගෙවිය යුතු වැන්දඹු අනත්දරු අරමුදල්	8,800	
මුළු ණය හිමියෝ	**516,032,675**	**563,493,496**
සටහන 20 - ගෙවිය යුතු ත්‍යාග		
ගෙවිය යුතු ත්‍යාග	562,888,557	743,671,973
ගෙවිය යුතු ත්‍යාග සඳහා වෙන් කිරීම් - විශේෂ දිනුම් ඇදීම්		
ශනිදා	4,067,500	3,310,950
ලග්න වාසනා	3,219,700	2,373,700
සුපර් බෝල්	4,334,500	-
කෝටිපති කප්රුක	-	7,083,580
අද කෝටිපති	4,108,600	4,354,000
විශේෂ දිනුම් ඇදීම් සඳහා ගෙවිය යුතු මුළු ත්‍යාග	15,730,300	17,122,230
ගෙවිය යුතු මුළු ත්‍යාග	**578,618,857**	**760,794,203**

දස වසරක සාරාංශය

	2020 (රු. '000)	2019 (රු. '000)	2018 (රු. '000)	2017 (රු. '000)	2016 (රු. '000)	2015 (රු. '000)	2014 (රු. '000)	2013 (රු. '000)	2012 (රු. '000)	2011 (රු. '000)
මෙහෙයුම් ප්‍රතිඵල										
ආදායම	15,033,029	17,065,414	15,854,856	13,981,500	14,759,875	11,874,659	12,271,477	10,611,073	8,624,166	6,884,267
ටිකට්පත් පිරිවැය	451,308	460,097	402,323	387,697	444,990	325,360	378,157	410,016	359,844	313,956
ත්‍යාග ගෙවීම්	7,702,515	8,903,494	8,296,413	7,263,437	7,755,659	6,150,951	6,211,302	6,481,076	5,113,981	4,120,099
පරිපාලන වියදම්	506,927	541,800	463,619	419,811	382,655	332,597	347,408	330,967	280,682	281,397
බෙදාහැරීමේ පිරිවැය	3,357,266	4,219,037	3,950,410	3,541,284	3,561,410	2,728,440	3,067,688	627,574	497,755	325,886
මෙහෙයුම් වියදම් වලින් පසු අතිරික්තය	2,663,353	2,550,732	2,368,138	2,034,129	2,412,020	2,134,322	2,145,085	1,979,330	1,757,752	1,318,519
හිමිකම්										
ජනාධිපති අරමුදල	2,200	2,200	2,200	2,200	2,200	2,200	2,200	2,200	2,200	2,200
මහපොල භාර අරමුදල	2,200	2,200	2,200	2,200	2,200	2,200	2,200	2,200	2,200	2,200
ජනාධිපති අරමුදලට ගෙවිය යුතු	685,860	477,793	237,466	107,862	52,633	99,010	250,598	132,775	493,970	220,124
ත්‍යාග සංචිත හිඟුම	698,559	1,103,197	971,046	810,029	805,435	934,026	877,036	776,867	753,236	645,679
වගකීම්										
ජංගම නොවන වගකීම්	40,027	36,110	35,395	38,180	1,318,429	1,615,846	223,288	36,806	35,134	38,506
ජංගම වගකීම්	1,209,938	1,484,836	1,414,220	1,722,249	1,237,896	846,842	581,768	1,228,404	512,576	479,722
වත්කම්										
ජංගම නොවන වත්කම්	1,236,649	1,252,626	721,352	670,526	1,372,755	1,537,875	1,594,826	1,733,435	1,624,369	1,202,917
ජංගම වත්කම්	2,013,724	2,429,225	1,941,174	2,012,195	684,044	405,087	342,264	641,588	317,323	381,078

සටහන 1: 2015 සහ 2014 සිට ක්‍රියාත්මක වන පරිදි දළ අලෙවිය වාර්තා කර ඇති අතර නියෝජිත සඳහා කොමිස් මුදල බෙදාහැරීමේ පිරිවැය යටතේ ඇතුළත් කර ඇත.